# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ISSN 1391 - 1031
2017 පෙබරවාරි
22 වෙළුම 11 කලාපය

ආධාරය රු 30/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

" 'පුවත්පත් නිදහස' 'පිරිසිදු ප්‍රජාතන්ත්‍රයේ 'ප්‍රධාන සටන් පාඨවලින් තවත් එකකි. හොඳම මුද්‍රණාල සහ ලොකුම කඩදාසි තොග ධනපතියන් සතුව තිබෙන තාක් කල්ද, නිදසුනක් ලෙසට, ඇමරිකාවේ මෙන්, ප්‍රජාතන්ත්‍රවාදය සහ සමූහාණ්ඩු ක්‍රමය සංවර්ධනය වූ තරමට වඩාත් සිත්කාවදින ලෙස, තියුණු ලෙස හා දුර්දාන්ත ලෙස ලෝකය මුළුල්ලේම දක්නට ලැබෙන පාලනයක් වන ධනපති පාලනයට පුවත්පත් යටත්ව තිබෙන තාක් කල්ද, මෙම නිදහසත් රැවටිල්ලක් බව කම්කරුවෝ දනිති."

**ලෙනින්**
**තෝරා ගත් කෘති,**
**9වැනි වෙළුම,**
**123 පිටුව**

# බැඳුම්කර වංචාව යටගැසීම දෙපැත්තේම දූෂිතයින් රැකීමක්!

මහ බැංකුවේ බැඳුම්කර නිකුත් කිරීමේදී සිදුවූ මූල්‍ය වංචාව පිළිබඳ පරීක්ෂණ සිදුකර ඊට වගකිවයුත්තන්ට දඬුවම් ලබාදීමටත් වංචා කරන ලද මුදල් නැවත අත්පත් කරගැනීමටත් වත්මන් මෛත්‍රී-රනිල් හවුල් ආණ්ඩුව පියවර නොගතහොත් එය ආණ්ඩුවේ අවසානය සටහන් වනු ඇති තීරණාත්මක සංධිස්ථානයක් වනු ඇතැයි දේශපාලන විචාරකයෝ පවසති.

අන්ත දූෂිත පවුල් පාලනයක් වූ රාජපක්ෂ පාලනයට එරෙහිව නැගි ජනතා විරෝධයේ අතුරු ප්‍රතිඵලයක් ලෙස හවුල් ආණ්ඩුව බලයට පත්වීමේදී දූෂණ විරෝධය, විනිවිද පෙනෙනසුළුභාවය, වගවීම, යහපාලනය වැනි සටන් පාඨ ඉදිරිපත් වූ නමුදු ඔවුන් තමන් විසින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රතිපත්ති බිඳදමමින් මහ බැංකු බැඳුම්කර නිකුතුවේදී කටයුතු කළ බව රහසක් නොවේ. මේ හේතුවෙන් රජයට ඒ මොහොතේ සිදුවූ අලාභය කෝටි 164ක් බවට ගණන් බලා ඇති අතර රජයට සිදුවූ සමස්ත පාඩුව කෝටි 12,854කට වැඩි වේ. බැංකු පොලී අනුපාත ඉහළ යාම, ද්විතීක වෙළඳපොළේ මිලදී ගැනීම් නිසා සේ.අ.අ. අරමුදල සිදුවූ කෝටි 15,000ක පාඩුව වැනි සෙසු හේතු නිසාද මහ බැංකුවටත් පොදුවේ රටේ ආර්ථිකයටත් සිදුවී ඇති බලපෑම බරපතළය.

02 වැනි පිටුවට




**දිරිය නායකයින්ගේ බලමුළුව**
මහරගම 2017.01.22

**05 අර්බුදය ඉහළටත්...**



මේ සියලු කරුණුවලින් පෙනීයන්නේ, ධනවාදයේ අර්බුදය තුළ 'පාලක පංතිය' අර්බුදයට...

**09 හම්බන්තොට ගිල ගන්නා...**



මෙම ගිවිසුමට අනුව හම්බන්තොට වරායේ සිට කිලෝමීටර් 100ක් දුරට සෘජුව හම්බන්තොට...

**11 හැකියාව හා තාත්විකත්වය...**



සැබැවින්ම නව සමාජයක් බිහිකිරීමේ හැකියාව ධනවාදී සමාජය තුළ තිබේ. එහෙත් ඒ හැකියාව තිබූ පමණින්...

**12 ජීවත්වීමේ අයිතිය විනාශ කරන...**



දැනට මෙම ව්‍යාපෘතිය මගින් සිදුවී තිබෙන හඳුනාගෙන ඇති හානියට වඩා විශාල හානියක් ඉදිරියේදී...

| | |
|---|---|
| සංවාදය......................... | 03 |
| තරුණ........................... | 04 |
| ආවර්ජනා....................... | 06 |
| දැනුම............................ | 07 |
| ජාත්‍යන්තර...................... | 08 |
| කාන්තා......................... | 10 |
| වේදිකාව......................... | 13 |
| විශේෂාංග....................... | 14 |

**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# EPF කොල්ලයට එරෙහිව අන්තරේ විරෝධය




සුප්‍රසිද්ධ මහ බැංකු බැඳුම්කර වංචාව මගින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) රු. මිලියන 15,000ක පාඩුවක් සිදුකරමින් සේවක අර්ථසාධක අරමුදල්ලාභීන්ට සිදුකර ඇති හානියට එරෙහිව දැවැන්ත සේවක උද්ඝෝෂණයක් ජනවාරි 19වැනි දින කොළඹ කොටුවේදී පැවැත්වුණි. අන්තර් සමාගම් සේවක සංගමයේ නායකත්වයෙන් යුතුව පැවැත්වූ මෙම උද්ඝෝෂණය සඳහා සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සපයන පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය සමාගම්වල සේවක සේවිකාවන් හාරදහසකට අධික සංඛ්‍යාවක් සමඟ සංගමයේ සභාපති වසන්ත සමරසිංහ, ප්‍රධාන ලේකම් නීතිඥ ජානක අධිකාරි ඇතුළු විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

# වරාය නැගෙනහිර ජැටිය විකිණීමට වෘත්තීය සමිති විරෝධය




කොළඹ වරාය - නැගෙනහිර ජැටිය විකිණීමට අදාළ වැදගත් තොරතුරු රාශියක් මේ වන විට හෙළි වී තිබේ. ආණ්ඩුව රටේ මහජනතාවට හොරෙන් කොළඹ වරාය - නැගෙනහිර ජැටිය විකිණීමට අදාළ ගිවිසුම අත්සන් කර ඇති බවත් එම නිසා රටට ලැබෙමින් තිබූ විශාල ආදායමක් අහිමි වන බවත් අදාළ තොරතුරු අනුව පැහැදිලිය. මෙම ජාතික අපරාධයට එරෙහිව වරාය සේවකයන් සහ අනෙකුත් වෘත්තීය සමිති සහභාගිත්වයෙන් දැවැන්ත විරෝධතා ව්‍යාපාරයක් දියත් කිරීමට කටයුතු සූදානම් කර ඇත.

ඒ පිළිබඳව මාධ්‍ය දැනුවත් කිරීමේ විශේෂ මාධ්‍ය හමුවක් පසුගිය 25වැනි මරදාන සමාජ හා සාමයික කේන්ද්‍රයේදී පැවැත්විණි. එයට ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල් කාන්ත සහෝදරයා, අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා හා සමස්ත ලංකා වරාය පොදු සේවක සංගමයේ ප්‍රධාන ලේකම් චන්ද්‍රසිරි මහගමගේ සහෝදරයා ඇතුළු වෘත්තීය සමිති නායකයෝ පිරිසක් සහභාගි වූහ.

# වැටුප් විෂමතාවය එරෙහිව විදුලි වෘත්තීය සමිති සටනට



වැටුප් විෂමතාවය හා තවත් ඉල්ලීම් කිහිපයක් මුල්කරගනිමින් ලංකා විදුලිබල මණ්ඩලයේ සියලුම වෘත්තීය සමිති එකාබද්ධව, දීප ව්‍යාප්තව අඛණ්ඩ උද්ඝෝෂණ මාලාවක් දිවයින පුරා පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය දෙසැම්බර් මස 28වැනි දින සේවක ඉල්ලීම් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට, බලධාරීන් සාකච්ඡාවක් ලබාදුන්නද සාකච්ඡාව අසාර්ථක වී තිබිණි.

එම නිසා, වැටුප් විෂමතාවය නොවිසඳීමට හා සේවක ඉල්ලීම් ලබා නොදීමට විරෝධය පළකරමින් පෙබරවාරි මස 03වැනි දින ලංකා විදුලිබල මණ්ඩලයේ සියලුම කාර්යාල, වැඩබිම්, හා බලාගාර සේවකයන් සමඟ දැවැන්ත උද්ඝෝෂණයක් කිරීමට නියමිතය. මේ හේතුවෙන් දිවයින පුරා විදුලි බිඳවැටීම් සිදුවුවහොත් එහි වගකීම ඇමතිවරයා සහ ආණ්ඩුව භාරගතයුතු බවද රටේ මහජනතාව දැනුවත්කර සිටිමු. මේ පිළිබඳ මාධ්‍ය සාකච්ඡාවක් ජනවාරි 03 පැවැත්විය.

# ලෙනින් කියවමු - අධ්‍යාපන ප්‍රදර්ශනය



ශ්‍රේෂ්ඨ ඔක්තොම්බර් විප්ලවයේ නියමුවන් සහ නූතන යුගයේ විප්ලවීය උපායමාර්ගික විශේෂඥයා ලෙස සලකන වී. අයි. ලෙනින් අනුස්මරණ දිනය ජනවාරි 21 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ලෙනින් සමරු කමිටුව විසින් සංවිධානය කරනු ලබන 'ලෙනින් කියවමු!' සමරු වැඩසටහන ජනවාරි 20වැනි දින දවස පුරා කොළඹ මහජන පුස්තකාලයේදී පවත්වනු ලැබිණි.

එහිදී ලෙනින් සමරු ප්‍රදර්ශනයක් හා විවිධ වැඩසටහන් දවස පුරා පැවැත්වුණු අතර සමරු දේශනය ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් පවත්වන ලදී.

# එතෙරින්...

## හඳුන්නෙත්ති 'එතෙර අපි' සෞදි සමුළුවට

එතෙර අපි සංවිධානයේ සහභාගි සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා සෞදි අරාබියේ 'එතෙර අපි' සංවිධානයේ වාර්ෂික මහා සභාවට සහභාගි විය. සෞදියේ රියාද් නගරයේ පැවති එම අවස්ථාවට ශ්‍රී ලංකා තානාපතිවරයාද ශ්‍රී ලාංකික විවිධ සංවිධානද නියෝජනය විය. ඊට අමතරව සෞදි ශ්‍රී ලාංකික සංවිධාන විසින් සංවිධානය කළ විදෙස් සමුළුවකට ද සෞදියේ ශ්‍රී ලංකා පාසලේ සහ තානාපති කාර්යාලයේ ගෘහ සේවිකාවන් රඳවා ඇති "සුරක්ෂා" මධ්‍යස්ථානය නිරීක්ෂණයටද ඔහු සහභාගි විය. මෙම සංචාරය ජනවාරි 18 සිට 23 දක්වා පැවැත්විණි.



## බිමල් රත්නායක යුරෝපා රටවල් කිහිපයක විදෙස් සංවිධාන හමුවේ

ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක සහෝදරයා පසුගිය ජනවාරි 03 සිට 18 දක්වා ජර්මනිය, ඩෙන්මාර්කය, ස්වීඩනය, බෙල්ජියම, ඇතුළු යුරෝපා රටවල් කිහිපයක සංචාරයක නිරත විය. එහිදී එම රටවල ජනතා විමුක්ති පෙරමුණ පක්ෂ සංවිධාන විසින් සූදානම් කළ රැස්වීම්වලට මෙන්ම එම රටවල ක්‍රියාත්මක වාමාංශික පක්ෂ නියෝජිතයන් හමුවීමේ අවස්ථා රැසකටද ඔහු සහභාගි විය.



## විජිත හේරත් අයර්ලන්තයේ සහ ලන්ඩනයේ

ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා පාර්ලිමේන්තුව විසින් සංවිධානය කර ඇති සංචාරයකට අනුව ලන්ඩනයේ සහ අයර්ලන්තයේ විදෙස් සංචාරයකට පසුගිය ජනවාරි 22 සිට සහභාගි වී ඇත. එහිදී ලංකාවේ වර්තමාන දේශපාලන අභියෝග පිළිබඳව දේශන කිහිපයකට සහභාගිවීමට විජිත හේරත් සහෝදරයා කටයුතු කළේය.

## හවුල් ආණ්ඩුවේ... 01 පිටුවෙන්

මේ අතර ආණ්ඩුව බැඳුම්කර වංචනිකයින්ට එරෙහිව පියවර ගනු වෙනුවට ඔවුන් රැකීමට උත්සාහ ගන්නා බවට ආරම්භයේ සිටම චෝදනා එල්ල වෙමින් තිබේ. විශේෂයෙන් බැඳුම්කර වංචාව හා වංචනිකයින් සම්බන්ධයෙන් ආණ්ඩුව අනුගමනය කළ ඇල්මැරුණු ප්‍රතිපත්තියත් ඒ පිළිබඳව සිදුවූ පාර්ලිමේන්තු කෝප් කමිටු පරීක්ෂණයේදී ආණ්ඩුවේ නියෝජිතයින්ගේ හැසිරීමත් කෝප් වාර්තාව එළිදැක්වීමෙන් පසු ආණ්ඩුවේ ක්‍රියාමාර්ගත් විසින් ඒත්තු යමින් තිබෙන්නේ ඒ පිළිබඳව සාධාරණ නෛතික ක්‍රියාවලියක් දියත් වීම පිළිබඳ සැක සහිත බවය.

බැඳුම්කර වංචාව යටගැසීම දෙපැත්තේම හොරුන්ට හොඳය. බැඳුම්කර වංචාව යටගැසීම නිසා එක් අතකින් අගමැති රනිල්ගේ මිතුරාත් ඔහුගේ බෑණාත් බෑණාගෙන් උදව්ගත් අයත් මාමාට අවස්ථාව දුන් අගමැතිවරයාත් නීතියෙන් ගැලවේ. අනෙක් අතට බැඳුම්කර වංචාව පෙන්වා තම පැරණි හොරකම් වසාගැනීමට රාජපක්ෂ පාලනයේ හොරුන්ට අවස්ථාව ලැබෙන අතර, මහ බැංකු බැඳුම්කර හොරුන්ට දඬුවම් නොදෙන තත්වය තුළ රාජපක්ෂ සමයේ හොරුන්ට දඬුවම් කිරීමේ ආණ්ඩුවේ සදාචාරමය අයිතියද අභියෝගයට ලක්වේ. එය රාජපක්ෂ කල්ලියේ හොරුන්ට හොඳය. මේ පිළිබඳව නියමුවා කළ විමසීමකදී ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා අවධාරණය කළේ, දෙපැත්තේම හොරුන්ට ඉඩ නොතබා බැඳුම්කර වංචාව කළ අයට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ආණ්ඩුවට බලකිරීමට සියලු දෙනා පෙළගැසිය යුතු බවය.

## ආර්ථික මර්මස්ථාන විකිණීම... 16 පිටුවෙන්

එසේ තිබියදී නැගෙනහිර ජැටියෙන් 15%ක් තබාගෙන ආණ්ඩුවට ලාභාංශයක්වත් ගන්න පුළුවන් වෙන්නේ නැහැ."

මෙම මාධ්‍ය හමුව සඳහා ජවිපෙ මධ්‍යම කමිටු සාමාජික, පාර්ලිමේන්තු මන්ත්‍රී, වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයාද සහභාගි විය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# හොරකම වීරත්වයට නැංවූ කල..

"පෞද්ගලික දේපළ යනු සොර බඩුවලට තවත් නමක් වේ" යනුවෙන් වරක් පැවසුවේ මනෝරාජික සමාජවාදියෙක් වූ පියෙර් ජෝෂප් ප්‍රෘධොන්ය. එය ඇත්තය. ධනවාදයේ පවතින ප්‍රාග්ධනය මඟින් බිහිකරනු ලබන පෞද්ගලික දේපළ යනු වැටුප ශ්‍රමිකයන්ගේ අතිරික්ත ශ්‍රමය සොරකම් කිරීමෙන් නිර්මාණය කරගත් ඒවාය. එහෙත් ඒ සොරකම ධනවාදය තුළ නීතියෙන්ද, ධනපති සදාචාරයෙන්ද යුක්ති යුක්ත කොට තිබේ. එය එළිපිට කරන සොරකමක් ලෙස නොපවතී. එය කෙරෙන්නේ පහසුවෙන් වටහාගත නොහැකි ආර්ථික විද්‍යාත්මක ක්‍රියාවලියක් තුළිනි.

එසේ වෙතත් එම ධනවාදය තම ක්‍රමයේ පැවැත්ම සඳහාම පොදු ජනයා තුළ තමන් සාධාරණ යැයි පෙන්වීම සඳහාම එළිපිට කරන, ක්‍රමයට පිටින්පේන සොරකම්වලට විරුද්ධ විය. ඊට ඉඩ නොතැබීය. දියුණු ධනපති රටවල අද වුවද මෙය දැකිය හැක. පාලනයට සම්බන්ධ නායකයන් අයථා මුදල් ගනුදෙනුවකට, 'අයථා ලෙස' දේපළ ගොඩගැසීමට, අල්ලස් ගැනීමට, රජයේ දේපළ පෞද්ගලික පරිහරණයට සම්බන්ධනම් ඔවුන්ට දඬුවම් කරනු ලැබිණ. ඒ සඳහා නීතිය සම්පාදනය කළේය. ලංකාවේද ඊට නීති ඇත. අල්ලස් හෝ දූෂණ පනත, මුදල් විශුද්ධි කරන පනත ඒවාය.

එහෙත් මේ වන විට ලංකාවේ ධනවාදය විසින් මෙම තත්වය වෙනස් කර තිබේ. ධනවාදය තම ක්‍රමය තුළ පවත්වාගෙන යන සූරාකෑම නැමති 'ස්මාට්' සොරකම දැන් එළිපිට කරන කොල්ලකෑමකට පරිවර්තනය කරනු ලැබ තිබේ. දැන් රාජ්‍ය බලය ලබා ගැනීම යනු සොරකමට හා කොල්ලකෑමට ලයිෂන් ලබාගැනීමක් බවට පත්ව තිබේ. මෙම තත්වය ලංකාවේ ඇති වූයේ විශේෂයෙන් 1978 විවෘත ආර්ථික රටාව හඳුන්වාදීමත් සමඟය. එහෙත් ඒ තුළ හොරකමේ කප් ගැසුවේ පැවති රාජපක්ෂ පාලනයය. රාජපක්ෂ පාලනය, හොර රැළක් වටා තබාගෙන මහජන මුදල් කෝටි ගණන් හොරකම් කළේය.

රාජපක්ෂවරු, ලංකාවේ බෙලහීන පසුගාමී ධනවාදය තුළ මහා අපරාධ දෙකක් කළෝය. එකක් නම් ජනතාවගේ දේපළ කොටි ප්‍රකෝටි ගණනින් සොරකම් කිරීමය. අනෙක හොරකමටත් වඩා බරපතළ අපරාධයකි. ඒ, හොරකම උත්කර්ෂයට නැංවීම හෙවත් හොරා ජාතික වීරයෙක් කිරීමය.

මේ දිනවල ලංකාවේ දේශපාලන කරළියේ රඟ දැක්වෙන්නේ එම නාඩගම්ය. මහජන මුදල් කෝටි ගණන් වංචා කළවුන් ඉඩම් මිලදීගෙන මන්දිර ඉදිකළවුන්, පාක්ෂිකයන්ට, නෑයින්ට රජයේ වාහන, රජයේ ගෙවල් 'දන්සැල්' දමා ලබාදුන් උන් ඒ සියල්ල මැද 'වීරයෝ' බවට පත්ව සිටිති.

බැසිල් රාජපක්ෂලා ගසාකෑ මුදල් කොපමණද කියන්නේ නම් ඔහුට අයත් මාතර හා ගම්පහ මල්වානේ ඉඩම් දෙකක් හා නිවාස දෙකක්, ඔහු අයිතිය නොකී නිසා රජයට පවරා ගනු ලැබිණ. ඔහු තම දේපළවලට අයිතිවාසිකම් නොකීවේ ඒවා ගැනීමට යෙදවූ වත්කම් උපයාගත් ආකාරය හෙළිකළ නොහැකි නිසාය. එළිපිටම එතරම් හොරකම් කළ ඔහු අත්අඩංගුවට ගත්විට 'දේශපාලන පළිගැනීමට' ලක්වූ වීරයෙක් බවට බෞතීස්ම කර ගන්නා ලදී.

හිටපු නිවාස හා ඉදිකිරීම් ඇමතිවරයාද, රජයේ වාහන තම ඥාතීන්ට හා පක්ෂයේ නායකයන්ට ඇති පදම් ලබාදී, රජයට කෝටි ගණනක් පාඩු කිරීම සම්බන්ධව අත්අඩංගුවට ගනු ලැබ සිටී. මීට පෙර මෙම චෝදනාව පිටම ඔහුගේ පක්ෂයේ නායකයන් කීපදෙනෙක්ම රක්ෂිත බන්ධනාගාර ගත කරන ලදී. එහෙත් පුදුමය එම හොර නඩයත්, මහ හොරාත් 'වීරයන්' බවට පත්කරලීමය. දැන් මහජන දේපළ නාස්තිකළ හොරකම් කළ පුද්ගලයා රට පුරා ජාතික වීරයෙක් සේ පෝස්ටර් අලවා ගනිති; සිල් ගනිති; සමුළු පවත්වති. ඒ අතර, තමන් විඳි බලය හා වරප්‍රසාද අහිමිවීම නිසා කෝපයට පත්ව ජ.වි.පෙ.ටත් එහි නායකයන්ටත් අවලාද නඟති; මඩ ගසති.

මෙහි බරපතළ ඛේදවාචකය පල් හොරෙක් තමන්ව වීරයෙක් ලෙස හඳුන්වා ගැනීම නොව එම තුච්ඡ ක්‍රියාව අන්ධානුකරණයෙන් අනුමත කරන, ඊට සහාය දක්වන, හොරාට වීරයා ලෙස, 'ආදරණීය' හොරා ලෙස අමතන පිරිසක්ද සිටීමය. කලෙක ලංකාවේ හොරකම ලැජ්ජාවට කරුණක් විය. අද පවා ගම්වල කුඩා හොරකම්වලදී තත්වය එසේය. එහෙත් දැන් රාජ්‍ය බලය දරන විට හොරකම් කිරීම වීරත්වයට  කරුණක්ව තිබේ.

මේ ඛේදවාචකය වත්මන් හවුල් ආණ්ඩුවද අනුගමනය කරමින් සිටී. මහ බැංකු බැඳුම්කරයේ හොරා රැකීමට ගන්නා උත්සාහයෙන් එය පෙනේ. මෙහිදී රනිල්ගේ ආණ්ඩුව බරපතළ වැරදි දෙකක් කරමින් සිටී. එකක් නම් බැඳුම්කරයේ හොරු රැකීමය. අනෙක බැඳුම්කර හොරකම පෙන්වා තම පැරණි හොරකම් වසා ගැනීමට රාජපක්ෂ පාලනයේ සියලු හොරුන්ට අවස්ථාව ලබාදීමය.

සමාජ ක්‍රමයත් පරිහානියට පත්ව, එය ජරාජීර්ණ වූ විට මෙවැනි දේ සිදුවීම අරුමයක් නොවේ. දැන් සමාජය සිදුකරන්නේ හොරු ප්‍රතික්ෂේප කිරීම නොව ලොකුම හොරා තේරීමය. හොරා වෙනුවෙන් ප්‍රශස්ති ගැයීමය. මෙයට එකඟ නොවන, මෙය ප්‍රතික්ෂේප කරන මිනිසුන් රැසක් සිටින බව අපි දනිමු. යහපාලනය අපේක්ෂා කරන්නේ ඔවුන්ය. එහෙත් ධනවාදය වෙනස් නොකර මෙම තත්වය වෙනස් කළ නොහැක. එබැවින් හොරුන් 'වීරයන්' වීම වැළැක්වීමට නම්, හොරු වීරයන් කරන වැරදි සමාජ ක්‍රමය වෙනස් කළ යුතුය. ඒ මඟ හැර අන් මඟක් නැත.

# ඉදිරි පෙළ සටන්කරුවන් වෙන්න වැඩකරන ජනතාව සූදානම්

**අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති, ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික වසන්ත සමරසිංහ සහෝදරයා**



***නියමුවා:- ආණ්ඩුව ණය බර ගැන කියමින් වරාය, කහටගහ පතල, ඛනිජවැලි වැනි රාජ්‍ය ආයතන, සම්පත් විකිණීමේ මාවතකට පිවිසී තිබෙනවා. මේ කතාව ඇත්තද? ජනතාව භාරගත යුතුද?***

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** මේ රට දැවන්ත ණය බරක ගිලී තිබෙනවා කියන කාරණය රහසක් නෙවේ. 1948 පස්සෙ 1952 තමා  අපි ණය වෙන්න පටන් ගත්තේ. 1952ක වනවිට අපේ රට තිබූ සමස්ත විදේශීය ණය ප්‍රමාණය රුපියල් මිලියන 570යි. 2015 අවසන් වෙනකොට විදේශ ණය ප්‍රමාණය බිලියන 10,500ක් ඉක්මවා තිබෙන්නේ. හැබැයි දැන් අපේ ණය වාර්ෂිකව වැඩිවෙනවා. අපි මේ අවුරුද්ද අවසන් වෙන කොට ආණ්ඩුව රුපියල් බිලියන 1,600ට ආසන්න ණය මුදලක් රාජ්‍ය වියදම් සම්පාදනය කරගැනීම වෙනුවෙන් ගන්නවා. එතකොට ආණ්ඩුව කියන්නේ ණය බර වැඩියි. ණය බර වැඩි නිසා තියෙන දේවල් විකුණලා ණය පියවා ගන්නවා කියලා.

ආණ්ඩුව මේ කියන්නේ සම්පූර්ණ බොරුවක්. හම්බන්තොට වරාය ඩොලර් මිලියන 1,100ට ආසන්න මුදලකට 80%ක් විකුණා අනික් පැත්තෙන් ඩොලර් මිලියන 982ක ණයක් අරගෙන කුරුණෑගල සිට හබරණට රේල් පාරක් හදනවා. මේ පැත්තෙන් ගත්ත ණයක් ආපසු වියදම් කරන්න අපේක්ෂා කරමින් ඉන්නවා. ඉතින් ඒනිසා රටක් හදනවා කියන්නේ රටේ තිබෙන සම්පත් ටික විකුණලා ඒක කාටහරි දීල එන සල්ලිවලින් කාල ඉන්න එක නොවෙයි. ලෝකයේ කොහෙවත් රටක් මෙහෙම දියුණුවෙලා නැහැ. එනිසා තමන්ට උපාය මාර්ග සැලසුම් තියෙන්න ඕන කෙටි හා දීර්ඝ කාලීනව. අපේ රටේ තිබෙන ප්‍රශ්නය උපාය මාර්ගික සැලසුමක් නැහැ. ඒනිසා එක එක වෙලාවට එන දේශපාලඥයින්ගේ, දේශපාලන උපාය මාර්ග එසේ නැත්නම් දේශපාලන හිතළු තමා අපේ රටේ ආර්ථික සැලසුම් බවට පත්වෙන්නේ.

අපි විශ්වාස කරනවා අපේ රට වෙලාගෙන තිබෙන ණය බරින් මුදවා ගැනීම සඳහා දැවැන්ත ආර්ථික වැඩ පිළිවෙලක් ඕන. විදේශ ආයෝජකයන් අපේ රටට ඕන. ඒ වගේම රට ඇතුලේ නිෂ්පාදනය කරන්න පුළුවන් ආහාර සුරක්ෂිතතාවය, අපේ රටේ මානව සම්පත, සේවා ක්ෂේත්‍රය, භූගෝලීය පිහිටීම, ඒ හරහා අපිට ලෝකයේ ලැබිල තියෙන තැන, ඒ වගේම නාවික හා වරාය කටයුතුවලදී අපිට අපේ රටේ භූමිය කොහොමද පාවිච්චි කරන්න පුළුවන්, අපේ වරාය කොහොමද පාවිච්චි කරන්න පුළුවන් කියන කාරණා පිළිබඳව අපිට හොඳ සැලස්මක් ඇතිව අපි ආර්ථිකයට මැදිහත්වෙන්න ඕනෑ. එහෙම මැදිහත් නොවී කහටගහ පතල, වරාය, ඛනිජ වැලි සංස්ථාව, රාජ්‍ය ආයතන සමාගම් විකුණල සල්ලි අරගෙන ඊළඟට මොනවද විකුණන්නේ. දැන් අපිට තියෙන ප්‍රශ්නේ ආයතනයක් කරන්න බැරි ආණ්ඩුවක් රටක් කරන්නේ කොහොමද කියන එක.

රත්‍රං බිත්තර දාන කිකිළිගෙ දවසට දාන්නේ බිත්තරයක් නම් ඒ කිකිළිගෙ බිත්තරය අරගෙන නේ මිනිස්සු ජීවත්වෙන්ට පුරුදු වෙන්නේ. කිකිළි මැරුවට බිත්තර සියල්ලම ගන්න බෑනේ. එදා ඉඳන් බිත්තර නැතිවෙනවා. ඒ වගේ මේ ආණ්ඩුවත් මේ රටට ආදායම් ලැබෙන මාර්ග ටිකෙන් ටික අහෝසි කරමින් යන්නේ.

මේ දෙගොල්ලො මාරුවට 68 අවුරුද්දක් තිස්සේ සිදු කළේ අපේ රටේ ආදායම් ප්‍රභවයන් නැතහොත් මාර්ගයන් රටට අහිමි කළා. රටේ ණය වැඩි කළේ මේ රට කරවන පාලකයෝ. ඒ නිසා දැන් මේ රටේ ජනතාව ණය උගුලක හිරකරලා. ඒවා බේරන්න කියල රාජ්‍ය ආයතන ටික විකුණන් ගිහිල්ල හෙට දවසේ විකුණන්නේ මොනවාද? ගෙදර ඉන්න පැටව් ගහන කිරි එළදෙන විකුණුවට පස්සෙ කිරි ගන්න එකත් නැතිවෙනවා. පැටව්ත් නැතිවෙනවා. හෙට දවසෙ ජීවත්වෙන මාර්ගයකුත් නැතිවෙනවා. එතනට තමා මේ රට ඇදගෙන යන්නේ. ආණ්ඩුව ජනතාවට මේ කියමින් තිබෙන්නේ වෙළඳපොළ ආර්ථිකය ඇතුලෙ තමන්ට මෙයිට වැඩි දෙයක් මේ ආර්ථිකයේ කරන්න බැහැ කියන එක. ජනතාව මේක බාරගත යුතු නැහැ. ජනතාව තීරණය කරන්න ඕන වැඩ බැරි මිනිසුන්ට, හොරුන්ට, ජාවාරම්කාරයින්ට රට බාරදීලා එහෙයියන් වෙලා ඉන්නවද? එහෙම නැත්නම් පුරවැසියන් විදිහට හෙට දවසෙ මේ රටේ නිදහසේ ජීවත් වෙන්න පුළුවන් රටක් හදන තැනට මේ රට ගෙනියන්න මැදිහත් වෙනවාද කියන කාරණය.  ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වුවමනාවට රාජ්‍ය ආයතන අත්හරින ආණ්ඩුවේ වැඩේට ජනතාව කිසිසේත් එකඟවිය යුතු නැහැ.

> "ජනතාව තීරණය කරන්න ඕන වැඩ බැරි මිනිසුන්ට, හොරුන්ට, ජාවාරම්කාරයින්ට රට බාරදීලා එහෙයියන් වෙලා ඉන්නවද? එහෙම නැත්නම් පුරවැසියන් විදිහට හෙට දවසෙ මේ රටේ නිදහසේ ජීවත් වෙන්න පුළුවන් රටක් හදන තැනට මේ රට ගෙනියන්න මැදිහත් වෙනවාද කියන කාරණය."

***නියමුවා:- රාජ්‍ය සම්පත් විකිණීම පිළිබඳව වැඩකරන ජනතාවගේ ප්‍රතිචාරය කොහොමද?***


***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** රාජ්‍ය සම්පත් විකිණීම පිළිබඳ කාරණයේදී වැඩකරන ජනතාව වෙනුවෙන් අපි මේකට සම්පූර්ණ විරුද්ධයි. රාජ්‍ය සම්පත් අවභාවිතාව, නාස්තිය, දූෂණය, වංචාව මේ වෙළඳපොළ ආර්ථිකය විසින් අපේ රටටත් පුරුදු කරපු එකක්. ඉහළ සිට පහළට රාජ්‍ය

***15 වැනි පිටුවට***



## Yes We Can



> "ඉගෙන ගනිමින්, සංවිධානය වෙමින් සහ සටන් කරමින් සිය ප්‍රායෝගික කාර්යයන් සංවිධානය කිරීම තරුණ සංගමයේ කාර්යභාරය වන්නේය. තරුණ සංගම් සාමාජිකයින් මෙලෙස ස්වයං පුහුණුවකුත්, නායකයින් වීමට සුදුසු පුද්ගලයිනුත් පුහුණු කළ යුතුය. තරුණ සංගමය කොමියුනිස්ට්වාදීන් පුහුණු කළ යුතුය. කොමියුනිස්ට් සමාජයක් ගොඩනගන කෝටි සංඛ්‍යාත ඉදිකරන්නන් අතර ඔබ පෙරමුණ ගත යුතුය."
>
> ලෙනින්




# අඳුරට සාප නොකර පහන් දල්වමු

පිළියන්දල ප්‍රදේශයේ පෞද්ගලික වෙළඳ ආයතනයක ආරක්ෂක අංශයේ සේවය කළ දෙදරු මවක් හදිසියේ මියගිය පුවතක් මේ දිනවල සමාජ ජාල මාධ්‍ය ඇතුළු අනෙකුත් මාධ්‍යවලත් ප්‍රචාරය වේ. ඒ පිළිබඳ විවිධ මතිමතාන්තරද පළවේ. ඇය එම වෙළඳසැලේ අලෙවියට තබා තිබූ අන්නාසි කැබැල්ලක් හොරෙන් කෑ බව කියා එහි ප්‍රධානියකු ප්‍රසිද්ධියේ ඇයට බැනවැදී තිබේ. මෙම බැනවැදීමත් සමග ඇතිවූ කම්පනයත්, අන් අය ඉදිරිපිට ඇතිවූ ලජ්ජාවත් නිසා ඇයට සිහිනැතිවී පසුව ඇය මියගිය බව කියවෙයි. සැබැවින්ම මෙය ඉතාම කණගාටුදායක තත්වයකි. මෙවන් තත්වයට අදාළ කාන්තාව පත්වීමත්, අදාළ ප්‍රධානියා පත්වීමත් සමාජ බේදවාචකයේම ප්‍රකාශනයකි. දිනපතා අසන්නට දකින්නට ලැබෙන මෙවැනි සිදුවීම් ප්‍රමාණය ඉතා විශාලය. සියලුදෙනා ඒවා අසා මහත් සේ කම්පාවනු දැකිය හැකිය. එහෙත් යළිත් එවැනි සිදුවීම් සිදුවීම වැළැක්වීමට එමගින් කිසිදු මෙහෙයක් ඉටු නොවන්නේ නම් එකී කම්පාවෙන් කිසිදු ප්‍රයෝජනයක් අත්වන්නේ නැත. අඳුරට සාප කරමින් නොසිට එක පහනක් හෝ දල්වන්නැයි සමාජයේ ප්‍රකට කියමනක්ද තිබේ. මෙහිදී තරුණ ප්‍රජාවට පැවරෙන වගකීම විශාල බවට විවාදයක් නැත.

තමන් මුහුණ දෙන ප්‍රශ්න විසඳාගැනීමේ වුවමනාවක් බොහෝ දෙනා තුළ තිබුණද මෙකී ප්‍රශ්නවලට සැබෑහේතුව සහ ප්‍රශ්න විසඳාගැනීමට වන මාවත පිළිබඳ අවබෝධයක් බොහෝ දෙනාට නැත. ධනවාදී සමාජ ක්‍රමය විසින් රට තුළ සමාජ විෂමතාවය බරපතළ ලෙස ඉහළ දමා ඇත. බොහෝ දෙනෙකුට අවස්ථා අහිමි කොට ධනය බලය හිමි ඉතා සුළු පිරිසක් වරප්‍රසාද බුක්ති විඳින තත්වයට පත්කොට ඇත. මෙය සමාජ විෂමතාවයි. එනිසාම සමාජ විෂමතාවය දුරලමින් සමානාත්මතාවය සහිත සමාජ වටපිටාවක් නිර්මාණය කිරීම කළ යුතුව ඇත. එය තමන් මුහුණ දෙන ගැටලුවලට විසඳුම් සොයාගැනීමේ මාවත බව තරුණ තරුණියන්ට අවබෝධ කොට දියයුතු වෙයි. නමුදු මෙය පහසුවෙන් කළ හැකි කටයුත්තක් නොවේ. ඒ සඳහා පුළුල් සංවාදයක්ද සමාජ ක්‍රියාකාරකම්ද අවශ්‍ය වේ.

එනිසාම සමාජවාදී තරුණ සංගමය ලෙස සමාජයේ සිටින විවිධ හැකියාවන් හා දක්ෂතාවයන් සහිත තරුණ කොටස් සමග ක්ෂේත්‍ර ගණනාවක විවිධ වැඩකටයුතු පසුගිය කාලයේ ආරම්භ කළේය. ඒ අතරින් ක්‍රීඩා, පරිසර, සංකෘතික, හා විෂමත්ද්‍රව්‍ය විරෝධී යන ක්ෂේත්‍රයන්ගේ වැඩ කටයුතු හා සම්බන්ධව තරුණ තරුණියන් රැසක් සමාජවාදී තරුණ සංගමය සමග අත්වැල් බැඳගත්තේය. එකී තරුණ තරුණියන් මුහුණ දෙන ගැටලු පිළිබඳ දැනුවත් කරමින් ඔවුන් සඳහා එහි පුළුල්තම සංවිධාන ඒකකයවන'තරුණ සමිති', සටන්කාමී තරුණ ඒකක ලෙස ගොඩනැගීමට කටයුතු කරමින් ඇත.


එවන් පසුබිමක ලාංකේය භූමිය මත විවිධ ක්ෂේත්‍රයන්ගේ සිටින දක්ෂ තරුණ පිරිස් තරුණ සමිති තුළට එකරාශි කරගනිමින්, ඒමතින් ගොඩනැගෙන්නාවූ තරුණ ජවය ලාංකේය සමාජය වඩා සාධාරණ සමාජයක් දක්වා ගෙනයන ගමනේ අඩිතාලම බවට පත්කළ හැකිය. මෙකී වුවමනාව හොඳින් තේරුම් ගනිමින් මේ මොහොතේ රටපුරා අප සැමගේ දායකත්වයෙන් 'තරුණ සමිති' හා ඒ තුළින් තරුණ බලමණ්ඩලද ගොඩනැගීම වඩා ශක්තිමත්ව සිදුකළ යුතුව ඇත.

මිනිසුන් මියයාමට සැලැස්වීම වෙනුවට ජීවත් කරවීම වෙනුවෙන් සටන් කළ යුතුව තිබේ. එය කළ හැක්කේ දැක්මක් සහිත සංවිධානාත්මක වැඩපිළිවෙළක් සමග එක්වුවහොත් පමණි.

# තරුණ අපි ඇත්තටම නිදහස්ද?

මිනිස් ජීවිතයේ සුන්දරම කාලය යෞවනයයි. එහෙත් මේ සුන්දරතම යෞවනය වඩාත් හොඳින් විඳීමේ නිදහස අපට හිමි ද යන ප්‍රශ්නය පිළිබඳ අවධානය යොමුකළ යුතුය. මේ මස 04 වෙනිදාට යෙදී තිබෙන නිදහස් දිනය මේ වසරේද මහත් උත්කර්ෂවත් ලෙස පවත්වන බව නිසැකය. 1948 ලැබුණු මේ කියන නිදහස සැබෑ නිදහසක්ද යන ප්‍රශ්නය මතුවන්නේ එවිටය.

අධ්‍යාපනය ලැබීමට, රැකියාවක නිරත වීමට, ආදරය කිරීමට මෙන්ම තමන් ආදරය කරන කෙනෙක් හා විවාහ වීමටත් අපට ඇත්තේ අයිතියකි. නමුත් ඒ අයිතිය අපෙන් බොහෝ දුර ඈතට රැගෙන ගොස් නොමැතිද?





නිදහසේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය කොහිද? පළමු වසරට ඇතුළත් වීමේ පටන් අනේකවිධ බාධාය; කප්පාදු කිරීම්ය. එතැන් පටන් වසරින් වසර ගෙවමින් විභාග කඩයිම් පසුකොට උසස් අධ්‍යාපනය දක්වා වන ගමන ඉතා දුෂ්කරය. ජනතාවගේ බදු මුදලින් ගෙනයන ආණ්ඩු රටේ දරුවන්ගේ අධ්‍යාපනය වෙත දක්වන සැලකිල්ලේ තරම අයවැය ලේඛනයේ අධ්‍යාපන වැය ශීර්ෂයෙන්ම මනාව හෙළි වේ. 68 අවුරුද්දක් තිස්සේ ජනතාව විසින්ම පත්කොට යැවූ පාලකයින් විසින් රටේ දරුවන්ගේ නිදහස් අධ්‍යාපනයේ අයිතියට බාධා කරමින් සිටී. එසේම රටේ තරුණ තරුණියන්ට තම අධ්‍යාපනයේ අයිතිය වෙනුවෙන් මහමග දී සටන් කිරීමට නිරන්තරව සිදු වී ඇත.

තවත් අතෙකින් ඉතා දුෂ්කර තත්වයන් යටතේ වුව අධ්‍යාපනය ලැබූව ද තමන්ට සුදුසු රැකියාවක් ලැබීමට අපේ රටේ තරුණ තරුණියන් අතුරින් අවස්ථාව හිමි වන්නේ කීයෙන් කීදෙනාටද? අති බහුතරයක් තරුණ තරුණියන් තම රැකියා අයිතිය වෙනුවෙන් මහපාරේය. ඉතා දිගු විරැකියා පෝලිම්ය.

එසේම තාරුණ්‍යයේ මෙන්ම සමස්ත මිනිස් සමාජයේත් තීරණාත්මකම මානව සබඳතාවය හමුවන්නේ පවුල තුළය. එනම් විවාහය තුළය. නමුත් විවාහයේ දී හෝ ආදරය කිරීමේ දී හෝ අපේ රටේ තරුණ තරුණියන් ඇත්තටම නිදහස්ද? සමාජීය ජීවිතය තුළ යෞවන ප්‍රේමයට තරම් විලංගු, වැටකඩොළු තවත් නැති තරම්ය. කුලමල භේද, ජාති ආගම් භේද මෙන්ම දැවැදි ප්‍රශ්න ආදිය මගින් ඔවුන්ගේ ආදරයට බාධා කරමින් ඇත. අවසන කෙසේ හෝ විවාහ වුවද එතැන් පටන් ඒ ආදරය පැලදොරින් පළා යන්නට වන්නේ ඇයි දැයි සිතුවහොත් ඊටද මේ සමාජ ක්‍රමය නිසා දායාද වූ බොහෝ හේතුකාරණා දැකගත හැකිය. අද වන විට බොහෝ ප්‍රේමවන්තයින්ගේ අවසන් හමුවීම සිදුවන්නේ උසාවි තුළය.

ඉඳින් කල්පනා කර බැලුවහොත් අපි ඇත්තටම නිදහස් නොවන බව ඔබට වැටහෙනු ඇති. නිදහස් මිනිසා නිවහල්ය. එසේම ඒ නිදහස ඔවුන්ගේ ජීවිතය පුරාම සතුට තවරනු ඇත. නමුත් මේ මොහොතේ දී අපට අහිමි; අපේ රටේ තාරුණ්‍යයට අහිමි මේ නිදහස අප ලබාගත යුතු නොවේද? පෙබරවාරි 04දා නිදහස පිළිබඳ යළි සිතාබැලීමට සිදුවන්නේ ඒ අනුවය. ඒ නිසා අපට සැබෑ නිදහස වෙනුවෙන් සටනක් ඇත. අධ්‍යාපනයේ නිදහස වෙනුවෙන්, රැකියාවේ නිදහස වෙනුවෙන් මෙන්ම ආදරයේ නිදහස වෙනුවෙනුත්, යහපත් සමාජීය ජීවිතයක් ලැබීම වෙනුවෙනුත් අපට ඇති අයිතිය වෙනුවෙන් එක්වෙමු. ඒ අරගලයේ ජය ලැබෙනා, ජය දද නැගෙනා දිනෙක දී අප සැබෑම නිදහස් තරුණ තරුණියන් වන්නෙමු.





### හිනැහෙනා දුවසක්...

නිල් ගුවන් තල
රත් වනින්
ලොවම බබලවන
දාහය නොවූ
රක්ත හිරු....
දොම්නස
සොම්නස
කැටිකොට..
දිවි ප්‍රභා නංවන...
සත්සිය කෙළක්
දනන් සුවපත්
සිනා කැන්
මුවින් සරසන...
සිහිනයකි...
හෙට දනන් පුබුදවන..

## රැකියා දසලක්ෂය

පසුගිය මැතිවරණයේ වත්මන් පාලකයින් බලයට ඒමට ලබාදුන් පොරොන්දු අතර එක් වැදගත් පොරොන්දුවක් වූයේ රටේ තරණ තරැණියන් සදහා රැකියා දස ලක්ෂයක් ලබාදෙන බවයි. පසුගියදා කුලියාපිටිය ප්‍රදේශයේ මෝටර් රථ කර්මාන්ත ශාලාවක් විවෘත කිරීමට මුල් ගල තැබීම එහි ආරම්භක පියවරක් බවද එය ලබාදුන් මැතිවරණ පොරොන්දු ඉටු කිරීමක් බවද රට පුරා විශාල ප්‍රචාරණයක්ද සිදුකෙරිනි. නමුත් එය මෝටර් රථ නිෂ්පාදනය කරන වොක්සගන් සමාගමේ ශාඛාවක් නොවන බවත් මෝටර් රථ අමතර කොටස් ගෙන්වා සවිකරන වෙනත් සමාගමක් බවත් හෙළි විය. එය පෙර පරිදිම රටේ ජනතාව මුලාකිරීමක් විය.

පසුගිය වසර 68ක ධනේශ්වර පාලකයින් සහ එම පාලන ක්‍රමය විසින් රටේ නිෂ්පාදන ආර්ථිකය බිඳ වට්ටවා ඒ වෙනුවට සියල්ල ආනයන මත යැපෙන ආර්ථිකයක් නිර්මාණය කොට තිබේ. මෙම ක්‍රමය පවතින තාක් කල් රටේ තරුණයාට රැකියා ලබාදීම පොරොන්දුවක් පමණක් වන අතර එසේ නොවීමට නම් රටේ ස්වභාවික හා මානව සම්පත උපයෝගි කොට ලොකයේ දියුණු තාක්ෂණය භාවිත කර රටතුළ නිෂ්පාදන ආර්ථිකයක් ඇති කළ යුතුය. එවිට අලුතින් රැකියා උත්පාදනය කළ හැකි අතර විරැකියාව පිළිතුරු ලබාදිය හැකිවේ. එවැන්නක් අපට පවතින පාලකයින්ගෙන් කිසිදාක බලාපොරොත්තු විය නොහැකි බවට මෙය කදිම සාක්ෂියකි.

## අපරාධ පිටුදැකීම

පසුගිය ජනවාරි 20 දින මොණරාගල මැදගම ප්‍රදේශයේදී රජයේ බැංකුවක ඒ.ටී.එම් යන්ත්‍රයක් බිඳ රුපියල් ලක්ෂ 57 කට අධික මුදලක් කොල්ලකෑම සම්බන්ධයෙන් තොරතුරු වාර්තා විය. මීට අමතරව දෛනිකව රටපුරා මෙවැනි විවිධ සිදුවීම් පිළිබඳ තොරතුරු නොඅඩුව ඇසීමට ලැබෙන අතර මෙවැනි අපරාධවලට සම්බන්ධ වැරදිකරුවන් අල්ලා එල්ලා මරා දැමීමෙන් මෙම ප්‍රශ්න විසඳෙන බව රටේ බහුතරයක් දෙනා විශ්වාස කරති. එහෙත් කොතරම් දඬුවම් ලබාදුන්නත් මෙම සිදුවීම්වල අඩුවීමක් දක්නට නොලැබේ. ඒ වෙනුවට එමගින් රටේ සමාජ අර්බුද ගණනාවක් නිර්මාණය කොට තිබේ.

වර්තමානයේ රටේ බරපතළ ආර්ථික අර්බුදයක් මතුව තිබේ. සාතිශය බහුතරයක් දෙනා තම අත්‍යවශ්‍ය දෛනික අවශ්‍යතාවත් ඉටු කරගත නොහැකි තත්වයකට පත්ව තිබේ. ඒ අතරින් ඉතා සුළු පැලැන්තියක් සුපිරි ජීවිත ගත කරමින් සිටී. ඉතා විශාල ලෙස රටේ ආදායම් බෙදීයාමේ විශමතාවයක් ඇතිව තිබේ. මෙම විෂමතාවය පවතින තාක් අනිවාර්ය ලෙස මෙම සමාජ අර්බුද නිර්මාණය කරනු ලබන අතර එය වැළැක්වීමට නම් රටේ ආදායම් සාධාරණ ලෙස සියලු දෙනාට බෙදීයන සමාජයක් බිහිවීම අනිවාර්ය වී තිබේ.

# අර්බුදය ඉහළටත්?

"එක් පැත්තකින් පාලක පංතියේ පැරණි විධියට ජීවත්වීමේ හා පාලනය ගෙනයාමේ නොහැකිකමත්, එනම් 'ඉහළින් ඇතිවන' අර්බුදයත්, අනෙක් පැත්තෙන් පැරණි විධියට ජීවත්වීමට නොහැකි පීඩිත පංතීන්ගේ අමනාපයත්, එනම් 'පහළින් ඇතිවන' අර්බුදයත් සමාජ විප්ලවයක් සඳහා අත්‍යාවශ්‍ය විප්ලවීය තත්වයත් සඳහා නැතිවම බැරි විෂය මූල තත්වයන්ය"

සමාජ පරිවර්තනයක් සඳහා අවශ්‍යවන විෂයමූල සාධක පිළිබඳව රෝහණ විජේවීර සහෝදරයා සිය 'අප මරාදැමුවද අප නගන හඬ සදා නොමියෙනු ඇත'. නම් කෘතියේ සඳහන් කර තිබුණේ එසේය. ඉන් කියවෙන්නේ, ගැඹුරු සමාජ පරිවර්තනයක් සඳහා ධනවාදී අර්බුදය පීඩිත පංතියට කරන බලපෑම පමණක් ප්‍රමාණවත් නොවන බවත් ඒ සඳහා ධනවාදී අර්බුදය පාලක පංතිය තුළින්ද ප්‍රකාශ විය යුතු බවත්ය. ලංකාවේ තවම විප්ලවීය තත්වයක් ඇතිවී නැති බව ඇත්තය. නමුත් සමාජ වෙනසක් සඳහා ඒ දෙසට තත්වයන් මෝරමින් පෙළ ගැසෙමින් තිබෙන බව ප්‍රතික්ෂේප කළ නොහැක. විශේෂයෙන්ම මේ මොහොතේ ලංකාවේ පාලක පංතිය මුහුණදී ඇති ඉතාම තියුණු අර්බුදය විසින් බලය දිගටම පාලක පංතිය අතම තබා ගැනීමට නොහැකි තත්වයක් උදාවෙමින් තිබේ. සමාජ වෙනසක් වෙනුවෙන් කටයුතු කරන බලවේග මෙම පාලක පංතියේ අර්බුදයේ ප්‍රමාණය වටහාගත යුත්තේ ඒ නිසාය.

මේ මොහොත වනවිට ලාංකේය ධනවාදය දැවැන්ත මූල්‍ය අර්බුදයකට මුහුණ දී සිටී. එම අර්බුදය දැන් සෑම ක්ෂේත්‍රයක්ම වෙළාගෙන තිබේ. ඉන් ගැලවුන කිසිවෙක් නැත. මෙය පීඩිත පංතිය පොදු ජනතාව සමාජයේ වෙනසක් ඉල්ලා සිටින තත්වය දක්වා වර්ධනය වෙමින් තිබේ. ඒ අතර මෙම ධනවාදී අර්බුදය, ධනපති පාලක පංතිය තුළින්ද ප්‍රකාශයට පත් වෙමින් ඔවුන්ද අර්බුදයට පත්කර තිබේ. රටේ පාලනය අරාජිකත්වයක මට්ටමට වැටෙමින් තිබෙනු අප කාටත් දැනෙන්නේ මේ තත්වය තුළය.

දැන් ලංකාවේ පවතින්නේ හවුල් ආණ්ඩුවකි. මෙය මීට පෙර පැවති ප්‍රධාන ධනපති පක්ෂය වටා කුඩා පක්ෂ එක්ව සාදන වර්ගයේ හවුල් ආණ්ඩුවක් නොව ඉතිහාසයේ පළමු වතාවට ධනපති ශ්‍රීල.නි.ප.ය හා එ.ජා.ප.ය එක්ව අටවාගත් හවුල් ආණ්ඩුවකි. යුඇන්පි - ශ්‍රීලංකා හවුල් ආණ්ඩුව බිහිවූයේ ඇයි?. "රට හැදීමට සමගි විය යුතුය", "බෙදී සිටිනවා වෙනුවට එක්ව රට හැදිය යුතුය" වැනි හේතු මත නොව, මෙම ආණ්ඩුව බිහිවූයේ ධනපති පක්ෂ දෙකටම තනිවම පාලනය ගෙනයාමට තරම් බලයක් 2015 මහ මැතිවරණයේදී ජනතාව නොදුන් නිසාය. එබැවින් මේ හවුල් ආණ්ඩුව 'සමගියේ ශක්තිය' මත බිහිවූවක් නොව 'බලයේ අවශ්‍යතාවය මත' අටවාගත් එකකි. එහි පාර්ශව දෙක බලය පවත්වාගෙන යාම සඳහා, වරප්‍රසාද භුක්ති විඳීම සඳහා එකඟතාවෙන් සිටියද බොහෝ කරුණුවලදී ඔවුහු ප්‍රතිවිරෝධයක් තුළ සිටිති. එකිනෙකා විවේචනය කරගනිති. එකට හවුලේ සිටින ගමන්ම වෙනම තම තමන්ගේ බලය වැඩිකර ගැනීමට, තනිබලයක් සහිත පාලනයන් පිහිටුවා ගැනීමට උත්සාහ කරති; සිහින දකිති. එහෙත් මේ ප්‍රතිවිරෝධය නිසාම ආණ්ඩුව දුර්වලව පවතී.

මෙම ආණ්ඩුව ජන බලයක් නැති දුබල ආණ්ඩුවකි. මේ ආණ්ඩුව බිහිවූයේ එක් ධනපති පක්ෂයක් වටා ජනතාව ඒකරාශිවී ඒ ජනතාවගේ ශක්තියෙන් නොවේ. මෙය බිහිවූයේ රටේ බහුතර ජනයා රාජපක්ෂ පාලනය පලවා හැරීමට ගත් තීරණයේ අතුරු ඵලයක් ලෙසය. ඒ නිසාම මේ ආණ්ඩුව රකින, ආණ්ඩුව වෙනුවෙන් කරුණු, මත ඉදිරිපත් කරන පිරිසක් රටේ අපට හමු නොවේ. ආණ්ඩුවට ජන බලයක් නොමැති නිසාත් ආණ්ඩු කරන කණ්ඩායම් දෙකේ පරස්පරය නිසාත් ආණ්ඩුවේ බොහෝ තීරණ ක්‍රියාමාර්ග එක්කෝ කර ගත නොහැකිව තිබේ. නැතිනම් ආණ්ඩුව පස්සට අඩිය තබා තිබේ. ජනතා උද්සෝෂණයකට ආණ්ඩුවේ සමහර ක්‍රියා තාවකාලිකව හෝ ආපසු හැරවිය හැකිව තිබේ. මෙම තත්වය පසුගිය රාජපක්ෂ පාලනය තුළ හෝ චන්ද්‍රිකා පාලනය තුළ හෝ ප්‍රේමදාස, ජේ.ආර්. පාලන තුළ තිබුණේ නැත.

සුපිරි ඇමති තනතුරක් නිර්මාණය කිරීම සඳහා ආණ්ඩුව ගෙන ආ පනත් කෙටුම්පත පළාත් සභාවලදී පරාජයට පත්වූ හැටි අපි දැක්කෙමු. ඒ, එ.ජා.ප. - ශ්‍රීල.නි.ප. ආණ්ඩුව කළාට පළාත් සභාවල පවතින්නේ ශ්‍රීල.නි.ප. පාලනයක් නිසාය. ඒ අනුව ආණ්ඩුවේ බලය දුර්වලය. සියලුම පාලන ආයතන ආණ්ඩුව සතුව නැත. තවම පළාත් පාලන ඡන්දය පැවැත්වීමට ආණ්ඩුවට නොහැකිව තිබෙන්නේත් මේ ප්‍රතිවිරෝධය නිසාය. ජනතාවගේ උද්සෝෂණ නිසා හම්බන්තොට ඉඩම් චීන සමාගමකට විකිණීමේ ප්‍රයත්නය පස්සට ගැනීමට ආණ්ඩුවට සිදුවිය. එසේම මුදල් අමාත්‍යාංශය විසින් ලොතරැයි පත් මිල රු. 30ක් දක්වා නැංවූ විට ඊට එරෙහිව ලොතරැයි අලෙවිකරුවන් විරෝධය පළ කළ අතර ජනාධිපතිවරයා මැදිහත්වී ලොතරැයියේ මිල යළි රු. 20 කළේය. මෙවැනි උදාහරණ රැසක් තිබේ. මේ සියල්ලෙන් පෙන්වන්නේ, පාලක පංතියට ජනතාව නොසලකා කටයුතු කළ හැකි, ජනතා විරෝධය පොඩි පට්ටම් කළ හැකි ශක්තියක් නැති බවය.


ආණ්ඩුව දුර්වලවී තිබෙනවා සේම ලංකාවේ ප්‍රධාන ධනේශ්වර පක්ෂ දෙක වන එ.ජා.ප.ය හා ශ්‍රීල.නි.ප.යද දුර්වලව තිබේ. එ.ජා.ප.යට සිය බලය බිම්මට්ටම දක්වා ගොඩ නගා ගැනීමට තවම නොහැකිවී තිබේ. එයට ඇත්තේ ආණ්ඩු බලයෙන් බාගයකි. එය අංශභාග රෝගී තත්වයකි. පළාත් පාලන ඡන්ද පැවැත්වීමට නොහැකිවීම නිසා (අර්බුදය නිසාම) බිම් මට්ටමේ බලය ඔවුන්ට ගොඩ නැගී නැත. අනෙක් අතට එ.ජා.ප.ය නායකත්ව අර්බුදයකද සිටී. එ.ජා.ප.යේ වත්මන් නායක රනිල් වික්‍රමසිංහ මහතා රටේ ජනතාව තුළ පෞරුෂයක් සහිත ආකර්ෂණීය නායකයෙක් නොවේ. බොහෝවිට ඔහුගෙන් ප්‍රකාශ වන්නේ විහිළුකාරී ස්වභාවයකි. වෙනත් නායකයෙක් පිළිබඳව සිතුවද තත්වය එසේමය. අනෙක් අතට රනිල් වික්‍රමසිංහ මහතා එ.ජා.ප. පාක්ෂිකයන්ගේ අධ්‍යාත්මික නායකයාද නොවේ. 2015 ජනාධිපතිවරණයට ආසන්න වකවානුව වනතුරුම එජාප පාක්ෂිකයන් උත්සාහ කළේ රනිල් නායකත්වයෙන් ඉවත් කිරීමටය. ඒ නිසා ආණ්ඩුව දුර්වලව පවතින්නාක් මෙන්ම එ.ජා.ප.යද පවතින්නේ දුර්වලවය. එයට ජනතා ආකර්ෂණය නැත. රාජපක්ෂ පාලනය පෙරළා දැමූ ඒ විශේෂ මොහොතේත් තනිව ආණ්ඩුවක් පිහිටුවීමට තරම් බලයක් ලබා ගැනීමට නොහැකිවූ එජාපයට දැන් තව අවුරුදු කිහිපයකින්, සිය පාලනයට එරෙහිව ගොඩ නැගෙන ජනතා විරෝධය හමුවේ නැවත තනිව බලයට ඒමට හැකියයි සිතීම මිත්‍යාවකි. ඊට ඉඩක් නැත.

අනෙක් අතට ශ්‍රීල.නි.ප.යද දෙකඩවී දුබලවී තිබේ. ශ්‍රීල.නි.ප. පාර්ශ්ව දෙක පවතින්නේ, වත්මන් ජනාධිපති හා හිටපු ජනාධිපති අතය. දැන් මේ මෛත්‍රී - මහින්ද පාර්ශව දෙක බලය වෙනුවෙන් එකතු කිරීමට සමහරු උත්සාහ කළද යථාර්ථයේදී කණ්ඩායම් දෙක අතර පවතින්නේ බරපතළ ප්‍රතිවිරෝධයකි. දෙපාර්ශ්වය එකිනෙකා විවේචනය කර ගනිති. එක් පාර්ශවයක් ආණ්ඩුව තුළත් අනෙක් පාර්ශවය විපක්ෂය තුළත් සිටීම නිසා ක්‍රියාමාර්ගවලදී පවා ප්‍රතිවිරෝධය වැඩිවනු මිස අඩුවන්නේ නැත. මෙම බෙදීම මධ්‍යස්ථ පාක්ෂිකයා කලකිරීමට ලක්කරනු ඇත. පක්ෂය බෙදී නොතිබූ අවස්ථාවෙත්, ජනාධිපතිවරණයේදී මහින්ද පරාජය වූයේ නම් මහමැතිවරණයේදී මහින්ද - මෛත්‍රී දෙදෙනාම එක පිලක සිටත් ඉන් ජයගැනීමට නොහැකිවූයේ නම් දැන් බෙදීවෙන්වූ තත්වය තුළ ජය ගැනීමට කිසිසේත් නොහැක. පසුගිය ජනාධිපතිවරණයේදී ඡන්ද ලක්ෂ 58කට ආසන්න ප්‍රමාණයක් ගත් නිදහස් සන්ධානය ඉන් මාස 07කට පසු මහමැතිවරණයේදී ලබාගන්නේ ඡන්ද ලක්ෂ 47කි. ශ්‍රීල.නි.ප.යේ ඡන්ද පදනම බිඳවැටීමේ වේගය ඉන් තේරුම් ගත හැක.


දැනට ශ්‍රීල.නි.ප. කල්ලි දෙකෙන් විපක්ෂයේ සිටින්නේ රාජපක්ෂ කල්ලියය. එක් අතකින් පරණ හොරකම් වෙනුවෙන් ඔවුන්ට නඩු පැවරීමට පටන්ගෙන තිබෙන අතර ඒ නිසාම ඔවුන්ට බලය ගැනීමේ ව්‍යාපෘති ගැන සිතනවා වෙනුවට හිරගතවීමෙන් වළකින ආකාරය ගැන සිතන්නට සිදුව තිබේ. මහින්ද රාජපක්ෂ මහතාගේ දේශපාලන පෞරුෂයද දිනපතා දියවෙමින් පවතී. මේ තත්වය තුළ ඔවුන්ට යළි බලය ගැනීම සිහිනයක් පමණක් වනු ඇත.

මේ සියලු කරුණුවලින් පෙනීයන්නේ, ධනවාදයේ අර්බුදය තුළ 'පාලක පංතිය' අර්බුදයට පත්ව ඇති ප්‍රමාණයේ තරමය. දැන් අර්බුදය 'පහළින්' පමණක් නොව 'ඉහළින්'ද ප්‍රකාශයට පත්ව තිබේ. මෙම තත්වය විසින් දේශපාලනයේ 'අවස්ථා' නිර්මාණය කරන අතර එම අවස්ථා වාසිදායක වන්නේ වමේ හා ප්‍රගතිශීලී බලවේගයන්ටය. ධනපති පංති පක්ෂ දුර්වලවීම නිසා මතුව ඇති තත්වය, මතුව ඇති රික්තය ජනතාවාදී බලයකට ඉඩකඩ විවරකර තිබේ. ඉතිහාසයේ මතුව ඇති මේ විශේෂ හා වාසිදායක අවස්ථාව අත්පත් කරගෙන එය සමාජ වෙනසක් සඳහා, ඒ වෙනුවෙන් ජනතාවාදී පාලනයක් බිහිකිරීම සඳහා එවැනි පාලනයක් සඳහා ප්‍රබල ජනතා මධ්‍යස්ථානයක් විකල්ප බලයක් නිර්මාණය කිරීම සඳහා යොදා ගැනීම වමේ වගකීමය; අපේ වගකීමය. දැන් කළ යුත්තේ, ඒ වෙනුවෙන් බලවේග පෙළ ගැස්වීම හා ජනතා බලය ගොඩ නැඟීමය.

වරක් ලෙනින් කියූ ලෙස ධනපති පංතිය මල්පෝච්චිවල පැළ සිටුවද්දී අප බිම අස්වැද්දීමට මෙන්ම අස්වනු නෙළීමටද බලවේග සූදානම් කළ යුතුව ඇත.



> මේ සියලු කරුණුවලින් පෙනීයන්නේ, ධනවාදයේ අර්බුදය තුළ 'පාලක පංතිය' අර්බුදයට පත්ව ඇති ප්‍රමාණයේ තරමය. දැන් අර්බුදය 'පහළින්' පමණක් නොව 'ඉහළින්'ද ප්‍රකාශයට පත්ව තිබේ. මෙම තත්වය විසින් දේශපාලනයේ 'අවස්ථා' නිර්මාණය කරන අතර එම අවස්ථා වාසිදායක වන්නේ වමේ හා ප්‍රගතිශීලී බලවේගයන්ටය.



"සූරාකනු ලබන හා පීඩිත ජනතාව තමන්ට පැරණි ක්‍රමයට ජීවත්විය නොහැකි බව අවබෝධ කර ගැනීම සහ වෙනස් කිරීම ඉල්ලීම විප්ලවයක් සිදුවීම සඳහා ප්‍රමාණවත් නොවේ. විප්ලවයක් සිදුවීම සඳහා සූරාකන්නන්ට පැරණි ක්‍රමයෙන් ජීවත් වීමට සහ පාලනය කිරීමට නොහැකි තත්වයක් ඇතිවීම අත්‍යාවශ්‍යය. විප්ලවය විජයග්‍රහණයට පත්විය හැක්කේ 'පහළ පංතිවලට' පැරණි ක්‍රමයෙන් ජීවත්වීම එපා වූ විට සහ 'ඉහළ පංතිවලට' පැරණි ක්‍රමයෙන් කටයුතු කරගෙන යාමට බැරිව ගිය විටය.''

**ලෙනින්**
**තෝරා ගත් කෘති,**
**10වැනි වෙළුම,**
**204-205 පිටු**

# දේපොළ, සම්පත්, රැක ගැනීමට

අත්තනෝමතික රාජපක්ෂ පාලනයෙන් මිදීම සඳහා ජනතාව විසින් තෝරා ගනු ලැබුවේ මෛත්‍රීපාල සිරිසේනයි. ඒ මොහොතට සාපේක්ෂව ජනතාවගේ එම තීරණයේ නිවැරදිභාවයක් තිබුණද පසුව එළඹි මහ මැතිවරණයේදී ජනතාව නැවත වතාවකින් රැවටිල්ලට ලක් විය.

එම මැතිවරණ ව්‍යාපාරය අභියස එ.ජා.ප.ය මෙන්ම ශ්‍රීල.නි.ප.ය. ප්‍රමුඛ සන්ධානයද එකිනෙකා පරයමින් මැතිවරණ ප්‍රකාශන ඉදිරිපත් කෙළේය. ඇතැමෙකුගේ සිහිනය වුයේ එ.ජා.ප. ආණ්ඩුවක් තුළ නැවත අතමිට සරු කර ගැනීමයි. තවකෙකු මෛත්‍රී යටතේ ශ්‍රීල.නි.ප.ය. ප්‍රමුඛ ආණ්ඩුවක්ද, සමහරෙකු මහින්ද රාජපක්ෂ නැවත කරළිගත කිරීමටද උත්සාහ ගන්නා ලදී.

එහෙත් වත්මන වන විට ජනතාවට ලබා දුන් සුන්දර බලාපොරොත්තු සුණුවිසුණු කරමින් රනිල් - මෛත්‍රී හවුල් පාලනය විකුණාගෙන කෑම හෙවත් පෞද්ගලීකරණ ක්‍රියාවලිය ශක්තිමත් කරමින් සිටී. එහෙත් රාජපක්ෂ කල්ලිය විසින් දියත් කරනු ලබන ඇතැම් විරෝධතා ව්‍යාපාර හේතුවෙන් පෞද්ගලීකරණ ක්‍රියාවලියට එරෙහි සැබෑ ජනතා විරෝධයන් යටපත් වී ආණ්ඩුවට වාසි දායක තත්වයන්ද මතු වෙමින් තිබේ. මේ මොහොත වන විටත් හම්බන්තොට වරාය, කොළඹ වරායේ නැගෙනහිර ජැටිය, ශ්‍රී ලංකන් ගුවන් සේවය, ත්‍රිකුණාමලය තෙල් ටැංකි, හම්බන්තොට, ඇඹිලිපිටිය හා මොණරාගල ඉඩම් අක්කර 15,000ක්, කහටගහ පතල, පුල්මුඩේ ඛනිජ වැලි නිධිය ආදී ජාතික හා ස්වභාවික සම්පත් විදේශීය සමාගම්වලට දිගු කාලීන බදු මත කුණු කොල්ලයට පවරා දීමට පිඹුරුපත් සකස් වී අවසානය.

මේ තත්වය තුළ 'රටේ සම්පත්, ජනතාවගේ දේපොළ, විකිණීමට එරෙහිව සටන් වදිමු!' යන තේමාව යටතේ ජනතාව දැනුවත් කිරීම සඳහා දිවයින පුරා අත් පත්‍රිකා බෙදා හැරීමේ වැඩසටහනක් ජ.වි.පෙ. විසින් දියත් කරන ලදී.

එය පසුගිය ජනවාරි හතරවෙනිදා කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිටින් ආරම්භ කරන ලද අතර ඒ අවස්ථාව සඳහා ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, දේශපාලන මණ්ඩල සභික



ලාල්කාන්ත සහ පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති යන සහෝදරවරුන් ඇතුළුව ජ.වි.පෙ සාමාජික සාමාජිකාවෝ රාශියක් සහභාගී වී සිටියහ.



# වරාය, ඉඩම් විකිණීමට එරෙහිව

හම්බන්තොට වරාය තම පාලන කාලය තුළම චීන සමාගමට බදු දීමට නොහැකි වීම හේතුවෙන් උද්ඝෝෂණ කැඳවමින් සිටිනුයේ මහින්ද රාජපක්ෂය. හම්බන්තොටින් ඉඩම් ගන්නේ නැතිව ලංකාවේ වෙනත් ඕනෑම තැනකින් ඉඩම් ගත්තාට ගැටලුවක් නැතැයි පැවසුවේ නාමල් රාජපක්ෂය.

හම්බන්තොට ඇතුළුව මොණරාගල හා ඇඹිලිපිටියෙන් අක්කර 15,000ක් චීන සමාගමකට පැවරීමට කටයුතු කරද්දීත් හාංකවිසියක් නැතිව සිටින්නේ එ.ජා.ප. නියෝජ්‍ය නායක හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සජිත් ප්‍රේමදාසය.

හම්බන්තොට වරාය අවුරුදු 99කට චීන සමාගමකට බදු දීම සහ ඉඩම් අක්කර 15,000ක් චීනයට දීම යන කාරණය සම්බන්ධයෙන් බොහෝ දේශපාලනඥයන්ගේ හැසිරීම ඉහත සඳහන් කළ ආකාරයට ලඝු කර දැක්විය හැක. ජ.වි.පෙ. හැරෙන්නට අනෙකුත් දේශපාලන පක්ෂ සියල්ල සිටිනුයේ සෘජුව හෝ වක්‍රව ආණ්ඩුවේ මේ ක්‍රියාමාර්ගය ශක්තිමත් කරන තැනකය.

රාජපක්ෂ කල්ලිය වරාය සහ ඉඩම් අක්කර 15,000 චීනයට පැවරීමට එරෙහිව පැන නැගෙන සැබෑ ජනතා විරෝධය යටපත් කිරීමට විවිධ ක්‍රියා මාර්ග දියත් කරද්දී ජ.වි.පෙ. ප්‍රදේශයේ ජනතාවද සම්බන්ධ කරගනිමින් පසුගිය ජනවාරි පස්වෙනිදා මේ විකිණීමට එරෙහිව උද්ඝෝෂණ පෙළපාලියක් සහ රැලියක් අතිසාර්ථකව අම්බලන්තොට නගරයේදී පවත්වන ලදී.

"හම්බන්තොට වරාය, ජනතාවගේ ඉඩම් විකිණීම වහා නවතනු" යනුවෙන් සංවිධානය කර තිබූ මේ පෙළපාලිය සහ රැලිය සඳහා ජ.වි.පෙ. නායකයින්, මහා සංඝරත්නය, කලාකරුවන් මෙන්ම වරාය සහ ඉඩම් විකිණීමෙන් පිඩාවට පත් වන ජනතාව ඇතුළුව බොහෝ පිරිසක්ද සහභාගී වී සිටියහ.

# රට ගොඩනගන දිරිය සමුළුව

රටේ සිදුවන සෑම දෙයකටම සමුළු පැවැත්වීම දැන් විලාසිතාවක් වී ඇත. ඡන්දයෙන් පැරදුණු දේශපාලකයන් නැවත බලයට ගෙන ඒමට සමුළුය. රාජ්‍ය මුදල්, සම්පත් අව භාවිතා කොට චෝදනා ලැබ රිමාන්ඩ් ගතවූවන් නිදහස් කර ගැනීමටද සමුළුය. තවත් තැනක් සමාජයෙන් වියෝවූ කුඩා දේශපාලන කණ්ඩායම් බලය තර කර ගැනීම වෙනුවෙන් සමුළුය. මෙකී නොකී සෑම දෙයකටම දැන් සමුළු පැවැත්වීම නිසා 'සමුළු' යන්න අද දවසේ විහිළුවක් ලෙසටද ඇතැමෙකුට පෙනී ගිය හැක.

මේ විගඩම් සමුළු මැද රටේ අනාගතය ගොඩනැගීම ඉලක්ක කරගත් සමුළුවක් පසුගිය ජනවාරි 22 වෙනිදා මහරගම නගරයේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. ඒ ජනතා විමුක්ති පෙරමුණ විසින් ගම් මට්ටමින් ගොඩනගන ලද දිරිය පුරවැසි සමිතිවල නියෝජිත සමුළුවයි. "ගමට දිරියක්, රටට බලයක් " යන තේමාව යටතේ පැවැත්වුණු මේ සමුළුව සඳහා උතුර, නැගෙනහිර ඇතුළු දිවයිනේ නන් දෙසින් දිරිය පුරවැසි සමිති නියෝජනය කරමින් නියෝජිතයෝ සහභාගි වූහ.

ටී.එම්. ජයරත්න, සූරිය කුමාර් මුත්තලගේ, එස්. කලාවතී, චන්ද්‍රසෝම බින්දුහේවා, දීපානි සිල්වා, දිල්හානි අශෝකමාලා යන කලාකරුවන් සහ කලාකරියන්ද, පරිපාලන සේවයේ හිටපු අමාත්‍යංශ ලේකම්වරයෙකු වූ සීමා නීර්ණ කොමිෂන් සභාවේ සභාපති අශෝක පීරිස් මහතා වැනි රාජ්‍ය නිලධාරීහුද මහජන සෞඛ්‍ය පිළිබඳ විශේෂඥ වෛද්‍ය නිහාල් අබේසිංහ මහතාද සමුළුවට සුභපැතුම් එක්කිරීම සඳහා සහභාගි වීම විශේෂත්වයක් විය.



ජ.වි.පෙ. නියෝජනය කරමින් නායක අනුර දිසානායක ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, දේශපාලන මණ්ඩල සභික ලාල්කාන්ත, බිමල් රත්නායක ඇතුළුව පළාත් සභා සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුද මෙයට සහභාගි වී සිටියහ.




# රාගම සිට මාලබේට

වර්ෂ 1981 දී එනම් ජේ.ආර්. ජයවර්ධන පාලන සමයේ උතුරු ලංකා වෛද්‍ය විද්‍යාලය නමින් යාපනේද උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලය නමින් රාගමද පෞද්ගලික වෛද්‍ය විද්‍යාල දෙකක් ඇරඹීමට සූදානම් කළද යාපනේ වෛද්‍ය විද්‍යාලය විරෝධතා හමුවේ ලත් තැනම ලොප් වූ අතර රාගම වෛද්‍ය විද්‍යාලය සිසු දරුවන්ගේ ජීවිත ගණනාවක් බිලි ගනිමින් 1991 දී රජයට පවරා ගනු ලැබුණි. ඉන්පසු 1997, 1999 සහ 2002 වසරවලදී චන්ද්‍රිකා බණ්ඩාරනායක පාලන සමයේදීද, 2005, 2008, 2009 වසරවල මහින්ද රාජපක්ෂ පාලන සමයේදීද වරින්වර පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ස්ථාපිත කිරීමට උත්සහ කළද ජ.වි.පෙ. ප්‍රමුඛ ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරයට ඒම උත්සාහයන් පරාජය කිරීමට හැකි විය.

එහෙත් අද දවස වන විට වත්මන් හවුල් ආණ්ඩුවද මාලබේ SAITM ආයතනයෙන් පිරිනැමීමට යන වෛද්‍ය උපාධිය නීත්‍යානුකූල කිරීමට පියවර ගනිමින් සිටී.

නමුත් කණගාටුවට කරුණ වන්නේ, මෙයට එරෙහිව පැන නගින සැබෑ සටන් මොට කර දැමීම සඳහා විවිධ කල්ලි සහ කණ්ඩායම් කටයුතු කිරීමයි. එක පැත්තකින් විශ්‍රාමික ජනාධිපති මහින්ද රාජපක්ෂයේ කණ්ඩායමය. අනෙක් පැත්තෙන් ශිෂ්‍ය ව්‍යාපාරය තුළ අවුල් ඇති කරන අති වාමාංශික කල්ලියි. මෙහිදී අවසානයේ වාසි සැලසෙනුයේ SAITM ආයතනයටය.

මේ සියලු තත්වයන් මැද ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරයට සැබෑ ලෙස නායකත්වය ලබාදෙන ජ.වි.පෙ. සමාජවාදී ශිෂ්‍ය සංගමය මේ SAITM ආයතනය මගින් ලබාදීමට යෝජිත වෛද්‍ය උපාධියට එරෙහිව විරෝධතා ක්‍රියාමාර්ග මාලාවක් ආරම්භ කර ඇත. එහි එක් ක්‍රියාමාර්ගයක් ලෙස ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයාගේ නායකත්වයෙන් පසුගිය ජනවාරි 17 දා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සමග මේ පිළිබඳව සාකච්ඡාවක් පැවත්වන ලද අතර පසුගිය ජනවාරි 27 වෙනිදා කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී SAITM නීතිගත කිරීමේ කුමන්ත්‍රණය පරදවමු!, අධ්‍යාපනය විකිණීමට එරෙහිව ජනතා බලයක් ගොඩනගමු!" යන තේමාව යටතේ සම්මන්ත්‍රණයක්ද පවත්වන ලදී.

මේ සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා විසින් පවත්වන ලද අතර සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා ඇතුළුව රාගම වෛද්‍ය පීඨයේ මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසිංහ, ජ්‍යෙෂ්ඨ නීතිඥ ජේ.එම්. විජේබණ්ඩාර යන මහත්වරුන් විසින්ද මෙහිදී දේශන පවත්වන ලදී.

**ධනවාදයේ ආර්ථික අර්බුදය යළිත් වටයකින් ලෝකය ගිලගෙන තිබේ. එය මීට පෙර ධනවාදය මුහුණ දුන් අර්බුදයන්ට වඩා ගැඹුරු හා පැතිරුණු එකකි. ධනේශ්වර පාලකයින් එයට මුහුණ දීමට සූදානම් වන්නේ, කප්පාදු වැඩපිළිවෙළවල් හඳුන්වා දීමෙනි. සහන කප්පාදුව හමුවේ පීඩාවට පත්වන ජනතාව මෙම අර්බුදයන්ට සැබෑ විසඳුම සමාජවාදය බව ඉක්මණින් හෝ පසුව තේරුම් ගනු ඇත.**

**ධනවාදයේ අර්බුදයට ස්ථිර සාර විසඳුම ඇත්තේ සමාජවාදය තුළ පමණි. එසේ වුවද සමාජවාදය පිළිබඳ මේ මොහොතේ පවතින වැරදි හා මිත්‍යා මත විසින් සමාජවාදය පිළිබඳ උනන්දුවක් දක්වන පිරිස් තුළ පවා සමාජවාදය පිළිබඳ සැක සංකා මතුකර තිබේ.**

**සමාජවාදය පිළිබඳව පවතින මෙම මිත්‍යා හා වැරදි මතවලට පිළිතුරු සැපයීම මේ මොහොතේ අවශ්‍යතාවයක්ව පවතී. ඒ වෙනුවෙන් අද සිට ලිපි පෙළක් ආරම්භ කිරීම 'නියමුවා' තීරණය කළේ එබැවිනි. සමාජවාදය පිළිබඳව වන මෙම කතිකාවත පෝෂණය කිරීම සඳහා ඔබගේ අදහස්ද අපි ඉතා අගය කොට සලකමු.**

# සමාජවාදය තුළදී පෞද්ගලික දේපළ ...

ඔබට ගවයින් දෙදෙනෙකු සිටී. උන් දෙදෙනාගෙන් ලැබෙන ආදායමෙන් පවුලක් නඩත්තු කිරීමට සිදුවේ. ඒ සඳහා උන්ගෙන් ලැබෙන කිරි හෝ කිරි නිෂ්පාදිතයන් අලෙවි කිරීමට ඔබට සිදුවන්නේය.

ගවයින් දෙදෙනාගෙන් ලැබෙන කිරි සාධාරණ මිලකට අලෙවි කර ගැනීම ධනේශ්වර ක්‍රමය තුළදී ලෙහෙසි නැත. කිරි නිෂ්පාදනයක් කිරීම සඳහා අවශ්‍ය සහාය ඒ සඳහා අවශ්‍ය දැනුම උපකරණ ආදිය සැපයීම සඳහා ධනේශ්වර ක්‍රමය තුළ වැඩපිළිවෙළක් නැත. ඒවා ඔබම සපයා ගත යුතුය. එය කිරි විකිණීමට වඩා දුෂ්කර කටයුත්තකි.

ධනේශ්වර ක්‍රමය තුළදී කුඩා නිෂ්පාදකයෙකු වන ඔබගේ කිරි අලෙවි කිරීමට සිදුවන්නේ වෙළඳපළේ ඇති මිලටය. වෙළඳපලේ ඇති කිරි හා කිරි නිෂ්පාදන සුප්‍රකට වෙළඳ නාමයන් සහිත නවසීලන්තය සහ ඕස්ට්‍රේලියාව වැනි රටවලින් ගෙන්වන ඒවාය. එකී කිරි සමාගම්වල වෙළඳ ප්‍රචාරණය සමඟ තරඟ කිරීමට ඔබට නොහැකිය. ඒවා මහා පරිමාණ කර්මාන්ත බැවින් ඔවුන්ගේ නිෂ්පාදන වියදම ඉතා අඩුය. ඔවුන් ඔවුන්ගේ කිරි නිෂ්පාදනයන් වෙළඳපළේ විකුණන්නේ ඔබගේ නිෂ්පාදන වියදමටත් වඩා අඩුවෙන්ය. වෙළඳපළේ මිල වන්නේ එයයි. ඔබගේ කිරි වෙළඳපළේ අලෙවියෙන් ඔබට නිෂ්පාදන වියදමවත් නොලැබේ. එවිට ඔබට සිදුවන්නේ ඔබගේ කිරි ගවයින් දෙදෙනා විකුණා දමා කුලී වැඩක් හෝ සොයා ගැනීමටය.

ධනේශ්වර අර්ථ දැක්වීම අනුව දේපළ ලෙස හඳුන්වන ඔබගේ දේපළවලට ධනේශ්වර ක්‍රමය තුළදී සිදුවන්නේ එයය.

## 'පෞද්ගලික දේපළ'

සමාජවාදය තුළදී ඔබගේ කිරි ගවයින්, කුකුළන්, කෘෂිකාර්මික ඉඩම, ගෙවත්ත, ඔබ පරිහරණය කරන ගොඩනැගිලි, නිවස, ගෘහ උපකරණ, සංස්කෘතික භාණ්ඩ, ශීතකරණ, රූපවාහිනී, වාහන, යතුරුපැදි, රෙදිසෝදන යන්ත්‍ර, පරිගණක ආදී දේ දේපළ ලෙස නොසලකයි. ඒවා ඔබගේ පවුලේත් ඔබගේත් පුද්ගලික වුවමනාවන් තෘප්ත කිරීම සඳහා අත්‍යාවශ්‍ය පරිභෝජන භාණ්ඩය. ඒවා දේපළ නොවේ.

සමාජවාදයේදී ධනේශ්වර ක්‍රමය තුළදී මෙන් පුද්ගලයා වස්තු භංගත්වයට පත් නොවන්නේය. (ඉහත උදාහරණයේ දී මෙන්)

තේරුම් ගැනීමේ පහසුව සඳහා සහ භාවිතයේ පහසුව සඳහා අපි පුද්ගල පරිභෝජන භාණ්ඩ (එනම් නිවාස යාන වාහන ගෘහ භාණ්ඩ කිරි ගවයින්, කුකුළන්, කෘෂිකාර්මික ඉඩම, ගෙවත්ත, ඔබ පරිහරණය කරන ගොඩනැගිලි, නිවස, ගෘහ උපකරණ, සංස්කෘතික භාණ්ඩ, ශීතකරණ, රූපවාහිනී, වාහන, යතුරුපැදි, රෙදිසෝදන යන්ත්‍ර, පරිගණක ආදිය.) " පුද්ගල දේපළ" ලෙස හඳුන්වමු. සමාජවාදයේ දී ඉහත කී " පුද්ගල දේපළ" තවකෙකුට බලහත්කාරයෙන් හෝ වංචාවෙන් අත්පත් කර ගත නොහැකි වන්නේය. ඒවා සමාජවාදී නීතිය විසින් ආරක්ෂා කරනු ලබයි.

සමාජවාදය තුළදී වැඩියෙන් වැඩ කරන පුද්ගලයාට වැඩි ආදායමක් (වැඩි වැටුපක්) උපයා ගත හැකි වන්නේය. මේ නිසා වැඩියෙන් වැඩ කරන පුද්ගලයාට "පුද්ගල දේපළ" ලෙස වැඩි පරිභෝජන භාණ්ඩ ප්‍රමාණයක් ලබාගත හැකි වේ. මේ නිසා ඔහුගේත් ඔහුගේ පවුලේත් අවශ්‍යතාවන් වඩාත් හොඳින් තෘප්ත වේ. යම් පුද්ගලයෙකුට වැඩ කළ හැකිව තිබියෙදී එසේ නොකරන්නේ නම් ඔහුට පුද්ගළ දේපළ ලෙස පාරිභෝගික භාණ්ඩ ලබා ගැනීමට ඇති අයිතිය නැතිවේ.

මෙය වැඩ කළ නොහැකි ආබාධිත, වැඩිහිටි යන අයට අදාල නොවේ. ඔවුන්ට සමාජවාදී සමාජයේ සමාජ රැකවරණය සැලසේ. වැඩිපුර වැඩකරන පුද්ගලයින් වැඩිපුර ඉපයීම නිසා සමාජය තුළ නිර්මාණය විය හැකි විෂමතාවය මගහැරවීමට රජය මැදිහත්වන අතර සමාජ සුභසාධනය මගින් සමාජ සාධාරණත්වය පවත්වා ගනී.

සමාජවාදය තුළදී ජනතාවගේ පුද්ගල ආදායම වර්ධනය වේ. පුද්ගලයාගේ ආදායම් වර්ධනය ඔහුගේ ශ්‍රමයේ ගුණය හා ප්‍රමාණය මත රඳා පවතී. එනම් වැඩි වැඩ ප්‍රමාණයක් සිදු කරන පුද්ගලයාට වැඩි වැටුපක් ලැබෙන අතර පුහුණු ශ්‍රමිකයෙකුට නුපුහුණු ශ්‍රමිකයෙකුට වඩා වැඩි වැටුපක් ලබා දෙනු ලබයි. ජනතාවගේ පුද්ගල ආදායම වර්ධනය වන තරමට ඔවුන්ගේ ශාරීරික හා බුද්ධිමය හැකියාවන් වර්ධනය වේ.

සමාජවාදයේ ආර්ථික සංවර්ධන මට්ටම උසස් වන තරමට ජනතාවගේ සැබෑ ආදායම වැඩිවේ. ඔවුන්ට වැඩි භාණ්ඩ ප්‍රමාණයක් පුද්ගල දේපළ ලෙස තබා ගැනීමට හැකි වන්නේය. සමාජවාදය තුළදී පුද්ගල දේපළ ලෙස ලබා ගන්නා භාණ්ඩ තමන්ට අභිමත සේ පරිභෝජනයට විකිණීමට හෝ වෙනත් කටයුත්තකට භාවිතා කිරීමේ අයිතිය ඇත. එහෙත් පුද්ගල දේපළ අනෙකුත් පුද්ගලයන් සූරාකෑමේ මාධ්‍යයක් බවට පත් කළ නොහැකි වන්නේ ය.

## නිෂ්පාදනය ඉහළ දැමීමට දායකත්වය

සමාජවාදයේ දී ආර්ථික නියමය වන්නේ, ජනතාවගේ වැඩිවන ද්‍රව්‍යමය හා අධ්‍යාත්මික වුවමනාවන් හැකි උපරිමයෙන් තෘප්ත කිරීමය. ඒ සඳහා පළමුකොටම නිෂ්පාදනය හැකි උපරිමයෙන් ඉහළ දැමිය යුතු වන්නේ ය. එවිට ඔබ සතු ගවයින් දෙදෙනාගෙන් උපරිම කිරි නිෂ්පාදනයක් ලබා ගැනීමට සමාජවාදී රජය මැදිහත් වේ. ඒ සඳහා අවශ්‍ය උපදෙස් මඟ පෙන්වීම, විද්‍යාත්මක දැනුම පුහුණුව ඇතුළු ලබා දිය හැකි වෙනත් උපකාරයන් සමාජවාදී රජයෙන් ලබා දෙයි. සමාජවාදයේ අරමුණ වන්නේ, ඔබ සතු ගවයින් දෙදෙනා රජය සතු කර ගැනීම නොවේ; ගවයින් දෙදෙනාගේ අයිතිය ඔබට තිබියදී වැඩි කිරි නිෂ්පාදනයක් සිදු කර ගැනීමයි.

ඔබගේ නිෂ්පාදනය අලෙවි කර ගැනීමට ඔබට පුද්ගලිකව අනවශ්‍ය වෙහෙසක් දැරීමට සිදු නොවන්නේය. සමාජවාදී රජය ඔබගේ කිරි නිෂ්පාදනය සාධාරණ මිලකට ඔබගෙන් මිලදී ගනී. ධනේශ්වර ක්‍රමයේදී මෙන් ඔබගේ නිෂ්පාදනය වෙළඳපොළේ විකුණා ගැනීමට නොහැකි වීමේ අවදානම දැන් ඔබට නැත.

ඔබට අවශ්‍ය නම් ප්‍රදේශයේ අනෙකුත් කිරි ගොවීන් සමඟ එක්වී කිරි ගොවි සමුපකාරයක් ගොඩනගාගත හැකිය. ඒ ඔබට වඩා වාසිදායක වන්නේය. එහෙත් එය සිදුවිය යුත්තේ ස්වේච්ඡානුගතවය. ඔබගේ සහ ප්‍රදේශයේ කිරි ගොවීන්ගේ කැමැත්ත මත පමණි. ඔබ ගොඩනගා ගැනීමට අපේක්ෂා කරන සමුපකාරය සඳහා අවශ්‍ය නම් රජයෙන් ආධාර ඉල්ලා සිටිය හැකි වන්නේය. සමාජවාදී රජයට ඒ සඳහා වැඩපිළිවෙළක් ඇත .

සමුපකාරය ගොඩ නැගීම සඳහා අවශ්‍ය උපදෙස්, ණය පහසුකම්, උපකරණ, ගවයින් සඳහා අවශ්‍ය පොදු තණ බිම් ආදිය සමාජවාදී රජය විසින් ලබා දෙනු ඇත.

සමුපකාරය ගොඩනැගෙන්නේ ඔබගේ කිරි ගවයින් දෙදෙනාත් ප්‍රදේශයේ කිරි ගොවීන්ගේ කිරි ගවයනුත් සමුපකාරයට ලබාදීමෙන් වුවද කිරි ගවයින්ගේ අයිතිය ඒ එක් එක් ගොවියාටම හිමිය. කිරි ගොවි සමුපකාරයේ නිෂ්පාදිතය රජය මැදිහත්වී සාධාරණ මිලකට මිලදී ගන්නේය. ආදායම බෙදී යන්නේ එක් එක් ගොවියා සතු කිරි ගවයින් ගණනට අනුවය. මේ නිසා ඔබගේ ආදායම අඩු නොවන අතර සමස්තයක් වශයෙන් කිරි නිෂ්පාදනයේ නිෂ්පාදන වියදම අඩුවේ. මේ නිසා ඔබගේ සැබෑ ආදායම ඉහළ යයි. ඔබට අවශ්‍ය නම් ඔබගේ ආදායමින් ඉතිරි කරගත් කොටසින් තවත් ගවයින් මිලදී ගෙන සමුපකාරයට එක්කල හැකි වන්නේය. උන්ගේ අයිතියද ඔබ සතුවන අතර ඔබගේ කිරි දෙනුන්ගේ පැටවුන්ගේ අයිතියද ඔබ සතු වන්නේ ය.

## වස්තු භංගත්වයෙන් තොර සමාජයක්...

සමාජවාදයේදී ඔබ උපයන මුදල ඔබට පසුවට ප්‍රයෝජනයට ගත හැකි අයුරින් ඉතිරි කළ හැකි වන්නේය. ඒවා බැංකුවල හෝ ඉතුරුම් බැංකුවල තැන්පත් කළ හැකිය. ඔබගේ තැන්පතුව සඳහා

15වැනි පිටුවට



> සමාජවාදයේ දී ආර්ථික නියමය වන්නේ, ජනතාවගේ වැඩිවන ද්‍රව්‍යමය හා අධ්‍යාත්මික වුවමනාවන් හැකි උපරිමයෙන් තෘප්ත කිරීමය. ඒ සඳහා පළමුකොටම නිෂ්පාදනය හැකි උපරිමයෙන් ඉහළ දැමිය යුතු වන්නේය.



"ඉතිහාසය පිළිබඳ ද්‍රව්‍යවාදී සංකල්පය හා අතිරික්ත වටිනාකම මගින් ධනපති ක්‍රමයේ නිෂ්පාදනයේ රහස හෙළිදරව් කිරීම යන මේ සොයා ගැනීම් දෙක අප හමුවේ තැබුවේ මාක්ස්ය. මෙම සොයාගැනීම් සමගම සමාජවාදය විද්‍යාවක් බවට පත්විය. ඊළඟට කළ යුතු වූයේ, එහි විස්තර හා සම්බන්ධකම් සියල්ල පැහැදිලි කිරීමය."

**ෆෙඩ්‍රික් එංගල්ස්**
**සමාජවාදය මනෝ රාජ්‍යයෙන් විද්‍යාවට,**
**61 පිටුව**

# ගෝලීයකරණය ආපසු හැරෙයිද?




සමාජවාදී කදවුර බිඳ වැටීමෙන් පසු අධිරාජ්‍යවාදී කඳවුරේ සටන් පාඨය සහ වැඩපිළිවෙළ වූයේ ගෝලීයකරණයයි. ගෝලීයකරණය තුළ අධිරාජ්‍යවාදය ලෝකයේ සෑම අස්සක් මුල්ලකම ව්‍යාප්ත වූ අතර සියල්ල සිය ග්‍රහණයට ගැනීමට සමත් විය.

ඉන් අවුරුදු 20කට පසුව ගෝලීයකරණයේම ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය අර්බුදයක ආකාරයෙන් ධනේශ්වර ක්‍රමයේ අර්බුදය පුපුරා ගියේය. දැන් ගෝලීයකරණයේ නිර්මාතෘවරු එහි උපදේශකයෝ එක් වරම ගෝලීයකරණය අතහැර ආරක්ෂණවාදය හෙවත් හුදෙකලාව වෙත පසුබසිති; සිය අර්බුදයට විසඳුම ආරක්ෂණවාදය තුළ සෙවීමට පටන් ගෙන සිටිති. එහෙත් එය ප්‍රශ්නයට විසඳුම නොවන්නේය.

චීනයේ ෂින්හුවා පුවත් සේවයේ පළවූ ලිපියක පහත පරිවර්තනය මෙම කරුණ පිළිබඳ වැඩි පැහැදිලි කිරීමක් ඔබට ලබාදෙනු ඇත.

"බ්‍රිතාන්‍යයන් යුරෝපා සංගමයෙන් ඉවත් වීමට ඡන්දය දීමත් එක්සත් ජනපද නව ජනාධිපතිවරයා ලෙස ඩොනල්ඩ් ට්‍රම්ප්ව තෝරාපත් කර ගැනීමත් සමග ආරක්ෂණවාදයේ උදම් රළ බටහිර රටවල් වසා පැතිරෙමින් තිබේ.

කෙසේ වෙතත් ඇතුළට යොමු වූ දේශපාලන හා ආර්ථික ප්‍රතිපත්තිය ගෝලීයකරණයේ අවසානයේ පූර්විකාව ලෙස සැලකීම නොකළ යුතුය. එහෙත් එය ඒ වෙනුවට ගෝලීයකරණයේ නවතම ආකාරය එනම්, ගෝලීයකරණය 2.0 සංස්කරණය සඳහා වන සංඥාවක් වන්නේය.

ගෝලීයකරණයේ වත්මන් ආකාරය පසුගිය දශක කිහිපය තුළ දැවැන්ත ජයග්‍රහණ ප්‍රමාණයක් අත්කර දුන්නා සේම එහි සිදුරු ගණනාවක්ම පවතින බවද ප්‍රතික්ෂෙප කළ නොහැකිය. එසේ නොවන්නට 2016 වසර බලාපොරොත්තු සුන් වූ සහ උරණ වූ මිනිසුන්ගේ හැගීම්වල පිපිරීමක ප්‍රතිඵලයක් ලෙස ,කළු හංස, (Black Swan) සිදුවීම්වලින් යුක්ත වූ වසරක් නොවන්නට ඉඩ තිබුණි. (කළු හංස සිදුවීම් යනු අනපේක්ෂිතව සහ අනාවැකි පල කළ නොහැකි ආකාරයෙන් හා සාමාන්‍ය ක්‍රියාවලියෙන් පිට පැන සිදුවන සිදුවීම්ය.)

ලෝකය පුරා ආදායම් බෙදී යාමේ විෂමතාව වර්ධනය වීම තීරණාත්මක අඩුපාඩුවකි. ප්‍රාග්ධනය දිනපතා වර්ධනය වන හා තීරණාත්මක බලපෑමක් සිදු කරන බැවින් පොහොසතුන් තව තවත් ධනවත් වෙද්දී දුප්පත්තු තව තවත් දුප්පත් වෙති. ලෝකය වඩාත් අසාධාරණ තැනක් බවට පත් කරමින් යමෙකුගේ බුද්ධිමත්භාවය හෝ කඩිසරකම මත නොව ඔහු සතු වත්කම් ප්‍රමාණය මත පදනම්ව මහා ධනස්කන්ධයක් ඒකරාශී වීම සිදු වේ.

තදින් ඒකාබද්ධ වූ ලෝකය ජනවාර්ගික ගැටලු සඳහා නව අභියෝගයන් මතු කරයි. අන්තර් දේශ සීමා සංක්‍රමණය වඩාත් පහසු හා නිතර කෙරෙන්නක් බවට පත් වීම නිසා වෙනත් ජන වර්ගයක අසල්වැසියෙකුට සුභ පැතීම හෝ වෙනත් ආගමක සගයෙකුට සුභ පැතීම කලාතුරකින් සිදුවන්නක් නොවේ. එය ආර්ථිකය යහපත්ව ඇති තත්වයක් තුළදී ප්‍රශ්නයක් නොවිය හැකිය. නමුත් යමෙකුට මගේ චීස් කෑල්ල ගත්තේ කවුදැයි අලුත පැමිණියෙකුට ඇඟිල්ල දිගු කිරීමට සිදුවීම මේ යථාර්ථය තුළදී වළක්වාලිය නොහැකි වී ඇත.

කෙසේ වෙතත් අසම්පූර්ණ අසාර්ථක ගෝලීයකරණයට මුහුණ දීමේදී ආවෘතභාවය කිසිදා පිළිතුරක් වී නැතුවා සේම පිළිතුරක් වන්නේද නැත. එය පිළිතුර ආසන්නයටවත් නොයයි.

එක්සත් ජනපදය පැත්තෙන් ගත් කළ ට්‍රම්ප්ගේ මෙක්සිකෝ දේශ සීමාවේ ගොඩනගන දැවැන්ත ප්‍රාකාරය හා ඊට මෙක්සිකෝවද ගෙවිය යුතු වීම එරටෙහි විගමනික ගැටලු තවදුරටත් උත්සන්න කරනු ඇත.

බ්‍රිතාන්‍යය පැත්තෙන් ගත් කළ ලිස්බන් ගිවිසුමේ 50වැනි වගන්තිය ක්‍රියාත්මක කිරීමට පෙරදී පවා එරට මුදලෙහි කඩා වැටීම ලන්ඩනය ජාත්‍යන්තර මූල්‍ය කේන්ද්‍රය ලෙස පැවතීමේ තත්වය පවා තීරණාත්මක ලෙස ප්‍රශ්න කෙරෙන්නක් බවට පත්ව තිබේ.

ගෝලීයකරණ විරෝධය මතු වෙමින් තිබෙන යුරෝපයේ අනෙකුත් රටවල පවා ඊට එරෙහි මතවාදයන්ද මතු වෙමින් තිබේ. ප්‍රංශයේ නගර 30ක බර්කිනි පිහිනුම් ඇඳුම තහනම් කිරීමත් සමග මතු වූ ජනතා විරෝධය නිසා එය ආපසු හැරවීමට සිදු විය.

වත්මන් තත්වය අනුව ගෝලීයකරණය හැඩගැස්වීමට නම් ලෝකය එහි අලුත්ම සංස්කරණය වන ගෝලීයකරණය 2.0 හඳුන්වා දිය යුතුය.

නව පිටපත, සංවර්ධනය වෙමින් පවතින රටවල් කෙරෙහි වාසිදායක සම්පත්වල සාධාරණ බෙදී යාමක් අඩංගු කර ගත්තක් විය යුතුය. ලෝක සංවර්ධනය හා ස්ථායීතාවය අනතුරෙහි හෙළන සම්පත් බෙදී යාමේ විෂමතාව නිවැරදි ලෙස හැඩගැස්විය යුතුයි. බෙදී වෙන්වී යාමට වඩා ඒකාබද්ධතාවය ප්‍රධාන ප්‍රවණතාව විය යුතුය.

ගෝලීයකරණය සිහින ව්‍යුහයක් බවට තවම පත් වී නැත. එහෙත් සැමගේ උත්සාහයෙන් එය එවැනි දෙයක් බවට පත් කළ හැකිය."

## කොලොම්බියාව: ගරිල්ලාවන්ගෙන් නව පක්ෂයක්

කොලොම්බියාවේ ෆාර්ක් ගරිල්ලා සංවිධානය නව ප්‍රජාතන්ත්‍රවාදී හා විවෘත දේශපාලන පක්ෂයක් ගොඩනැගීමට සූදානම් වේ. 2016 නොවැම්බර් 24වැනි දින කොලොම්බියානු ජනාධිපති ජුවාන් මැනුවෙල් සැන්ටෝස් සමග කොලොම්බියානු විප්ලවකාරී සන්නද්ධ හමුදාව - ජනතා හමුදාව හෙවත් ෆාර්ක් ගරිල්ලා සංවිධානය අත්සන් කළ ඓතිහාසික සාම ගිවිසුමෙන් පසු ඔවුහු මෙම තීරණට එළඹ සිටිති.

මෙම පරිවර්තනය එනම් ගරිල්ලා හමුදාවක සිට නීත්‍යානුකූල දේශපාලන පක්ෂයක් බවට පත් වීම ආරම්භ කරනු ලබන්නේ ගිවිසුම අනුව ආයුධ භාර දීමේ ක්‍රියාවලිය අවසන් වීමෙන් පසුවය. නීත්‍යානුකූල දේශපාලන පක්ෂයක් බවට පත් වීම ඉලක්ක කර ගනිමින් සූදානම් කිරීමේ කටයුතු දැනටමත් ආරම්භ වී ඇත. ඒ අනුව සංවිධානයේ නායකත්ව මණ්ඩලය 23 සිට 61 දක්වා ඉහළ දමා ඇත.



## එක්සත් ජනපදය: ජාත්‍යන්තර අරමුදල් කැපීමට සැරසී

ඩොනල්ඩ් ට්‍රම්ප් එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවලට එක්සත් ජනපදය විසින් ලබා දුන් සහය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කිරීමට සූදානම් වන බව නිව්යෝර්ක් ටයිම්ස් පුවත්පත පසුගියදා වාර්තා කළාය. මේ අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානයට එක්සත් ජනපදය විසින් ලබා දෙන මුදල සීයට 40කින් පමණ අඩු කිරීමට ඔහු බලාපොරොත්තු වේ. අරමුදල් කප්පාදු කළ යුතු ආකාරය තීරණය කිරීම සඳහා කොමිසමක් පත් කිරීමට බලාපොරොත්තු වන බවද එහිදී විශේෂයෙන්ම සාමසාධක හමුදා ක්‍රියාන්විතයන්, ජාත්‍යන්තර අපරාධ අධිකරණය, එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල, එක්සත් ජනපදයේ වුවමනාවන්ට පටහැණිව කටයුතු කරන රටවල් හා සම්බන්ධ ආයතන ආදිය සඳහා අරමුදල් කප්පාදු කරන්නේ කෙසේ දැයි එහිදී සලකා බැලීමට නියමිතය.

එක්සත් ජනපදය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකයකු වන අතර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අයවැයේ 20%ක පමණ ප්‍රමාණයකට දායක වේ.




## සිරියාව: නව ව්‍යවස්ථාවක් අපේක්ෂාවෙන්


සිරියාව පිළිබඳ එක්සත් ජනපද විදෙස් ප්‍රතිපත්තියේ තීරණාත්මක පරාජයකින් පසු එරටෙහි අනාගතය තීරණය කරනු ලබන සාම සාකච්ඡා ජනවාරි 23 හා 24 දෙදින කසකස්තානයේ අස්තානා නුවරදී ආරම්භ විය. එහිදී රුසියාව විසින් සිරියාවට නව ව්‍යවස්ථා කෙටුම්පතක් යෝජනා කරනු ලැබිණි.

මෙම ව්‍යවස්ථා කෙටුම්පත මගින් නව වෙනස්කම් කිහිපයක්ම යෝජනා කර තිබේ. මෙතෙක් සිරියානු අරාබි ජනරජය ලෙස හැඳින්වූ එහි නාමය සිරියානු ජනරජය ලෙස වෙනස් කිරීමට ඉන් යෝජනා කර තිබේ. එහි අරමුණ ලෙස දක්වා ඇත්තේ සිරියාව තුළ කුර්දි, ආර්මේනියානු වැනි වෙනත් ජාතිකත්වයන්ද ජීවත්වන බැවින් එම තත්වය පිළිග ැනීම හා ඔවුන් අතර සහජීවනය තහවුරු කිරීමය.

එසේම සන්නද්ධ හමුදාවන්ට එරට ජනතාව මර්දනය කිරීමට හෝ රටේ පාලනය වෙනස් කිරීමට මැදිහත් විය නොහැකි බව එහි සඳහන් කර ඇත.

මීට අමතරව සිරියාවේ පළාත් නියෝජනය කරන නියෝජිතයින්ගෙන් සැදුම්ලත් උත්තර් මණ්ඩලයක්ද ජනතා ඡන්දයෙන් තේරෙන නියෝජිතයින් සඳහා පහළ මණ්ඩලයක්ද යෝජනා කර තිබේ.

කෙසේ වෙතත් මෙම කෙටුම්පත සම්මත වේද නැද්ද යන්න තීරණය කරනු ලබන්නේ සාම සාකච්ඡාවල සාර්ථකත්වය තුළදීය.




# හම්බන්තොට ගිල ගන්නා චීන-ලංකා ගිවිසුම

ප්‍රසුගිය නියමුවා කලාපය මගින් අප විමසීමට ලක්කළේ නව යහපාලන හවුල් ආණ්ඩුවේ රාජ්‍ය පෞද්ගලික සහභාගිත්ව සංවර්ධනය (PPP) - (Public + Private Partnership) පිළිබඳවයි. මෙම කලාපයේදී අප විමසා බැලීමට උත්සාහ දරන්නේ, එම ආර්ථික උපක්‍රමයේම කොටසක් ලෙස ක්‍රියාත්මක මේ දිනවල සමාජයේ මහත් ආන්දෝලනයට ලක්ව ඇති හම්බන්තොට වරාය චීනයට විකිණීම (ආණ්ඩුවට අනුව බදුදීම) පිළිබඳවයි. ආණ්ඩුව සහ ආණ්ඩුවට කත් අදින බත් බැලයන්ට අනුව නම්, විකිණීමක් හෝ බදුදීමක්වත් හම්බන්තොට වරාය සම්බන්ධයෙන් සිදුවන්නේ නැත. චීනයේ සුප්‍රසිද්ධ චයිනා මර්චන්ට් සමාගම සමග කිසිදු ගිවිසුමක් අත්සන් කරද නොමැත. නමුත් ජනතාව මේ කිසිවක් ඇසින් නොදැක වුවද මහපාරට බැස උද්ඝෝෂණයට පිවිස සිටිති. ඒ, තමන්ගේ උපන් භූමියේ අයිතිය ආණ්ඩුව විසින් පැහැර ගැනීමට එරෙහිවය. ජනතා බලවේග පාරට බැස ඉල්ලන්නේ වරාය විකිණීමට ආණ්ඩුවට ජනවරමක් නැති බවය. හම්බන්තොට වරාය විකිණීම පිටුපස සත්‍ය කථාව කුමක්ද?

මේ දක්වා හම්බන්තොට වරාය විකිණීම සම්පූර්ණ කර නැති බව ඇත්තය. නමුත් ඉන් අදහස් වන්නේ, වරාය විකිණීමක් හෝ බදු දීමක් සිදු නොවන බව නොවේ. ඒ සඳහා හොඳම සාක්ෂිය චීන රජයේ සම්පූර්ණ අයිතිය ඇති චීන වරාය වෙළඳ සමාගම (චයිනා මර්චන්ට් පෝර්ට් හෝල්ඩිංග්ස්) සමඟ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් අමාත්‍යාංයේ ලේකම්, වරාය අමාත්‍ය ලේකම් සහ උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ කටයුතු ඇමතිවරයාගේ ලේකම් අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුමයි.

### වරාය අවබෝධතා ගිවිසුම

ආණ්ඩුව හම්බන්තොට වරාය විකිණීමට ගිවිසුමක් නැතැයි කෙනෙක් මාධ්‍ය මගින් ප්‍රචාරය කිරීමට උත්සාහ කළ ද, වරාය අමාත්‍යාංශයේ ලේකම්, එල්.පී.ජයම්පති,




මුදල් අමාත්‍යාංශයේ ලේකම්, ආචාර්ය ආර්.එච්.එස්.සමරතුංග සහ ජාත්‍යන්තර වෙළඳ සහ උපායමාර්ගික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් චාන්දනී විජයවර්ධන යන අය මෙම ගිවිසුම සඳහා ශ්‍රී ලංකා පාර්ශ්වයෙන් අත්සන් තබන ලද පිරිසයි. එසේම චීන සමාගම වෙනුවෙන් එහි උප සභාපති කොන්ග් යිම් (Kong Yim) සහ විදේශ වෙළඳ අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී Peng Huang (පෙන් හුවැයින්) මෙම ගිවිසුමට අත්සන් තබා ඇත. අදාළ අවබෝධතා ගිවිසුම අත්සන් කර ඇත්තේ, 2016 දෙසැම්බර් 08 වැනිදාය. ගිවිසුම වලංගුවන කාලය අවුරුදු 99කි. (කලින් අවුරුදු 99කට පසු තවත් 99කට දීර්ඝ කිරීමේ වගන්තියක් තිබූ අතර, පාර්ලිමේන්තු කාරක සභාවකදී මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා කියා සිටියේ එම දෙවන වරට තවත් අවුරුදු 99කට දීර්ඝ කිරීමේ වගන්තිය දෙපාර්ශ්වය සාකච්ඡා කර, ඉවත් කරගත් බවයි. එයින් පැහැදිලි වන්නේ දෙපාර්ශ්වය (ශ්‍රී ලංකා රජය සහ චීනය) අවුරුදු 99කට හම්බන්තොට වරාය විකිණීමට එකඟ වී ඇති බවයි.)

හම්බන්තොට වරායේ අයිතිය බෙදී යන්නේ 80% ක් සහ 20%ක් ලෙසිනි. 80% ක කොටස් හිමිකාරිත්වය චීන සමාගමට අයිති වන ලෙසටත් 20%ක කොටස් හිමිකාරිත්වය ලංකා රජය වෙනුවෙන් වරාය අධිකාරියට හිමිවන ලෙසටත් ඒකාබද්ධ සමාගමක් (Joint-venture) ආරම්භ කිරීමට නියමිතය.

හම්බන්තොට වරාය ලෙස එම භූමිය අයිති ප්‍රදේශය අක්කර 1235 ක් වන අතර, එම ප්‍රදේශය හම්බන්තොට වරාය

> "දැනට අත්සන් කර ඇති ගිවිසුමේ (අවබෝධතා) තවත් බරපතළම කොන්දේසියක් වන්නේ, මෙම ගිවිසුමට අනුව හම්බන්තොට වරායේ සිට කිලෝමීටර් 100ක් දුරට සෘජුව හම්බන්තොට වරායට අදාළ ව්‍යාපාර කටයුතු කන්ටේනර් බහාලුම් මෙහෙයුම වෙනත් කිසිදු සමාගමකින් සිදු නොකළ යුතු බවයි. ඒ අනුව උදාහරණ ලෙස ගාල්ල වරාය වුවද මෙම ගණයට අසුවිය හැකිය."

සීමාවේ සිට වර්ග කිලෝමීටර් 05ක් පුරා පැතිරුණ භූමියකි. අදාළ අවබෝධතා ගිවිසුමට අනුව, හම්බන්තොට වරාය මිලදී ගැනීම වෙනුවෙන් චීන වරාය සමාගම විසින් උපරිමය ඩොලර් මිලියන 1120ක් ශ්‍රී ලංකා රජයට ගෙවීමට නියමිතය. එයින්, ඇතිකර ගන්නා ගිවිසුම සඳහා හොඳහිත සහ ගිවිසුම වෙනුවෙන් අභිප්‍රාය පෙන්වීම සඳහා චීන සමාගම විසින් අවබෝධතා ගිවිසුම ආරම්භයේදී ඩොලර් මිලියන 05ක ආරක්ෂිත තැන්පතුවක් තැබිය යුතුය. ඉතිරි ප්‍රමාණයෙන් 30%ක් මාස 03කින් පසුවද, ඉතිරි 60%ක් තවත් මාස 6කින් පසුවද ගෙවීමට දෙපාර්ශ්වය ගිවිසුම අනුව එකඟ වී ඇත.

ඉන් අනතුරුව එම වරාය ඒකාබද්ධ සමාගමට අදාළ නීතිමය ආරක්ෂාව සැපයීමට රජය විසින් ස්වාධීන වරාය මෙහෙයුම් අධිකාරියක් පිහිටුවීමට නියමිතය. මූල්‍ය කටයුතු, අත්පත් කර ගැනීම, ඉදිරි මෙහෙයුම් සියල්ල එම රාජ්‍ය මැදිහත්වීමෙන් සකසන අධිකාරිය විසින් ඉටුකර දෙනු ලැබේ. ඒ යටතේ හම්බන්තොට වරාය ව්‍යාපෘතියට අවශ්‍ය වන වත්කම් අත්පත් කරදීමද සිදු කරනු ඇතැයි දැනට අත්සන් කර ඇති ගිවිසුමේ සඳහන්ය.


මෙම දැනටමත් අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම සහ අවසන් ගිවිසුම අතර වෙනස කුමක්දැයි කෙනෙකුට ප්‍රශ්න කළ හැකිවේ. ආණ්ඩුවේ මෙම ගිවිසුමේ කළුභාවයට සුදු තැවරීමේ වාක්‍ය වී ඇත්තේ මෙය හුදෙක් අවබෝධතා ගිවිසුමක් පමණක් බවයි. එම අවබෝධතාවය තවදුරටත් වර්ධනය වීමෙන් එය අවසන් ගිවිසුමක් විය හැකිය. එසේම ගිවිසුමක් නොවීමටද ඉඩ තිබේ.

නමුත් ගැටලුව වන්නේ, දැනටමත් චීනය සමඟ අත්සන් කර ඇති ගිවිසුම ප්‍රකාරව බොහෝ කටයුතු සිදුවී අවසන්ව තිබීමයි. එයින් හොඳම උදාහරණය අවබෝධතා ගිවිසුමට අනුව දැනටමත් ඇමරිකන් ඩොලර් මිලියන 05ක් ලංකා ආණ්ඩුවට චීන රජයේ සමාගම විසින් ගෙවනු ලැබ තිබීමයි. එසේම, දැනට අත්සන් කර ඇති ගිවිසුමේ (අවබෝධතා) තවත් බරපතළම කොන්දේසියක් වන්නේ, මෙම ගිවිසුමට අනුව හම්බන්තොට වරායේ සිට කිලෝමීටර් 100ක් දුරට සෘජුව හම්බන්තොට වරායට අදාළ ව්‍යාපාර කටයුතු කන්ටේනර් බහාලුම් මෙහෙයුම වෙනත් කිසිදු සමාගමකින් සිදු නොකළ යුතු බවයි. ඒ අනුව උදාහරණ ලෙස ගාල්ල වරාය වුවද මෙම ගණයට අසුවිය හැකිය.

මෙම හම්බන්තොට විකිණීමේ ගිවිසුම කුමන මට්ටමින් හෝ ක්‍රියාත්මක වීමත් සමඟ බහාලුම් මෙහෙයුම් කටයුතු සියල්ල හම්බන්තොට මිලදී ගන්නා සමාගම යටතට ඉබේම පත්වේ. ඒ අනුව කන්ටේනර් ටර්මිනල් Ro-ro terminal, සාමාන්‍ය කාගෝ ටර්මිනල්, තෙත හෝ වියලි කාගෝ ටර්මිනල්, බල්ක් කාගෝ ටර්මිනල්, LNL සහ LPG ගෑස් ටර්මිනල් පවත්වාගෙන යාම පශු සම්පත් ටර්මිනල්, තෙල් ටැංකි සහ තෙල් පිරිපහදුව පවත්වාගෙන යාම, බන්කරින් පහසුකම්, ඩොක්යාර්ඩ් ආදී ක්ෂේත්‍ර බොහෝමයක් මේ මගින් ආවරණය කරනු ලබයි.

මේ සියල්ල විසින් කියාපාන්නේ, ආණ්ඩුව හම්බන්තොට වරාය සහ ඒ අවට ගොවි ජනතාවගේ ඉඩම් ශ්‍රී ලාංකේය ජනතාවගේ අවශ්‍යතාවයට සුරක්ෂිත කර තිබේ යන්න නොවේ. සියල්ල විකිණීමට ඉදිරිපත් කර තිබේය යන්නයි. ඒ, මේ වසරේ ණය වාරිකය පියවා ගැනීමටය. ඊළඟට ලබන වසරේ ණය වාරිකයට හිලව්වට ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි පද්ධතිය සහ ත්‍රිකුණාමලයේ වරාය ඉදිරිපත් කරනු ඇත. ඒ ලබන වසරටය. ඊළඟ වසරට විකුණනු ලබන්නේ කුමක් ද?

දුබල බෙලහීන ධනපති පාලකයන්ට රටත් ජනතාවත් විකිණීම, උකස් කිරීම, බදුදීම හැර වෙනත් විකල්ප නැත. එසේනම්, මේ සියලු සාක්ෂි කියාපාන්නේ ජනතාව විසින්ම සැබෑ විකල්පය සොයා ගත යුතු බවයි.



"පොදු ජනතාව තවමත් අප කෙරෙහි විශ්වාසය තබා නැත. අපට ඉවසා සිටිය හැක. ආණ්ඩුව එහි මුහුණ පෙන්වූ කල පොදු ජනතාව අපගේ පැත්ත ගන්නවා ඇත. ආණ්ඩුවේ වැනෙනසුළු ස්වභාවය නිසා ඔවුන් එයින් ඈත් වී අපගේ පැත්තට හැරී එනු ඇත. එවිට බලවේග තුලනය සැලකිල්ලට ගනිමින් අපි මෙසේ කියන්නෙමු. අපගේ කාලය පැමිණ තිබේ."

**ලෙනින්**
**තෝරාගත් කෘති, 5වැනි වෙළුම, 78-79 පිටු**

# චයිනා මර්චන්ට් කවුද?

චයිනා මර්චන්ට් සමාගම (China Merchants Group Limited) සම්පූර්ණ චීන රජයේ අයිතිය (100%) සතු සමාගමකි. එහි මූලස්ථානය හොංකොංහි පිහිටා ඇත. (වෙබ් අඩවිය www.cmhk.com/en/) මුලින්ම 1872 දෙසැම්බර් 16 දින චයිනා මර්චන්ට් ස්ටීම් නැවිගේෂන් සමාගම (China merchants steam navigation company) ලෙස පිහිටුවිය. චීනය නවීන තාක්ෂණය මූලික කරගත් ප්‍රධාන නාවුක තොටුපළක් ක්වොන්ඩොන් ප්‍රාන්තයේ හොන්ෂු නගරය මූලික කර ගොඩ නැගුවේ මෙම නාවුක සමාගම මගිනි. චයිනා මර්චන්ට් ගෝල්ඩින්ස් (ජාත්‍යන්තර) (SEHK) ලෙසත් චයිනා මර්චන්ට් ගෝල්ඩින් (පැසිෆික්) ලෙසත් (SGX) ප්‍රධාන සමූහ සමාගම් දෙකක් යටතේ අනුබද්ධ ලෙස තවත් සමාගම් 22ක් මෙම සමාගම යටතේ ඇත. මෙම සියලු උප සමාගම් චීන ආර්ථිකයේ අධිවේගී මාර්ග, සන්නිවේදන කටයුතු, ප්‍රවාහන කටයුතු, ආදී බොහෝ ක්ෂේත්‍රවල පැතිරී පවතී.

1883 තරම් අතීතයේදීත් (මෙම සමාගම ආරම්භක අවධියේදී) නැගෙනහිර ලන්ඩනය සහ සැන් ප්‍රැන්සිස්කෝ යා කරන ලෝකය පුරා විහිදෙන නාවුක මාර්ග සිතියමක් මොවුන් සතුව තිබූ අතර, එම සිතියමේදී ඉතා තීරණාත්මක මර්මස්ථානයක් ලෙස ලංකාව ලකුණු විය. වර්තමානයේදී "එක් මාර්ගයක් එක් දම්වැලක්" (One Belt - One Road) සංකල්පය යටතේ ලෝකයේ මහාද්වීප 05ක් යා කෙරෙන නාවුක මාර්ග සිතියම ඔවුන් සතුය. එම සැලසුමේ තීරණාත්මක ජයග්‍රහණයක් ලෙස කොළඹ වරායේ (චීන වරාය) එක් කන්ටේනර් බහාලුම් පර්යන්තයක සහ පෝට් සිටි (චීන නගරය) දැන් ඔවුන් සතුය. කොළඹ චීන වරාය (CICT) ඇමරිකන් ඩොලර් බිලියන 1/2ක ආයෝජනයකි.

# පෝෂණ මල්ල හා මන්දපෝෂණය



ජීවිතයේ විවිධ අවස්ථාවල පුද්ගලිකව අප දන්නා හඳුනන යම් යම් පුද්ගලයන් විසින් අපට විවිධ පොරොන්දු ලබා දී තිබිය හැක. යම් පොරොන්දුවක් ඉටු වේද නැද්ද යන්න පිළිබඳව අප නිගමනයකට එළැඹෙන්නේ පොරොන්දුව ලබා දෙන පුද්ගලයා මත අප තබා ඇති විශ්වාසය මතය. පොරොන්දුවල ස්වභාවය ගත් විට ඉතා සරල ඒවායේ සිට ඉතා බරපතළ ඒවා දක්වා එය වර්ගීකරණයද කළ හැක. පොරොන්දු ඉටු කළ විට හෝ කඩ කළ විට ඒවායේ ස්වභාවය අනුව අපට ඇතිවන ආවේගයේ මට්ටමද විවිධ විය හැක.

පුද්ගලික ජීවිතය තුළදී පමණක් නොව පොදු සමාජීය ජීවිතය තුළදීද විවිධ පොරොන්දු මත අප විශ්වාසය තැබූ අවස්ථාවන්ද විරල නැත. දේශපාලනයේදී ධනපති පංතියේ දේශපාලනඥයන්, විවිධ ධනපති ආණ්ඩු ලබාදෙන පොරොන්දු මත අප කොතෙක් නම් විශ්වාසය තබා ඇත්ද? අතීතයේ සිටම ධනපති දේශපාලනඥයන් බලයට ඒමට හෝ බලය රැක ගැනීමට විවිධ පොරොන්දු ලබා දී ඇත. සමාජයේ යම් යම් අය ඉලක්ක කර ගනිමින් ඔවුන් පොරොන්දු ලබා දෙන්නේ කෙසේ හෝ ඡන්ද ලබා ගැනීමේ අරමුණින්ය. එලෙස කාන්තාවන් ඉලක්ක කරගනිමින්ද ධනපති දේශපාලනඥයන්, ධනපති ආණ්ඩු පොරොන්දු ලබා දී ඇත. එහෙත් ලබා දී ඇති පොරොන්දු ගත් විට ඒවායින් ඉතා විශාල ප්‍රමාණයක් ඇත්තේ ඉටු නොකළ ඒවා ලෙසය.

එලෙස දුන් එක් පොරොන්දුවක් පිළිබඳව පසුගිය කාලයේ මාධ්‍යවල කතාබහට ලක්විය. ඒ ගැබිණි මව්වරුන්ට මාස 6ක් හා කිරි දෙන මව්වරුන්ට මාස 4ක් ලබාදෙන පෝෂණ මල්ල පිළිබඳවය. මාධ්‍යවලින් වාර්තා කර තිබුණේ මව්වරුන්ට සමහර මාසවලදී පෝෂණ මල්ල ලැබී නොමැති බවකි. ආණ්ඩු විසින් ලබාදෙන මෙවැනි පොරොන්දු කඩ කිරීමේදී එය වඩාත් තදින් දැනෙන්නේ ආර්ථික දුෂ්කරතා සහිත පවුල්වල මව්වරුන්ටය. එවැනි මව්වරුන්ට පෝෂණ මල්ල ප්‍රමාණවත් නොවන බව සත්‍යයකි. අපේ රටේ මව්වරුන් හා ළමුන් සැලකිය යුතු ප්‍රමාණයක් මන්දපෝෂණයෙන් හා නීරක්තියෙන් පෙළෙන බව අනාවරණය වීමෙන්ම එය වටහා ගත හැක.



කොළඹ වෛද්‍ය පර්යේෂණ ආයතනය මගින් 2012 වසරේදී කරනු ලැබූ සමීක්ෂණයක ප්‍රතිඵලවලට අනුව හෙළි වී ඇත්තේ, ලංකාවේ මිලියනකට පමණ දිනකට ආහාර වේල් තුනම ලබා ගත නොහැකි තත්වයකට පත්ව ඇති බවය. මිලියන 4 ක් (ජනගහනයෙන් 5 දෙනෙකුගෙන් 1 අයෙක්) යකඩ ඌණතාවයෙන් පෙළෙන බවය. එසේම කාන්තාවන් ලක්ෂ 8ක් (5 දෙනෙකුගෙන් එක් අයෙක්) බරින් අඩු බවත් ආසන්න වශයෙන් මිලියන 1.3ක් (4 දෙනෙකුගෙන් එක් අයෙක්) තරබාරු තත්වයේ සිටින බවත්ය.

එම වාර්තාවේ තවදුරටත් සඳහන්ව ඇත්තේ ලංකාවේ අවුරුදු 5ට අඩු දරුවන් තුන් ලක්ෂ අසූදාහක වර්ධනය හීන බවය. එසේම ළමුන් ලක්ෂ දෙකක් (එනම් ළමුන් 9 දෙනෙකුගෙන් 1 අයෙක්) උසට සරිලන බර නොමැති බවය. ලක්ෂ 4ක් (ළමුන් 5 දෙනෙකුගෙන් 1 අයෙක්) අඩු බර සහිත ළමුන් බවය. ළමුන් දෙලක්ෂ හතළිස් දාහක් ස්ථුලතාවයෙන් පෙළෙන බවය.

තවද, යුනිසෙෆ් ආයතනය මගින් ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවකට අනුව ආසියාවේ හා අප්‍රිකාවේ වයස අවුරුදු 5ට අඩු ළමයින්ගේ මරණවලින් භාගයකට ආසන්න ප්‍රමාණයකට හේතු වී ඇත්තේ මන්දපෝෂණ තත්වයයි. එය වසරකට ජීවිත මිලියන 3ක් පමණ අනවශ්‍ය ලෙස නැති වී යාමකි. මන්දපෝෂණයෙන් පෙළෙන ළමුන්ට ආසාදනයන් වැළඳුන විට ඒවා සුවවීම ප්‍රමාද වන අතර ඒ හේතුවෙන් ළමුන් මරණයට පත්වීමේ තර්ජනයකට ලක්ව ඇත. ළදරුවකුගේ ජීවිතයේ පළමු දින 1000 (පළමු වසර තුන) තුළ පෝෂණය දුර්වල වුවහොත් වර්ධනය හීන විය හැක. එය බුද්ධි වර්ධනය හා ක්‍රියාශීලිත්වය අඩු වීමට බලපෑ හැක.

මේ සියලු සමීක්ෂණ හා වාර්තාවලින් පෙන්නුම් කරන්නේ අප ජීවත්වන්නේ පෝෂණ ගැටලු සහිත සමාජයක බවය. රටේ පවත්නා ආර්ථික තත්වය අනුව මේ සමීක්ෂණ වර්තමානයේ සිදු කළහොත් මේ සංඛ්‍යාවන්හි අගය තවත් ඉහළ යනවාට සැක නැත. ඉතා කෙටි කාලයකට පමණක් ලබාදෙන පෝෂණ මල්ලෙන් අපේ රටේ කාන්තාවන්ගේ හෝ ළමුන්ගේ පෝෂණය ඉහළ නැංවිය නොහැකි වුවත් ආණ්ඩුව පොරොන්දු වූ පෝෂණ මල්ලවත් නිසි පරිදි ලබා නොදීම බරපතළය. එයින් පිළිබිඹු වන්නේ කාන්තාවන් හා ළමුන් පිළිබඳව ආණ්ඩුව දක්වන අවධානය කොතෙක්ද යන්නත් හා ආණ්ඩුවේ නොහැකියාවත්ය.

## සිව්දෙසින්

### කාන්තා අයිතීන් ඉල්ලා උද්ඝෝෂණයේ...




සමානත්ව අයිතීන් ඉල්ලා ඕස්ට්‍රේලියාවේ සිඩ්නි අගනුවර ජනවාරි 21වැනි දින විරෝධතා උද්ඝෝෂණයක් පැවැත්විණි.

තුන්දහසක පමණ සහභාගිත්වයෙන් පැවැති එම විරෝධතාවයේ කළ සංවිධායිකාවක පැවසුවේ, කාන්තාවන්ට හුදෙකලා වූ ලොවක ජීවත්වීමට අවශ්‍ය නොමැති බවය. තවදුරටත් අදහස් දක්වමින් ඇය සඳහන් කළේ, කාන්තා අයිතීන් ඉහළට නංවන ගෝලීය වැඩසටහනක් අවශ්‍යව ඇති බවය.

### ඩකාහි දික්කසාදවීම් ඉහළට...



බංග්ලාදේශයේ ඩකා අගනුවර 2015 වසරේදී දික්කසාද වීමේ ප්‍රතිශතය 72%ක් බව යුනිසෙෆ් සංවිධානය පවසයි.

වයස අවුරුදු 18දී බංග්ලාදේශයේ කාන්තාවන්ගෙන් භාගයකට අධික ප්‍රමාණයක් විවාහ වන බවත් තමා උපයන මුදලින් ජීවත්වීමේ හැකියාවක් සහිත උගත් කාන්තාවන් හිංසාකාරී විවාහයන් තුළ සිරවී ජීවත්වීම ප්‍රතික්ෂේප කිරීම මෙම දික්කසාදවලට හේතුව බවත් යුනිසෙෆ් සංවිධානය වැඩිදුරටත් සඳහන් කරයි.

## ගෙදර යන ගමන් මිය යන්න ඕනෙනම්...

(නිමිත්ත: එක්තරා සුපිරි වෙළෙඳසැලක ආරක්ෂක නිලධාරිනියක් විකිණීමට තබා තිබූ අන්නාසි කෑල්ලක් කමින් සිටීම ඒ පිළිබඳව කළමණාකරු අවවාද කිරීමේදී මිය යාම.)

හීන මනරම්
විකුණන සුපිරි සල්පිල්
ගෙදර යන ගමන්
ගොඩ වෙන්නට වටිනවද කෙතරම්

පාට ලේබල්
ගැසූ අරුමෝසම්
නෙක බඩු අතරතුර
මිනිස්කම් සැඟවුණේ කෙලෙසින්


ජීවිතය බිළිගත්
කෑව අන්නාසි රසවත්
ඒ අම්මට වුණත්
ආයුබෝවන් කියන් නැති වුන්

ජීවිතයට සුළු කොට
මව පවා අත්හළේ මෙලෙසට
බඩ වියත රැකගන්නද
කියන් මහතුනි අසරණ

රට හරිම සාරලු
කොස් කොළ වුණත් කනවලු
මැරුණු අම්මගෙ කුස තුළ
තිබුණෙ අන්නාසි විතරලු


දෑස් බැඳ ඉදගෙන
වාසි පැත්තට හුරේ අල්ලන
නොමිනිසුන් බිහිවන
මේක උත්තම දහම් දිවයින

තිරිසනෙකුට වුවත්
කන බොන විටදි කිසිවෙක්
නොකළ හිංසාවක්
රටක් වැනසුව ක්‍රමය වනසත්!



"කිසිවෙකු විසින් හෝ ආරම්භයක් ගත යුතුව තිබිණ. අප ලියූ දෑද පැවසූ දෑද විශ්වාස කරන්නෝ බොහෝ දෙනෙකු සිටිති. එහෙත් ස්වකීය අදහස් ප්‍රකාශ කිරීමෙහිලා ඔවුහු අප තරම් නිර්භය නොවන්නෝය."

සොෆී ෂෝල්



1943 පෙබරවාරි 21 වනදා හිට්ලර්ගේ කැළෑ උසාවියේදී කළ ප්‍රකාශය. පසුදින ඇයව ඝාතනය කරන ලදි. ඝාතනය කරන විට ඇයට වයස අවුරුදු 21ක් විය.

දැනුම සමාජය හා චින්තනය 13

# හැකියාව හා තාත්විකත්වය

අප කථාකරමින් සිටින්නේ අප අවටවන සියලු දේ නිවැරදිව තේරුම් ගැනීමේදී, ප්‍රකෘතිය නිවැරදිව වටහා ගැනීමේදී ඒ වෙත ප්‍රවේශ විය යුතු අධ්‍යයන මාවත් පිළිබඳවය. එවැනි තවත් එක් මාර්ගයක් හෙවත් ප්‍රකෘතිය තේරුම් ගැනීමේ පොදු ආකාරයන්ගෙන් එකක් වන්නේ හැකියාව හා තාත්විකත්වයය.

අප අවට වන සොබාදහම තුළ, අප ජීවත්වන සමාජය තුළ, අප තුළ යම් යම් දේ නිර්මාණය කිරීමේ, බිහිකිරීමේ හැකියාව තිබේ. උදාහරණ ලෙස එලයක් බිහිකිරීමේ හැකියාව මලකට තිබේ. දරුවෙක් බිහිකිරීමේ හැකියාව ලිංගිකව පරිණතවූ කාන්තාවකට තිබේ. එසේම පැළයක් බිහිකිරීමේ හැකියාව බීජයකට තිබේ. අප "හැකියාව" ලෙස හඳුනා ගන්නේ එයයි. එම හැකියාව මගින් එලයක්, දරුවෙක් හා පැලයක් බිහිවීම "තාත්විකත්වය" ලෙස හැඳින්වේ.



"අපි යථාර්ථය ගැන බලන්නෙමු නම්, දීර්ඝ පසුබැසීම්, වැරදීම් හා ආපසුයාම් මාලාවකට මුහුණ නොදී ඉතිහාසයේ කිකලක හෝ නව නිෂ්පාදන ක්‍රමයක් තහවුරු වී තිබේද? ප්‍රවේණිදාස ක්‍රමය අහෝසි කිරීමෙන් අර්ධ ශතවර්ෂයකට පසුව රුසියාවේ ප්‍රවේණිදාස ක්‍රමයේ නෂ්ටාවශේෂයන් රැසක් තවමත් තිබිණි. ඇමරිකාවේ වහල් ක්‍රමය අවලංගු කිරීමෙන් අර්ධ ශතවර්ෂයකට පසුවද, එහි නීග්‍රෝවරුන්ගේ තත්වය බොහෝ විට තවමත් අර්ධ වහල් ස්වභාවයක් ගත්තේය."

**ලෙනින්**
**තෝරා ගත් කෘති,**
**9වැනි වෙළුම,**
**224 පිටුව**

## හැකියාව යථාර්ථයක් වීමට නම්


යම් වස්තුවක් තුළ පවතින ගුණයන් විසින් තවත් දෙයක් බිහිකිරීම සඳහා ඒ තුළ වන ශක්තියට අප හැකියාව යයි කියමු. එහෙත් මෙහිදී හැකියාව තිබූ පමණින් එය තාත්විකත්වයක් බවට පත්වන්නේ නැත. එයට තවත් සාධක ගණනාවක් සැපිරිය යුතුව තිබේ. දරුවෙක් ලැබීමට කාන්තාවක් සතුව තිබෙන හැකියාව තාත්විකත්වයක් වන්නේ ඇය පුරුෂයෙකු සමග එක්වන්නේ නම් පමණි. පැළයක් බිහිකිරීමට බීජයකට ඇති හැකියාව යථාර්ථයක් වන්නේද එය සරු පසක රෝපණය කරන්නේ නම් පමණි. ඉන් කියවෙන්නේ කුමක්ද? ප්‍රපංච තුළ විවිධ දේ බිහිකිරීමේ හැකියාව තිබූ පමණින් ඒවා තාත්විකත්වයක් නොවන බවත් ඒ සඳහා තවත් සාධක ගණනාවක් සැපිරිය යුතු බවත්ය.

මෙය සමාජයට සම්බන්ධකර බලන විටද තේරුම් ගත හැකිය. වර්තමානයේ අප ජීවත්වන්නේ ධනවාදී සමාජයක් තුළය. මෙය ඉතාම අසාධාරණ සමාජයකි. මෙය වෙනස්කොට මීට වඩා යහපත්, සාධාරණ සමාජවාදී සමාජයක් බිහිකර ගැනීමට අපට අවශ්‍ය වී තිබේ. ඒ සඳහා හැකියාව තිබේද? සැබැවින්ම නව සමාජයක් බිහිකිරීමේ හැකියාව ධනවාදී සමාජය තුළ තිබේ. එහෙත් ඒ හැකියාව තිබූ පමණින් නව සමාජයක් බිහිවන්නේ නැත. ඊට තවත් සාධක සැපිරිය යුතුය. එනම් ඒ සඳහා අවස්ථාව එළඹිය යුතුය. ඊට ජනතාව සවිඥානිකව මැදිහත්විය යුතුය. ඒ සඳහා නායකත්වය ගැනීමට නිවැරදි හා ශක්තිමත් දේශපාලන ව්‍යාපාරයක් තිබිය යුතුය. එකී සාධක සියල්ල සම්පූර්ණ වන්නේ නම් නව සමාජයක් බිහිකිරීමේ හැකියාව ධනවාදී සමාජය තුළ තිබේ. දුරෙයි ෂන්මුගම් නම් ඉන්දියානු විප්ලවාදී කවියා මෙය සිය කවියක කවි පදයකින් සටහන් කර තිබුණේ මෙසේය.

"අහස පමණක් මදවේ
වැසි වැටෙන්නට නම්...
පොළොව මත ක්‍රියාවලියක් ඇත..."

## හැකියාව හා නොහැකියාව

යමක් බිහිකිරීම සඳහා යම් වස්තුවක්, පුද්ගලයෙක් හෝ සමාජයක් තුළ තිබෙන හැකියාව තාත්විකත්වයක් බවට පත් නොවුණහොත් සිදුවන්නේ කුමක්ද? මෙය තරමක් සංකීර්ණ ප්‍රශ්නයකි. අපද ඇතුළත් ප්‍රකෘතිය තුළ, අපේ සමාජය තුළ ඇති සමහර ප්‍රපංච හෝ වස්තු තුළ පවතින මෙම හැකියාව නියමිත කලකදී අදාළ සාධක සපිරි තාත්විකත්වයක් බවට පත් නොවුණහොත් පසුව එය නොහැකියාවක් බවට පත් වන්නේය. මෙය ඉහත උදාහරණවලින්ම වටහාගත හැක. එලයක් බිහිකිරීමට මලකට ඇති හැකියාව තාත්විකත්වයක් වන්නේ එම මල පරාගණය වුවහොත් පමණි. එසේ නොවුව හොත් නිශ්චිත කලකට පසු එම හැකියාව නොහැකියාවක්වී මල පරවී යයි. දරුවෙක් බිහිකිරීමට කාන්තාවක් සතු හැකියාව ද එසේය. නියමිත වයස් කාලය තුළ ඇය පිරිමියෙකු සමග සම්බන්ධ නොවුන හොත් ඇය තුළ පැවැති දරුවන් හැදීමේ හැකියාව නොහැකියාවක් වේ.



> සැබැවින්ම නව සමාජයක් බිහිකිරීමේ හැකියාව ධනවාදී සමාජය තුළ තිබේ. එහෙත් ඒ හැකියාව තිබූ පමණින් නව සමාජයක් බිහිවන්නේ නැත. ඊට තවත් සාධක සැපිරිය යුතුය. එනම් ඒ සඳහා අවස්ථාව එළඹිය යුතුය. ඊට ජනතාව සවිඥානිකව මැදිහත්විය යුතුය.

මෙය තවත් උදාහරණවලින්ද තේරුම් ගත හැක. නිශ්චිත ඖෂධයකට නිශ්චිත රෝගයක් සුවකිරීමේ හැකියාව තිබේ. එම හැකියාව තාත්විකත්වයක් වන්නේ එම ඖෂධය නියමිත වෙලාවට නියමිත මාත්‍රාවෙන් නියමිත කාලයක් පාවිච්චි කළහොත්ය. ඕනෑම ඖෂධයක් කල් ඉකුත්වන කාල සීමාවක් පවතින අතර කල් ඉකුත්වීමත් සමග රෝග සුව කිරීම සඳහා එය සතුව තිබූ හැකියාව අහෝසිවී නොහැකියාවක් බවට පත්වේ. මේ අනුව බොහෝ වස්තු හා ප්‍රපංච තුළ වන හැකියාව අදාළ සාධක සම්පූර්ණවී තාත්විකත්වයක් බවට අදාළ කාල වකවානු තුළ පත් නොවුණ හොත් එය නොහැකියාවක් බවට පත්වේ. ඒ නිසා එවැනි වස්තු හඳුනාගෙන ඉන් ලබාගත යුතු එල ලබාගැනීමට නම් ඒවා නොහැකියාවක් බවට පත්වීමට පෙර ඉන් එල ලබා ගැනීම කළ යුතුවේ.

## අහෝසි නොවන හැකියාවන්

යම් වස්තුවක් හෝ සමාජය සතුව ඇති යමක් බිහිකිරීමේ හැකියාව පසු කලෙක නොහැකියාවක් වීම හැම ප්‍රපංචයකටම පොදු වන්නේ නැත. සමහර සමාජමය ප්‍රපංචවලදී එම හැකියාව යථාර්ථයක් වනතුරු දිගටම පවතී. සමාජවාදී සමාජයක් බිහිකිරීම සඳහා ධනවාදය තුළ ඇති හැකියාව එවැන්නකි. එය කිසිවිට නොහැකියාවක් වන්නේ නැත. එබැවින් අදාළ සාධක පෙළ ගැසුණු ඕනෑම මොහොතක තාත්විකත්වයක් බවට පත් වීමට ඉඩ තබාගෙන එම හැකියාව ධනවාදය පවතින තුරු ඒ තුළ පවතී.

අප මෙම කරුණු වටහා ගත යුත්තේ ඇයි? මානව සමාජයේ සංවර්ධනයේදී අප අවට දේවල් සිදුවන මෙම යාන්ත්‍රණය හෙවත් මෙම ආකාරය වටහා ගත්විට අපට සවිඥානිකව මැදිහත්වී හොඳ එල ලබාගැනීමට මෙන්ම නරක එල බිහිවීම වැළක්වීමටද පුළුවන. දැනටත් අපේ ජීවිතයේ බොහෝ කටයුතුවලදී අප මෙය න්‍යායක් ලෙස නොදැන වුවත් භාවිතාවට නගමින් සිටී. කෘෂිකර්මාන්තයේදී වැඩි එලදාවක් ලබා ගැනීම සඳහා මල් කෘත්‍රිම ලෙස පරාගණය කිරීම ඊට නිදසුනකි. සාමාන්‍යයෙන් මල්වලින් එල හට ගැනීමට එම මල් පරාගණය විය යුතුය. ස්වාභාවිකව එය සිදුවන්නේ කෘමීන්ගෙනි. එහෙත් කෘමීන් වඳවීමත් වගාවකදී විශාල මල් ප්‍රමාණයක් පරාගණය කළ යුතු වීමත් නිසා දැන් ගොවියා මැදිහත්වී පරාගණය කිරීමේ කාර්ය තමන් විසින් ඉටුකොට එලදාව වැඩිකර ගනී. ඒ ඉහත සත්‍යයට අනුවය. හොඳ වර්ගයෙ සතුන් බිහිකර ගැනීම සඳහා සිදු කරන කෘත්‍රිම සිංචනයද ඊට උදාහරණයකි.

මෙය අනෙක් පැත්තටද ගත හැක. වළ දමා තිබෙන බිම් බෝම්බයක් මත යමක් ගැටුන හොත් එය පුපුරා යාමේ හැකියාව තිබේ. එසේ පුපුරා යාම අනතුරුදායකය. එවිට මිනිසා සවිඥානිකව මැදිහත්වී බිම් බෝම්බය තුළ වන පුපුරායාමේ හැකියාව අහෝසි කිරීමට එය නිෂ්ක්‍රීය කරනු ලැබේ. ජලය පිරුණු භාජන තැන තැන තිබීම ඩෙංගු මදුරුවා බිහිවීමට හේතුවේ. ඩෙංගු මදුරුවා තුළ පැටවුන් බෝකිරීමේ හැකියාව අහෝසි කිරීමට අප කළ යුත්තේ මදුරු පැටව් බිහිකිරීමට අවශ්‍ය අනෙක් සාධක ඉවත් කිරීමය. වතුර පිරුණු භාජන එළිමහනේ නොතබන ලෙස පවසන්නේ ඒ අනුවය.

මෙම කරුණුවලින් අපට පැහැදිලි වන්නේ අප අවට සමාජයත්, වටපිටාවත්, එහි සිදුවන දේවලුත් තේරුම් ගැනීමේදී හැකියාව හා තාත්විකත්වය නැමැති ප්‍රකෘතිය තේරුම් ගැනීමේ පොදු ආකාරය වටහා ගැනීමද වැදගත් වන බවය. එය වටහා ගත් විට තමන්ට අවශ්‍ය එල ලබා ගැනීමටත් අනවශ්‍ය එල බිහිවීම වැළැක්වීමටත් සවිඥානිකව මැදිහත් වීමට මිනිසාට හැකිවේ. එසේම අප අවට සිදුවන දේවල් පිළිබඳ මිත්‍යාවන්ගෙන් මිදීමටත් මිත්‍යා විශ්වාස පසුපස හඹායාමෙන් වැළකී සිටීමටත් මිනිසාට පුළුවන.

එසේම සමාජය වෙනස් කිරීමේදී ඒ සඳහා වන හැකියාව ධනවාදය තුළම පවතින නිසා විශ්වාසයෙන් යුතුව ඊට මැදිහත් වීමට ද පුළුවන. ප්‍රකෘතිය තේරුම් ගැනීමේ පොදු ආකාර සියල්ල විමසා බැලූ අපි තවදුරටත් මේ පිළිබඳව කථා කිරීමට නැවත හමුවෙමු.

# ජීවත්වීමේ අයිතිය විනාශ කරන උමා ඔය බහු විනාශකාරී ව්‍යාපෘතිය

මෙම පවතින සමාජ ආර්ථික ක්‍රමයෙන් පීඩාවට පත්වන්නේ ජනතාව පමණක් නොව පරිසරයත් පීඩාවට පත්වේ. ධනේශ්වර රටවල් අධ්‍යයනය කරන විට මේ තත්වය වඩාත් හොඳින් දැකිය හැක. අද ලෝකයේ ප්‍රබල ප්‍රශ්නයක් බවට පරිසර විනාශය පත්වී ඇත. පරිසර විනාශය හුදු පාරිසරික කරුණක් ලෙස පමණක් නොගතයුතු වන්නේ එමගින් ඕනෑම රටක ජනතාව සහ අනෙකුත් සත්වයන්ද ප්‍රබල ලෙස පීඩාවට පත්වන බැවිනි. අපේ රටේ ද එවැනි විනාශකාරී ක්‍රියාමාර්ගයන් රාශියක් ඇත මෙන්ම මෑත කාලයේද පාලකයන් විසින් ආරම්භ කරන ලදී. මෑත කාලීනව පරිසර හානිගෙන දෙන ආර්ථික හා සමාජ හානි ගෙන දෙන ව්‍යාපෘතියක් ලෙස මධ්‍යම කඳුකරයේ සිදුකෙරෙමින් පවතින උමාඔය බහුකාර්ය ව්‍යාපාතිය හඳුනාගත හැක. මෙම ව්‍යාපෘතිය 2008 අප්‍රේල් 29 එවකට ජනාධිපතිවරයා වුණු මහින්ද රාජපක්ෂ පාලන සමයේ ආරම්භ විය. මෙය නීති විරෝධි බව පරිසර සංවිධාන රාශියක් ඒ මොහොතේදීම පෙන්වා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා මුල්ගල තබන ලද්දේ, 1980 අංක 49 දරන පාරිසරික පනතට අනුව මෙවැනි ව්‍යාපෘතියක් ආරම්භයට ප්‍රථම ලබාගත යුතු පාරිසරික ඇගයීම් වාර්තාව අනුමත නොකර අඩුම වශයෙන් එම වාර්තාව සකස් කිරීම සඳහා ආරම්භක පියවරවත් අනුගමනය නොකරය. ඒ මොහොතේ සිටම එහි හානිකර තත්වය ජනතාවට ඒත්තු ගැන්වීමට දේශපාලන පක්ෂයක් ලෙස ජනතා විමුක්ති පෙරමුණත් වෙනත් පාරිසරික හා සිවිල් සංවිධාන කිහිපයකුත් කටයුතු කළේය. ගොඩනැගුණු ජනතා විරෝධය හමුවේ රාජපක්ෂ ආණ්ඩුව පාරිසරික ඇගයීම් වාර්තාවක් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කළ අතර ඔවුන් විසින් 2011 අප්‍රේල් 12 පාරිසරික වාර්තාව එළිදක්වන විට ව්‍යාපෘතියේ වැඩ වසර 03ක් තිස්සේ ක්‍රියාත්මක වෙමින් තිබුණි. වාර්තාව 80% ක්ම අසත්‍ය කරුණු මත සකස්කර තිබීම නිසා එම වාර්තාවට දැඩි විරෝධයක් ගොඩනැගුණු අතර රාජපක්ෂ ආණ්ඩුව ජනතා විරෝධය නොසලකා තීරණය කරනු ලැබුවේ ව්‍යාපෘතිය වැඩ නිමා කිරීම සඳහා ඉදිරියට කරගෙන යාමටය.

## විනාශයේ දිග පළල

උමා ඔය ව්‍යාපෘතිය මගින් සිදුවන හානිය අති විශාල බව මේ වන විට තහවුරු වෙමින් තිබේ. වැල්ලවාය, ඇල්ල, බණ්ඩාරවෙල, හාලිඇළ, වැලිමඩ, ඌවපරණගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 06 තුළින් මේ මහා විනාශය හඳුනා ගත හැකිය. ව්‍යාපෘතිය බහුකාර්ය ලෙස නම්කර තිබුණත් එහි සැබැව නම් එය බහු විනාශකාරී ව්‍යාපෘතියක් වන බවය. මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුමේ නිවාස 4120ක් මේ වන විට පුපුරා, ඉරිතලා විනාශයට



ගොදුරු වී ඇත. නිවාස 1500ක් මේ වන විට සම්පූර්ණයෙන්ම විනාශ වී අවසන්ය. එම ජනතාව අවතැන්භාවයට පත්ව සිටියි. එම නිවාස අතර පාසල් පන්සල්, පල්ලි, වැනි ආගමික මධ්‍යස්ථාන රාශියක් තිබේ. මකුල්ලෙල්ල පාසලේ ගොඩනැගිලි සියල්ල විනාශ වී අවසන්ය. පාසලේ ගොඩනැගිලි භාවිතයට නුසුදුසු බව ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මේ වන විට තීරණය කර අවසන්ය. බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයත් එහි කණිෂ්ඨ අංශයත්, අධිකාරම් විද්‍යාලයත් මේ වන විට පුපුරා විනාශයට ගොදුරු වෙමින් තිබේ. මකුල්ඇල්ල පන්සල, එගොඩගම පන්සල, හීල්ඔය පන්සල, කුරුඳුගොඩ පන්සල වගේම දික්තරාව මෙහෙණි ආරාමයත්, පල්ලේසේරුව මුස්ලිම් පල්ලියත් දැඩි ලෙස විනාශයට ගොදුරු වී අවසන්ය. බණ්ඩාරවෙල නගරයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථාන 35ක් මෙම ව්‍යාපෘතිය නිසා මේ වන විටද විනාශයට පත්වී අවසන්ය.

නිවාස විනාශයට අමතරව මෙමගින් මතුකරන ප්‍රධානම ගැටලුව වන්නේ ජල උල්පත් සිඳී යාමයි. මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුමේ ළිං, පොකුණු, වැව්, දිය උල්පත් රාශියක් මේ වන විට විනාශයට පත්වී තිබේ. ජලය නොමැති වීම නිසා මේ ප්‍රදේශවල ජනතාව දැඩි අපහසුතාවයන් රාශියකට මුහුණ පා ඇති අතර 2014.12.26 ප්‍රධාන උමගේ දිය කාන්දුව ආරම්භ වීමත් සමගම මෙම හානිය තීව්‍ර වීමට පටන්ගෙන ඇත. පොළවෙන් ලබාගත් ජලය තමන්ට අභිමත ආකාරයට පාවිච්චි කරමින් සිටි මේ ජනතාවට දැන් ආණ්ඩුවේ බවුසර්වලින් මසකට දවස් දෙකක් පමණක් ලැබෙන වතුර ලීටර් 500කින් තම අවශ්‍යතාවන් සම්පූර්ණ කරගැනීමට සිදුවී තිබීම මෙම විනාශයේ තරම තේරුම් ගැනීමට ප්‍රබල සාධකයකි.

පානීය ජල ප්‍රශ්නය සේම වගා සඳහා ජල ප්‍රශ්නයද උමා ඔය බහුකාර්ය වෘපෘතිය නිසා උග්‍ර වී තිබේ. විශේෂයෙන් එළවළු වගාව බහුලව පවතින මේ ප්‍රදේශයේ ගොවි ජනතාව උග්‍ර ජල හිඟයකට මුහුණ පා තිබෙන අතර කැරට්, ගෝවා, තක්කාලි, බටු, බෝංචි වැනි එළවළු වගාව බහුලව සිදුකළ ඉඩම් මේ වන විට පුරන් ඉඩම් බවට පත්වී අවසන්ය. එළවළු වගාවට අමතරව මේ ප්‍රදේශය කේන්ද්‍ර කරගෙන සිදුකරන තේ වගාවටද ජල උල්පත් සිඳීයාම විසින් හානි ගෙනදී ඇත. විශේෂයෙන් මෙම උමාඔය ව්‍යාපෘතිය හේතුවෙන් එම ප්‍රදේශයේ ජනතාවගේ ජීවනෝපායන් සියල්ල පාහේ අහිමි වී ගොස්ය.

අපේ රටේ හදවත බඳු මධ්‍යම කඳුකරය රටම පෝෂණය කරන කඳු, දිය සීරා, දිය උල්පත් බහුල බව විද්වතුන්ගේ මතයයි. බොහෝ ජල මූලාශ්‍රවල ආරම්භය සනිටුහන් වන්නේ මධ්‍යම කඳුකරයෙනි. එම නිසාම මධ්‍යම කඳුකරයට සිදුවන ඕනෑම බලපෑමක් මුළු රටටම ව්‍යාප්ත වනු වැළැක්විය නොහැකිය. අවිධිමත් සංවර්ධනය මගින් පරිසරයට සිදුකරන හානිය ඉතා විශාල බව මේ වන විට තහවුරු වී ඇත. මෙතෙක් අප රට පාලනය කළ සෑම පාලක කණ්ඩායමක්ම මේ මහා විනාශයට වගකිව යුතුව ඇත. පරිසරයට හානි සිදුවන විට පෙරළා එකී පරිසරය විසින් ජනතාවට හානි ගෙනදීම වටහා ගත හැකි විද්‍යාත්මක සත්‍යයකි. 2014.01.26 බදුල්ල දිස්ත්‍රික්කයේ මීරියබැද්ද නායයාම මෙ සමීකරණය වටහා ගැනීමට ප්‍රබල සාධකයකි. මේ වන විට ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මගින් බදුල්ල දිස්ත්‍රික්කය පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර තිබෙන අතර බදුල්ල දිස්ත්‍රික්කයේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 66.9% ක් නායයාමේ අවදානමකට ලක්වී තිබෙන බව ඔවුන්ගේ නිගමනයයි. උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතිය මෙම විනාශයට ප්‍රබල සාධකයක් බව පැහැදිලිය. අනෙක් පැත්තෙන් ජනතාවගේ ජීවිත අහිමි කරමින්, සංවර්ධනයට මුවා වී ක්‍රියාත්මක කරන විනාශකාරී ව්‍යාපෘති මගින් රටේ ජනතාව ණයකාරයන් බවට පත්කිරීමද වැළැක්විය නොහැක. මෙම ව්‍යාපෘතිය සඳහා ඉරාන සංවර්ධන බැංකුවේ රු. කෝටි. 7632ක් රාජපක්ෂ ආණ්ඩුව විසින් ලබාගෙන තිබේ. මෙවැනි ණය ගනුදෙනු මගින් සිදුකරන මහා පරිමාණ කොමිස් මුදල්වලට යටවී ජනතාවගේ ජීවිත තඹ සතයකට මායිම් නොකරමින් මහා විනාශකාරී ව්‍යාපෘති ආරම්භ කිරීම අපේ රටේ සුලභව දැකිය හැකි වූ අතර පසුගිය රාජපක්ෂ පාලන සමයේ එය වඩාත් එළිපිට සිදුවිය.

> ,, දැනට මෙම ව්‍යාපෘතිය මගින් සිදුවී තිබෙන හඳුනාගෙන ඇති හානියට වඩා විශාල හානියක් ඉදිරියේ දී නිශ්චිතවම සිදුවනු ඇත. ඒ පිළිබඳව ප්‍රධාන කරුණු දෙකක් යටතේ විද්වත්හු කරුණු සඳහන් කරති. එකක් මෙම ව්‍යාපෘතියක් සමග මේ ප්‍රදේශයේ ප්‍රබල භූමි කම්පන ඇතිවීමේ අවදානමක් පැවතීමයි. අනෙක මෙම ව්‍යාපෘතිය මගින් සිදුව ඇති භූ පැලීම් නිසා ප්‍රබල නායයාම්වලට ලක්වීමේ අවදානමයි.

මෙම ව්‍යාපෘතියට අදාළව ඉදිකරන ප්‍රධාන උමගේ දිග කිලෝමීටර් 15.2කි. ඇල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කරඳමුල ප්‍රදේශයෙන් ආරම්භ වන මෙම උමඟ වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් පොලව මතුපිටට පැමිණීම සිදුවෙනවා. මෙම උමං මාර්ගය නිසා පොළොව පැලීම් මෙන්ම කිඳා බැසීම්ද පානීය ජලය සඳහා යොදා ගන්නා ළිං සිඳී යාමද උග්‍ර වෙමින් පවතිනවා. මේ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයන් සිදුකර ඇති ආචාර්යවරුන් හා මහාචාර්යවරුන් බොහෝමයක් සඳහන් කර ඇත්තේ මෙම ප්‍රදේශය මෙවැනි උමං තැනීම සඳහා නුසුදුසු බවයි. මෙම ව්‍යාපෘතිය සඳහා නිල කොන්ත්‍රාත්කරු ලෙස ඉරානයේ 'කරාබ්' නම් සමාගම අයිතිය ලබාගෙන ඇතත් ඔවුන්ගේ එකඟතාවය වී ඇත්තේ ශ්‍රී ලංකා රජයට බදු ගෙවීමකින් තොරව තමන්ට අභිමත ආකාරයට මෙම කොන්ත්‍රාත් කාර්යය සිදු කරන බවයි. මෙම  කරාබ් නැමැති සමාගම ලෝකයේ හොඳම තාක්ෂණය යොදා ගන්නා කොන්ත්‍රාත් සමාගම්වලට අයත් නොවන එකකි. එම නිසාම මෙවැනි ව්‍යාපාතියකින් සිදුවිය හැකි හානිය වැඩිවනු ඇත.

## මිත්‍යාව ව්‍යාප්ත කිරීම

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කරුණු දක්වන ආණ්ඩුවේ බලධාරීන් සඳහන් කරන්නේ, මේ මගින් හම්බන්තොට වැල්ලවාය, තණමල්විල යන ප්‍රදේශවලට ජලය සැපයීම සිදුකරන බවය. නමුත් සත්‍ය තත්වය නම් උමා ඔයෙන් දකුණට හැරවීමට තරම් ජල ධාරිතාවක් නොමැති වීමය. ඒ අනුව දකුණේ ජල අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා උමා ඔය යොදා ගැනීම මිත්‍යාවකි. උමා ඔයේ වපසරිය ව.කි.මී. 720කි. එය කුඹුරු අක්කර 28,000ක වගා කටයුතු සඳහා යොදා ගනු ලැබේ. ඊට අමතරව කිරි නිෂ්පාදනය සඳහාද මෙම ප්‍රදේශය ප්‍රබල කාර්යයක් සිදුකරනු ලබයි. 'කිරි නිම්නය' ලෙස මෙම ප්‍රදේශය හඳුන්වනු ලබන්නේ එබැවිනි. එළවළු නිෂ්පාදනයේ විශාල පංගුවක් මෙම ප්‍රදේශයේ සිදු කරනු ලබයි. විශේෂයෙන් අර්තාපල් නිෂ්පාදනයෙන් 77%ක් නිපදවන්නේ උමා ඔය ප්‍රදේශය පදනම් කරගනිමිනි. උමාඔය නිම්නය තුළ මහා වාරිමාර්ග 06ක් සහ මධ්‍ය පරිමාණ වාරිමාර්ග 16ක් ව්‍යාප්ත වී ඇත.

උමා ඔය රන්ටැඹේ ජලාශයත් මහවැලි 'සී' කලාප සහ 'බී' කලාපත් පෝෂණය කිරීමට ප්‍රබල දායකත්වයක් සපයයි. විශේෂයෙන් ගිරාඳුරුකෝට්ටේ, දෙහිඅත්තකණ්ඩිය, දිඹුලාගල හරහා මඩකලපුව දක්වාම කුඹුරු අක්කර දහස් ගණනක් පෝෂණය කරනවා පමණක් නොව එමගින් ජනතාවගේ ජීවිත ලක්ෂ ගණනන් නගා සිටිවීමටද දායකත්වය සපයයි. එසේම මිනිපේ මෝය යාය හසලක වැනි ප්‍රදේශත් උමා ඔය නිසා පෝෂණයට ලක්වේ. මහවැලි මහ සැලැස්ම සම්පූර්ණ කරන අවස්ථාවේ උමා ඔයෙන් ජලය කියුබික් ලීටර් මිලියන 45ක ජල ප්‍රමාණයක් මෙම ප්‍රදේශ පෝෂණය කිරීමට ලබාගත හැකි බව සඳහන් කර තිබිණි. නමුත් මේ සියල්ල උමා ඔය ව්‍යාපෘතිය මගින් සිදුකරන මහා විනාශය හේතුවෙන් ජනතාවට අහිමිවනු ඇත.

## විනාශයේ වගඋත්තරකරුවෝ

රාජපක්ෂ පාලන සමයේ ආරම්භ වූ මෙම උමාඔය විනාශකාරී ව්‍යාපෘති පිළිබඳව ගොඩනැගුනු ජනතා විරෝධය රාජපක්ෂ පාලනය නිමා කිරීමටද ප්‍රබල සාධකයක් වූ බව පැහැදිලිය. අලුතින් පාලනයට පත්වූ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා සමග 2015 මාර්තු මාසෙයේදී මෙහි විනාශකාරී තත්වය පිළිබඳව ප්‍රදේශයේ ජනතාව විසින් විශේෂ සාකච්ඡාවක්ද සිදුකරන ලදී. එහිදී ඔහුගේ එකඟතාව වූයේ කැබිනට් අනුකමිටුවක් පතිකර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමෙන් පසු මේ සම්බන්ධයෙන් තීරණයක් ගන්නා බවය. රවී කරුණානායක, හරීන් ප්‍රනාන්දු, ඩිලාන් පෙරේරා, නිමල් සිරිපාල, රංජිත් මද්දුම බණ්ඩාර, විජිතමුණි සොයිසා, චම්පික රණවක අයගෙන් සැදුම්ලත් කැබිනට් අනු කමිටුව ජනාධිපතිවරයා විසින් පත්කරන ලද අතර ඔවුන් එම ප්‍රදේශයේ ජනතාව සමග හෝ මෙම බහුකාර්ය විනාශයට එරෙහිව කරුණු දක්වමින් සිටි සංවිධාන සමග හෝ කිසිදු සාකච්ඡාවක් සිදු නොකොට අඩුම තරමේ එම ප්‍රදේශයට ගොස් ඒ පිළිබදව කරුණු විමර්ශනයට ලක්නොකර තීන්දු කරන ලද්දේ මෙම ව්‍යාපෘතිය දිගටම සිදු කළ යුතු බවය. දැනට මෙම ව්‍යාපෘතිය මගින් සිදුවී තිබෙන හඳුනාගෙන ඇති හානියට වඩා විශාල හානියක් ඉදිරියේ දී නිශ්චිතවම සිදුවනු ඇත. ඒ පිළිබඳව ප්‍රධාන කරුණු දෙකක් යටතේ විද්වත්හු කරුණු සඳහන් කරති. එකක් මෙම ව්‍යාපෘතියක් සමග මේ ප්‍රදේශයේ ප්‍රබල භූමි කම්පන ඇතිවීමේ අවදානමක් පැවතීමයි. අනෙක මෙම ව්‍යාපෘතිය මගින් සිදුව ඇති භූ පැලීම් නිසා ප්‍රබල නායයාම්වලට

15වැනි පිටුවට

පසුගිය 22වැනි දින මහරගමදී පැවති දිරිය පුරවැසි සමිති නියෝජිත සමුළුවේදී ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා විසින් සිදු කරන ලද කතාව කාලීන වැදගත්කම සලකා මෙහි ඇතුළත් කිරීමට නියමුවා තීරණය කළේය. මේ එහි සංක්ෂිප්ත ලිඛිත සටහනකි.

# යටත්වැසියන් වෙනුවට පුරවැසියන් බිහි කිරීම අපේ අරමුණයි

ජ.වි.පෙ. නායක
අනුර දිසානායක සහෝදරයා

අපේ රටේ ඉතිහාසය පුරාවටම පුරවැසියන් වෙනුවට යටත්වැසියන් හා පාලකයන් සිටියා. යටත්විජිත යුගයේත් ඉන් පස්සේ අවුරුදු 68 පුරාත් තත්වය ඒකයි. අපි මේ දිරිය පුරවැසි සමුළුව කැඳවා තිබෙන්නේ යටත්වැසියන් වෙනුවට දිරිය පුරවැසියන් බිහි කරන්නයි. මේ පාලකයන්ට හැකියාව තිබෙන්නේ වහලුන් වැනි මිනිසුන් බිහිකිරීමට පමණයි. එවැනි පාලනයන් ඉදිරියට යන්නේ නැහැ. පාලනයට හා රට ගොඩනැගීමට සම්බන්ධ වන පුරවැසියන්ගෙන් සමන්විත රටක් බිහි කළ යුතුයි. පාලකයන් කළ වැරදිවලට ජනතාව වගකිව යුතු නැහැ. රට ණය කන්දක ගිලීමටත්, වංචාවන්ට හා දූෂණයන්ටත්, ආර්ථික අර්බුදයටත් ජනතාව වගකිව යුතු නැහැ. අපේ දුවා දරුවන් මත මේ ප්‍රශ්න පැටවිය යුතු නැහැ. ඒ බව තීරණය කළ යුතු සංධිස්ථානයකට අප පැමිණ තිබෙනවා.

ජනතාවට තමන්ගේ ප්‍රශ්න කිසිවකට විසඳුම් ලබාගත නොහැකි පාලනයක් අප තවත් කොපමණ කාලයක් ඉදිරියට ගෙන යා යුතුද? අද රජයේ කාර්යාලයකට ගියොත් ජනතාවට විසඳුම් ලබා ගන්න පුළුවන්ද? ජනගහනයෙන් 14 දෙනෙකුට එක් රජයේ සේවකයෙක් බැගින් ඉන්නවා. රජයේ සේවකයන්ට වැටුප් ලෙස කෝටි 44,000කට වැඩි මුදලක් ගෙවනවා. එහෙත් ජනතාවට තමන්ගේ ප්‍රශ්නවලට විසඳුම් ලබාගන්න දේශපාලනයට යටවුණු මේ රාජ්‍ය සේවය අසමත්. මාරුවීම, උසස්වීම, දේශපාලනය අනුව තීරණයවීම නිසා මේ රාජ්‍ය සේවය අද ජනතාවට බරක් වූ බරවා කකුලක් බවට පත්වී තිබෙනවා. ඒ වෙනුවට ජනතාවට කාර්යක්ෂම පරිපාලනයක් අවශ්‍ය වී තිබෙනවා.

නීතිය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආයතන ගණනාවක් තිබෙනවා. ශක්තිමත් නීති පද්ධතියක්ද තිබෙනවා. අවශ්‍යතාවය තිබෙන්නේ එය නිසි පරිදි ක්‍රියාත්මක වීමයි. ඒත් අමුණුගම අමාත්‍යවරයා කියනවා, වංචනිකයින්ට දඬුවම් කරන්න අලුත් නීතියක් ගේනවා කියලා. දැනටත් පොදු දේපළ පනත තිබෙනවා. රුපියල් 25,000ට වැඩි රාජ්‍ය මුදල් අවභාවිතයක් වෙනුවෙන් ඇප ලබාදීමට පවා නොහැකියි. මුදල් විශුද්ධිකරණ පනත යටතේ වත්කම් උපයාගත් ආකාරය පැහැදිලි කළ නොහැකි වුවහොත් ඒ දේපළ පවරා ගන්නත් එම වටිනාකම වගේ තුන්ගුණයක් වගේ දඩයක් ගහන්නත් පුළුවන්කම තිබෙනවා. අල්ලස් දූෂණ පනත යටතේ රුපියල් 10ක් ගත්තත් නඩු දාන්න පුළුවන්. එෆ්.සී.අයි. එකට පොදු දේපළ පනත, මුදල් විශුද්ධිකරණ පනත, ක්‍රියාත්මක කළ හැකියි. සී.අයි.ඩී.එකට අපරාධ පනත, පොදු දේපළ පනත ක්‍රියාත්මක කළ හැකියි. නීතිය ක්‍රියාත්මක කළ හැකි ආයතන ගණනාවක් තියෙනවා. නීතිපති ඉන්නවා. අධිකරණ තිබෙනවා. එසේ නම්, වංචනිකයන් හොරුන් නිදැල්ලේ ඉන්නේ කොහොමද? නඩු පැවරෙන්නේ නැත්තේ ඇයි? ප්‍රශ්නය තමයි අතරමැද ආණ්ඩුවක් තිබෙනවා. නඩු පැවරීමට අවශ්‍ය අය නැති අය තෝරනවා. මහ දවල් පොලිස් ඇමති පොලිස්පතිට කෝල් කරලා දූෂිතයන් බේරන්නැයි ඉල්ලනවා. පාලකයාගේ



කැමැත්ත නීතිය බවට පත්වී තිබෙනවා. මේ නීතියේ කඩා වැටීමට ජනතාව වගකිව යුතු නැහැ.

ජනතා මුදල් විශාල ලෙස නාස්ති වෙමින් පවතිනවා. ෆොන්සේකා ඇමතිවරයාට තිබෙන්නේ හදබිම අධිකාරය පමණයි. මධ්‍යම කඳුකරයේ පාංශු සංරක්ෂණයත්, වටු බිත්තර එකතු කිරීමත් එයට පැවරී තිබෙනවා. ඒත් එම අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ මාසික කුලිය රුපියල් ලක්ෂ 110යි. දුමින්ද දිසානායකගේ අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ මාසික කුලිය දෙකෝටි දශලක්ෂයයි. මේ ආණ්ඩුවලට නාස්තිය නතර කරන්න බැහැ. ඔවුන්ගෙන් එවැනි දෙයක් ඉල්ලලා තේරුමකුත් නැහැ. මෙවැනි තත්වයක් යටතේ රට අඟලක්වත් ඉදිරියට යන්නේ නැහැ.

අපේ රටේ පරිසර පද්ධතිය වේගයෙන් විනාශ කෙරෙමින් තිබෙනවා. උමාඔය ව්‍යාපෘතිය ආශ්‍රිතව බරපතළ පරිසර විනාශයක් වී තිබෙනවා. කැලණි ගඟේ ජල මූලාශ්‍රවලින් 80%ක් දූෂිත වී තිබෙනවා. මධ්‍ය කඳුකරයේ බරපතළ විනාශයක් වී තිබෙනවා. දේශපාලකයින්ගේ ගෝලබාලයන්ට පස් කපන්න, වැලිකපන්න ඉඩදී තිබෙනවා. මේ විනාශය තවත් ඉදිරියට යා යුතුද?

ආණ්ඩුව හම්බන්තොට වරාය, ත්‍රිකුණාමල වරාය, කොළඹ වරායේ නැගෙනහිර ජැටිය, පුල්මුඩේ ඛනිජවැලි නිධිය, ලංකා හොස්පිටල්, හිල්ටන් හෝටලය, කහටගහ පතල, ආදී රාජ්‍ය දේපළ, ස්වභාවික සම්පත් විකුණමින් යනවා. මේ විනාශකාරී ගමන යන්න රනිල්ට අසීමිත බලතල අවශ්‍ය වී තිබෙනවා. විශේෂ සංවර්ධන පනත ගේන්න හදන්නේ ඒකයි. එදා ජේ.ආරුත් විනාශකාරී ආර්ථික ගමනක් ගියා. දැඩි මර්දනයක් කළා. දැන් රනිල් මතුපිටට පෙන්නන ලිච්ඡවී රජදරුවන්ගේ ප්‍රතිපත්තිය බොරුවක්. සාමයෙන් රැස්වීමක්, සාමයෙන් විසිර යාමක් නැහැ. හම්බන්තොට ජනතා උද්ඝෝෂණයට දින දෙකකට පෙර සිරිකොතේ සාකච්ඡාවකදී ඒ උද්ඝෝෂණයට ගහන්න සැලසුම් කළා. මේ ජනතා විරෝධය මැඩපවත්වන්න කොළඹින් පිරිසක් ගෙනයන්න කතා කළා.

හම්බන්තොට වරාය චීනයට දෙනවාට ඉන්දියාව විරුද්ධ නැහැ. එහෙම විරුද්ධ වුණා නම්, ඔවුන් තමන්ගේ හිතවත් සංවිධාන ලව්වා

> නීතිය ක්‍රියාත්මක කළ හැකි ආයතන ගණනාවක් තියෙනවා. නීතිපති ඉන්නවා. අධිකරණ තිබෙනවා. එසේ නම්, වංචනිකයන් හොරුන් නිදැල්ලේ ඉන්නේ කොහොමද? නඩු පැවරෙන්නේ නැත්තේ ඇයි? ප්‍රශ්නය තමයි අතරමැද ආණ්ඩුවක් තිබෙනවා.

ඒකට විරෝධතාවය පළ කරනවා. ඒත් ඔවුන් බලාගෙන ඉන්නේ ඒ හිලව්වට ත්‍රිකුණාමලය වරාය ඔවුන් සතු කරගන්න. ඉන්දියාව මේ ක්‍රමය දන්නවා. මහින්ද කළේ මේ වැඩේමයි. මත්තල ගුවන්තොටුපොළ චීනයට දෙනකොට පලාලි ඉන්දියාව දුන්නා. නොරොච්චෝලේ චීනෙට දෙනකොට සාම්පූර් ඉන්දියාවට දුන්නා. දුම්රිය මාර්ග ඉදිකිරීම් දුන්නෙත් එහෙමයි. මේ පැවරීම් නිසා රටට දැවැන්ත අවාසියක් වී තිබෙනවා. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකිවල බෙදාහැරීමේ අයිතිය සංස්ථාවට ලැබෙනවා නම්, සංස්ථාවට කෝටි හැත්තෑවක් ලාභයි. ඒත් ආණ්ඩුව හදන්නේ හැමදේම විකුණන්නමයි. දැන් ත්‍රිකුණාමලය වරාය ඉන්දියාවට දෙන්න සාකච්ඡා කරන බව ෆොන්සේකා ඇමතිවරයා එළිපිට කියනවා. හැම ආණ්ඩුවක්ම රටේ ජාතික සම්පත් පෞද්ගලික අංශයට, විදේශ රටවලට විකුණා දමද්දි, සුරංගනා කතා කිව්වා. අපේ රෙදි කම්හල්, සිමෙන්ති, කිරිපිටි, බීජ ගොවිපලවල්, විකුණා දමද්දි විවිධ කතා කිවුවා. ඒත් රටට ඒවායින් ලැබිච්ච කිසිම ප්‍රයෝජනයක් නැහැ. අපි ඒවායේ විනාශය අත්දැක තිබෙනවා. හම්බන්තොට, මත්තල, ත්‍රිකුණාමල වරාය විකිණීම ඊට වඩා වෙනස් වෙන්න කිසිම විදිහක් නැහැ.

සටන් දෙකක් අප ඉදිරිපිට තිබෙනවා. පළමුවැන්න ජනතාව සංවිධානය කිරීමේ සටනයි. සමන්ත විද්‍යාරත්න සහෝදරයා උමාඔය ව්‍යාපෘතිය හේතුවෙන් විපතට පත් ජනතාව සංවිධානය කරමින් සටනක් දියත් කර තිබෙනවා. අප ඒ සටන ජයග්‍රහණයෙන් කෙළවර කළ යුතුයි. ආණ්ඩුවට මොරගහ කන්ද ජලාශයට යටවෙන සතුන් බේරාගැනීමට උවමනාවක් තිබුණත් විපතට පත්වෙන ජනතාවට බේරාගැනීමට වැඩපිළිවෙළක් නැහැ. ගමගෙදර දිසානායක සහෝදරයා මාතලේ ඒ ජනතාව සංවිධානය කරමින් සටනක් දියත්කර තිබෙනවා. අප ඒ සටන ජයග්‍රහණයෙන් කෙළවර කළ යුතුයි.

මහවැලි කලාපවල අමතර කන්නයක් වැඩකරන්න පුළුවන් කියලා එදා කිව්වත් අද ගොවිතැන විශාල ලෙස කඩාවැටෙමින් තියෙනවා. ගොවි ජනතාව පීඩාවට පත්වෙමින් සිටිනවා. ඒ ප්‍රශ්නවලට එරෙහිව ගොවිජන සම්මේලනයේ නාමල් සහෝදරයා සටනක් දියත් කර තිබෙනවා. අප ඒ සටන ජයග්‍රහණයෙන් කෙළවර කළ යුතුයි. ආණ්ඩුව කිව්වා අක්කර ලක්ෂ දෙකහමාරක් වී වගාව නතර කරන එක ඔවුන්ගේ අරමුණ කියලා. අපේ ප්‍රධාන ආහාරය බත් නම්, ආහාර සුරක්ෂිත කරලීම වෙනුවෙන් ආණ්ඩුවට සැලැස්මක් තිබිය යුතුයි. නමුත් රටට බත සපයන ගොවි ජනතාව අසරණ කිරීමට එරෙහිව අපට සටනක් තිබෙනවා. මේ සටන් අප ජයග්‍රහණයෙන් කෙළවර කළ යුතුයි.

අපේ රටේ පිහිටීම ඉතා වැදගත්. ලෝක සිතියමේ තිතක් වගේ තිබුණත් අපේ රට ආර්ථික හා යුදමය වශයෙන් ඉතා වැදගත් පිහිටීමක තිබෙනවා. අපේ වරාය ලෝකයේ 26වැනි තැනට පැමිණ තිබෙන්නේ මේ නිසයි. අපේ ආර්ථික උපාය මාර්ගයේදී මේ පිහිටීම ඉතාම වැදගත් කොට සැලකිය යුතුයි. එහෙත් පාලකයන්ට මේ පිළිබඳ වුවමනාවක් නැහැ. චන්ද්‍රිකා බණ්ඩාරනායක පාලන සමයේ වරායේ ජැටියක් පීඇන්ඩ්ඕ සමාගමට විකුණුවා. මහින්ද පාලන සමයේ දකුණු කොළඹ ව්‍යාපෘතිය නමින් ජැටියක් චීනයට දුන්නා. දැන් රනිල් වරායේ නැගෙනහිර ජැටිය ඉන්දියාවට දෙන්න යනවා. මේ පාලකයන්ගෙන් මීට වැඩි දෙයක් බලාපොරොත්තු වෙන්න බැහැ.

රටේ ජනතාවගේ දුකට පිහිට වෙන, ජනතාව තමන්ගේ ගැටලුවලට විසඳුම් සොයා එන, හදවතේ පක්ෂය බවට අප පත්වී තිබෙනවා. එය අපගේ පළමු පියවරයි. අපි එතනින් ඔබ්බට බලය හුවමාරු කළ හැකි පක්ෂය බවට වර්ධනය විය යුතුව තිබෙනවා. එය අපගේ දෙවැනි සටනයි.

මට හමුවූ එක් ව්‍යාපාරිකයෙක් පසුගියදා කිව්වා, 'හොරුන් මට්ටු කිරීම සඳහා ජ.වි.පෙ. පාර්ලිමේන්තුවට යා යුතුයි කියලා ඔහු එදා හිතුවා' කියලා. ඒත් ඔහු අද කියනවා 'ජ.වි.පෙ.ට මේ රටේ බාරදිය යුතුයි කියලා'. එයා එහෙම කියන්නේ හොඳ විපක්ෂයක් ඕන වෙන්නේ හොඳ පාලනයක් තියෙනවා නම් විතරයි කියලා. මොකද පාලනය අයහපත් නම්, විපක්ෂයක් වැඩක් නැති නිසා. අද හොරාට හොරා කියලා කියනකොට හිනාවෙලා ඉන්නවා. ජනතා දේපළ හොරකම් කළ අය වීරයන් වගේ මාධ්‍යවල පෙනී සිටිනවා. ඒ නිසා හොරකම් කරනවා, නාස්ති කරනවා, දූෂිතයන් රකිනවා කියල ආණ්ඩුවට කියලා වැඩක් නැහැ. ඒගොල්ලො එහෙම තමයි. පවතින ආයතනවලින් දූෂිතයන්ට දඬුවම් ලැබෙන්නේ නැත්නම් ඒ ආයතන ඒවාට අසමත් නම්, ජනතාව ඒ කටයුත්ත බාරගත යුතු වෙනවා. දූෂිතයන් බලයෙන් පහකර ජනතාව ඒ කටයුත්ත කළ යුතුයි.

මැතිවරණයකට පෙර මෙම කටයුත්ත කළ හැකිනම් හොඳයි. ඒත් සාම්ප්‍රදායිකව බලය හුවමාරු වන්නේ ජාතික මැතිවරණයකදියි. එළඹෙන ජාතික මැතිවරණයේදී බලය හුවමාරු කිරීමට සමත්විය හැකි ප්‍රබල ජාතික මධ්‍යස්ථානය අප විසින් ගොඩනැගිය යුතුයි. අද මේ රටට ආදරය කරන මිනිසුන්ගෙන් මේ වේදිකාව පිරී තිබෙනවා. අපට එය කළ හැකියි. නීතිවේදීන්, විද්වතුන්, මාධ්‍යවේදීන්, කම්කරුවන්, ඇතුළු සියලු සමාජ බලවේග හා කොටස් ඒකරාශී කරගත් මධ්‍යස්ථානයක් ගොඩනැගිය යුතුයි. අශෝක පීරිස් මහතා වැනි සිවිල් සේවයේ ජ්‍යෝෂ්ඨයින් මේ වේදිකාවට ගොඩවන්නේ ඒ බලාපොරොත්තුව ඇතිවයි.

දිස්ත්‍රික් හා ආසන මට්ටමින් අප විද්වත් කමිටු ජාලයක්ද පිහිටුවනවා. දැනටමත් දිස්ත්‍රික්ක කීපයක එම කටයුතු අවසන්. එය අපේ බහුජන මධ්‍යස්ථානයේ ඉහළ වැඩ කොටසක් කරනවා. ඒත් අති විශාල ජනතාවක් සිටින බිම සංවිධානය 15වැනි පිටුවට

කවුළුව හැරතබමි

# නිදහසින් නිදහස් වීම



1948 පෙබරවාරි 04 ලංකාවට නිදහස ලැබුනේ යැයි කියනු ලැබේ. එදා සිට අද දක්වා පැවති සියලු ආණ්ඩු විසින් ඒ 'නිදහස' මහත් උජාරුවෙන් සමරනු ලබයි. සියලු රාජ්‍ය ආයතනවල ජාතික කොඩිය ඔසවයි. පාරේ යන වාහනවලද ජාතික කොඩිය. පේමන්ට් එකේද කොඩි විකුණති. ජනාධිපති ප්‍රමුඛ මැති ඇමතියන් ඉදිරියේ හමුදා ආචාර, වෙඩි මුර සහ සංදර්ශන රථය. ඉන් ස්වල්ප මොහොතකට පසු රට තිබූ තැනමය.

අපේ රටේ නිදහස කියා පාලකයින් සමරන්නේ මීට වසර 69කට පෙර ඉංග්‍රීසි ආණ්ඩුව විසින් ලංකාවට ඩොමීනියන් තත්වය පිරිනැමීමේ සංසිද්ධියයි. විවිධ චැනල්වල ප්‍රශස්ති ගයන්නේද, පත්තර පිටු පිරෙන්නේද ඒ වෙනුවෙනි.

බොහෝ රටවල් විදේශ ආධිපත්‍යයෙන් නිදහස් වීමට ජාතික විමුක්ති සටන් හෝ බහුජන සටන් කළද ලංකාවට නිදහස දිනාගැනීම සඳහා කළ එවන් සටනක් අපි නොදකිමු. එනිසාම සමාජයේ විවිධ ස්ථර සමඟ ඓන්ද්‍රිය බැමි ගොඩනාගා ගන්නට ලංකාවේ නිදහස් කථිකාවට නොහැකි විය. එය සුද්දන්ගෙන් කළු සුද්දන් අතට නාමිකව පාලන සුක්කානම මාරුවීමක් පමණක් බව සමහරු සඳහන් කරන්නේ එනිසාය.

මේ සියල්ල පසෙක තබා යම් සමාජයක පීඩිතයන්ට ඇත්ත නිදහස අත් වන්නේ කවදාද? යන ප්‍රශ්නයට අපි එළඹෙමු. මේ ධනවාදී සමාජයේ මූලික ප්‍රතිවිරෝධය ඇත්තේ, වැටුප් ශ්‍රමය හා ප්‍රාග්ධනය අතරය. සරලව කිවහොත් සූරාකන්නන් සහ සූරාකෑමට ලක්වන්නන් අතරය. ඒ අනුව ඇත්ත නිදහස මිනිසුන්ට ලැබෙන්නේ රටක වැඩකර ජනයා ප්‍රාග්ධනයේ වියගසින් මිදුණු දාටය. සූරාකෑමෙන් සම්පූර්ණයෙන් මිදුණු දාටය. එතෙක් නිදහස යනු අයිසිං කළ ගජබින්නයකි. එනිසා පළමුව කළ යුත්තේ මේ බොරු නිදහසින් 'නිදහස්' වීමය.

# 64 මායම්



සමහර ටෙලි නාට්‍ය සහ සිනමා පට එන්නේ 'සීරිස්' ලෙසටය 'ප්‍රේම දඩයම 1 සහ 2'. 'පාර්ලිමන්ට් ජෝක්ස් 1 සහ 02' ආදී වශයෙනි. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා ප්‍රධාන නළුවාට යොදා ගෙන ඊනියා එකාබද්ධ විපක්ෂය පසුගිය වසරේද කොමඩි නාටක කිහිපයක් සිදුකර තිබිණි. දැන් නැවතත් එය ඇරඹී තිබේ. මේ ටෙලි නාටක මාලාවේ අලුත්ම කොටස ජනවාරි 27 දින නුගෙ 'ගොඩදී ප්‍රදර්ශනය කරන ලදී. එය නම් කර තිබුනේ 'පෙරළියක ඇරඹුම' කියාය. පසුග 'ිය ජනාධිපතිවරණයේ පරාජය වූ රාජපක්ෂ මැදමූලන නිවසේ ජනේලයක එල්ලී කරන ලද 'විශිෂ්ට' රංගනයෙන් ඇරඹි මහින්ද නඩයේ ටෙලි නාටක මාලාව පන්සල්, කෝවිල්, මහපාර හරහා දැන් ප්‍රසිද්ධ වේදිකාවට පැමිණ ඇත.

මහින්ද සමඟ නැගිටිමු කියා පටන් ගත් මේ නාටක මාලාවේ 'පෙරළියක ඇරඹුම' නවතම දිගහැරුමේ නමද සරදමකි. මහින්ද තම පාලන කාළයේදී රට පෙරළාගෙන ගියේ කොතනටද යන්න කවුරුත් දනිති. බලය සහ වස්තුව බේරා ගැනීම සඳහාත් එළඹීමට නියමිත දඬුවම්වලින් බේරීම සඳහාත් 'මහින්ද සමඟ උඩු බුරමු' හැරෙන්නට වෙනත් ඉරණමක් හිමි නොවූ නඩය හැර රටේ හිතන මතන ජනයාට මහින්ද මේ රට පෙරළා දැමුවේ කොතැනටද යන්නට අටුවා ටීකා අවශ්‍ය නැත. වත්මන් හවුල් ආණ්ඩුවද මහින්ද නඩයේ කෛරාටික රංගනයන්ට නියමින් සහා අනියමින් අනුබල දෙන්නේ රටේ සැබෑ ජනතා බලවේගයක් මතුවීමට තිබෙන ඉඩ කඩ වසා දැමීමට තිබෙන හොඳම තුරුම්පුව එය යැයි සිතා විය හැක. එහෙත් රටේ ජනයා අවදිවූ දාට ඔය කාගෙ කාගේත් තුරුම්පු ඔවුන්ටම 'හක්කපටස්'' වනු ඇත.

# ඩීල්, ගේම් සහ පොර ටෝක් සමඟ වසර දෙකක්



මේ ශ්‍රී ලංකා දූපතේ පසුගියදා අපූරු උත්සවයක් පැවැත් වුණි. ඒ, වත්මන් ජනාධිපතිවරයාගේ පදවිප්‍රාප්තියේ දෙවන වසර සැමරීමටය. මේ වසර දෙක තුළ සැමරීමට තරම් යමක් සිදුවීද? අපට තිබෙන ප්‍රශ්නය එයයි. මහින්දගේ කාලයේ සිදුවුණා සේම හොරුන් සමඟ 'ඩීල්' එලෙසමය. රටේ දේශපාලුවෝ සහ ඔවුනගේ හිතවත්තු රටේ සම්පත්වලට හිතූ හිතූ විදිහට 'ගේම' දෙති; කැලෑ කපා හෝටල් හදති; ගස් කපති; පස් කපති; කඳු කඩති; විකුණති; රාජ්‍ය ආයතන විකුණති; ලංකාවට අයත් භූමිය විකුණති; මුහුදද විකුණති; අහසද විකිණීමට සැරසෙති; හොරු රකිති; ජනතාව නොමරා මරති; මේ කිසිවකට කිසිවෙකු වග නොකියති; සිසුන් හිර කරති; කම්කරුවන්ට තඩිබාති; ගොවියාද ගොවිතැනද වනසති; මුහුදේ මාළු වෙනුවට ධීවරයන්ගේ මාළුම ඉල්ලති.

මේවා දිගටම මෙසේ සිදුවෙද්දි ජනාධිපතිවරයා පොර ටෝක්ම දමයි. "මම තරාතිරම නොබලා දූෂිතයන්ට දඬුවම් දෙමි. ඔවුන් පරසක්වල ගසමි. ජනයාට විරුද්ධව කිසිදු පියවරක් ගැනීමට මම ඉඩ නොතබමි. මම තොප රකිමි". මේ ඔහුගේ උදාන වාක්‍යයය. එහෙත් රට තුළ සිදුවන්නේ ඊට ඉඳුරාම වෙනස් දේය. ඒ අනුව මෙය ඩිස්නිලන්තයටත් වඩා විශ්මලන්තයකි. කියන දේ නොකළ, කළ දේ සැඟවීමට හදන තවත් දෙවසරක් ගෙවී ගියේය. මේ ක්‍රමයම කර ගසා ගෙන යන කවුරුන් පදවි ප්‍රාප්ති ලැබුවද සිදුවන්නේ ඔය ටිකමය.

# පොලිටිකල් පංතිය

පොලිටික්ක දත්මිටි කාගෙන පංතියට එනකොට කවුරුත් දැනගත්ත මලේ උපරිමෙන් එන්නෙ කියල. අනුරුද්දියත් ගුඩ් මෝනිං කියන්න ගිහින් අකුළගත්ත, මොකක් හරි කෑල්ලක් වැදුණොත් දවසම මස්තබාල්දු වෙන හින්ද.

"මොකද ඔය ළමයි තක්බීර්... ගුඩ් මෝනිං බැරිනම් සුභ උදෑසනක්වත් කියන්නෙ නැද්ද?" පොලිටික්ක ටිකක් විතර නියුට්‍රල්.

"ගුඩ් මෝනිං ස..ර්" කාටත් වඩා ඇහුණෙ අනුරුද්දියගෙයි වසන්තියගෙයි කටහඬ.

"දැන් ළමයිනේ ගුඩ් මෝනිං කිවුවට 'ගුඩ්' වෙන්නෙ නෑ." පොලිටික්කගෙන් ප්‍රගතිශීලී ටෝක් එකක්.

"ඒ කතාව ඇත්ත සර්. 'ගොඩෝ' උන්නැහැ එනකම් බලාහිටියට වැඩක් නෑ. ගුඩ් කරගන්න වැඩ කරන්න වෙනව." සමනත් බෝලෙ උස්සල දුන්න.

"ඒත් සමන් මේ වගේ ආණ්ඩුත් එක්ක වැඩ කරන්න පුළුවන්ද? ....දැන් බලන්න විමල් ළමය ඇතුළට දාලා." පොලිටික්ක වැඩි වෙලා ගන්නෙ නැතුවම සබ්ජෙක්ට් එකට ආව.

"විමල් ළමය කිවුවට සර් මිනිහ මහ හොරෙක්නෙ." මංජුවගෙන් ඩෑෂ් එකක්. "රටේ මිනිස්සුන්ගෙ සල්ලි ටික නෑයොයි, යාළුවොයි බෙදා ගත්තහම හරියනවද?"

"ඕවා බොරු කතානෙ. දැන් ඔය ළමය කියන්නෙ ඥාතියො, යාළුවො රටේ මිනිස්සු නෙමෙයිද?" පොලිටික්කත් අරින්නෙ නෑ. " රස්සාවක් නැති කෙනෙක්, ගෙයක් දොරක් නැති කෙනෙක් ඇවිත් උදව්වක් ඉල්ලපුවහම ඥාතිද යාළුද කියල බලන්නනෙ නෑනෙ... සලකනව." පොලිටික්ක ඇල්වතුර නිවනව.

"හැබැයි බලාගෙන යනකොට හම්බුවෙන්න ඇවිල්ලා තියෙන්නෙ එයාලා විතරනෙ." කනියත් හයිය කෑල්ලක් දැම්ම. "එයාලට විතරනෙ උදව් කරලා තියෙන්නෙ."

"අපි දන්නෙ නෑනෙ සාමාන්‍ය මිනිස්සුන්ට ආරක්ෂකයො ළඟට යන්න දුන්නෙ නැද්ද කියල." අනුරුද්දිය හෝදන්න හදනව. "ළඟට ගියපු අයට උදව් කරන්න ඇති"

"ඒක හරි ෂෝක්... විමල් බබා... ගෙවල් නැති අය අඳුනන්නෙ නෑ. ඥාතීන්ට ගෙවල් දුන්න. ගෙදරට වාහන නැති අයට වාහන දුන්න." මංජුව අනුරුද්දියට විරිත්තුව.

"හරි හරි ළමයො... වෙද මහත්තය තමන්ටම කියල බේත් ගුලියක් හදාගෙන කෑවට මක්වෙනවද? තමන්ගෙ මිනිස්සුන්ටත් සලකන්න එපායෑ" පොලික්ක අලුත් තියරියක් දැම්ම.

"ප්‍රජාතන්ත්‍රවාදී රටවල එහෙම තියරි නෑ නේද සර්. එහෙම වැඩවසම් සැලකීම් කරන්නෙ කොහොමද?" සමන කතාව ශාස්ත්‍රීය කරන්න බැලුව.

"සහෝදරයගෙ වයිෆ්ගෙ නමට තියෙන වාහනේ ජනාධිපති ලේකම් එකට මාසෙට ලක්ෂ 11/2කට කුලියට දීලා ඒ වාහනේ සහෝදරයටම දෙනවා 50,000ක ඉන්ධන දීමනාවක් එක්ක. මොන සැපද?" මංජුව බර ආයුදවලින්ම ආව.

"එහෙම වැරදි බැලුවොත් මේ ආණ්ඩුවෙත් බර ගාණක් හිරේ ඉන්න ඕනෙ." පොලිටික්ක කිවුවෙ ඒවා ඔට්ටු නෑ කියන්න වගේ වොයිස් එකකින්.

"සර් කිවුව හරි. දෙකම එකයි. මාරුවෙන් මාරුවට වැරදි පෙන්න පෙන්න ඉන්න පුළුවන්. කේතලේ මුට්ටියට කළුයි කිවුව වගේ." දෙකේම වැරදිකාරයින්ට දඬුවම් දෙන පාලනයක් එන්න ඕනෑ" සමන උඟුර මාළු උඟුරගෙ පිටේ තියලම කැපුව. "දිනුවට පස්සෙ ගුවන්තොටුපළ වහනවයි කිවුව මිනිස්සු වැරදිකාරයින්ට නිදැල්ලෙ යන්න දුන්නෙ කොහොමද?"

"හැබැයි විමල් හිරේ දාලා එකාබද්දෙ ගමන නවත්තන්න බෑ කියලා මහින්ද මහත්තය කියල තිබුණා." පොලිටික්ක අන්තිම තුරුම්පුවත් ඇද්ද.

"ඒ කතාව හරි" සමනගෙ උත්තරේට පුදුම වුණු හැමෝම ඒ පැත්ත හැරුණා. "මම කිවුවෙ විමල් කියන්නෙ හොර නඩෙන් එක්කෙනෙක් විතරයි. තව ගොඩක් ඉන්නව ඇතුළට යන්න ඕනෑ. ඔක්කොටම දඬුවම් ලැබෙන්න ඕනෑ. හොරා කාපු සල්ලි ආපහු රටට ගන්න ඕනෑ. වැඩ ගොඩක් තියෙනවා." පොලිටික්කගෙ කට කපු ලෙල්ලක් වෙන අතරෙ සමන කියල දැම්ම.

## සමාජවාදය තුළදී... 07 පිටුවෙන්

සාධාරණ පොලියක් ලබා දෙයි. ඔබගේ තැන්පතුවේ සුරක්ෂිතභාවය පිළිබඳව වගකීම සමාජවාදී රජය විසින් දරනු ලබන්නේය.

ධනේශ්වර ක්‍රමය තුළදී සාතිශය බහුතරයක් පුද්ගලයෝ එක්කෝ වස්තු භංගත්වයට පත්වෙති. නැතිනම් ලීසිං සමාගම්වල හෝ පොලී කාරයන්ගේ හෝ බැංකුවල හෝ ණයකාරයන් බවට පත්වෙති. පුද්ගලයෙකුට තමන්ගේ මූලික අවශ්‍යතා තෘප්ත කර ගැනීම සඳහා අවශ්‍ය වන පුද්ගල දේපළ (පරිගණකයක්, වාහනයක්, තමන්ගේම නිවසක් ආදිය) ලබා ගැනීම සඳහා මුළු ජීවිත කාලයම වැය කිරීමට සිදුවන්නේය. එහෙත් ඊට ප්‍රතිපක්ෂව සමාජවාදයේදී ජනතාවට තමන්ගේ මූලික අවශ්‍යතා තෘප්ත කරගැනීම සඳහා අවශ්‍ය පුද්ගල දේපළ ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් ආදායමක් සමාජවාදී ආර්ථිකය විසින් සහතික කරනු ලබන්නේය.

## පල් වළේ සිටිනවාද නැතහොත්... 16 පිටුවෙන්

මේක තවදුරටත් රෙපයාර් කරන්න බැහැ. පැලැස්තර දාන්න බැහැ.

දිරිය පුරවැසි සමිති ගොඩනැගීමට අප කතා කළ, පළමු මොහොතේදී ඒ සඳහා ධෛර්යය සම්පන්නව ඉදිරිපත් වූ පුරවැසියන්ට පමණයි මේ රටේ යහපත් පරිවර්තනයක් වෙනුවෙන් මහජන බලවේග ගොඩනඟන්න හැකියාව තියෙන්නේ. ඔවුන් මෙම කාර්යයේ පෙරමුණ අරගෙන ගම් මට්ටමින් නායකත්වය දිය යුතුයි. ගමට සමිතියක්, ගමට නායකත්වයක්, කියන ආදර්ශ පාඨය යටතේ ජනතාව ඒකරාශී කළ යුතුයි. මේ සඳහා ප්‍රතිපත්ති තියෙන්නේ ධනවාදී සමාජය වෙනස් කර, නව සමාජයක් ගොඩනැඟීමේ දේශපාලනයකට විතරයි. ඒ දේශපාලන නායකත්වය ගැනීමේ සුදුසුකම් තියෙන්නේ කැපවීමෙන් වැඩකරන මේ රටේ අනාගතය සම්බන්ධයෙන් පැහැදිලි දැක්මක් තියෙන ජනතා විමුක්ති පෙරමුණට පමණයි." ටිල්වින් සිල්වා සහෝදරයා අවධාරණය කළේය.

## ජයග්‍රාහී ආර්ථික ප්‍රතිපත්තියක්... 16 පිටුවෙන්

අපි කවුරුත් එකතු වෙලා ආරම්භ කරපු සටන ඉදිරියට ගෙනයමු. මේ රට පාවාදෙන රට විකුණන මේ ප්‍රතිගාමී පාලකයෝ පරද්දලා අපේ රට සුරකින ජනතාවාදී පාලනයකින් මේ රට සංවර්ධනය කිරීමේ යුගයක් ආරම්භ කරමු.

## ජීවත්වීමේ අයිතිය... 12 පිටුවෙන්



ලක්වීමේ අවදානමයි. අපේ රටේ අනාගතය අඳුරු කිරීමක් ලෙස මෙම ව්‍යාපෘතිය හඳුනා ගැනීමට අවශ්‍ය තරම් සාධක මේ වන විටත් සම්පූර්ණ වෙමින් තිබෙන අතර හම්බන්තොට වරාය, මත්තල ගුවන්තොටුපොළ, නොරොච්චෝල බලාගාරය, සූරියවැව ක්‍රීඩාංගණය වැනි අති අසාර්ථක ව්‍යාපෘති ලේඛනයට උමා ඔය ව්‍යාපෘතියද නුදුරේදීම එක්වනු ඇත.

විනාශය වැළැක්වීමේ මඟ

පසුගිය රාජපක්ෂ පාලන සමය මෙම ව්‍යාපෘතිය ආරම්භ කළා සේම වත්මන් මෛත්‍රී රනිල් පාලනය මෙම ව්‍යාපෘතිය නිමා කිරීම සඳහා කටයුතු කරමින් සිටින්නේ ජනතාවගේ ජීවත්වීමේ අයිතිය අභියෝගයට ලක්කරමිනි. එම නිසා ජනතාවගේ ජීවත්වීමේ අයිතිය වෙනුවෙන් මෙම බහුකාර්යය විනාශයට එරෙහිව ප්‍රබල ජන බලයක් ගොඩනැගිය යුතුව ඇත. පාලකයන්ගේ ඕනෑම ව්‍යාපෘතියක් ප්‍රබල ජනතා බලයකට ආපසු හැරවිය හැක. අවශ්‍ය වන්නේ වඩාත් නිවැරදිව වඩාත් ශක්තිමත්ව එම ජනතා බලය ගොඩනැගීමය. ඉදිරියේදී ගොඩනැගෙන එවැනි ජනතා බලයකින් මෙම මහා විනාශය වළක්වාගත හැකිය. ඒ සඳහා යොමුවීම උමා ඔය ව්‍යාපෘතිය මගින් ජීවිත අහිමිවන, දේපොළ අහිමිවන ජනතාවගේ පමණක් නොව රටට සිදුවන හානිය වඩාත් නිවැරදිව තේරුම් ගෙන අනාගත පරම්පරාව වෙනුවෙන් එම විනාශය ආපසු හැරවීමේ වගකීම තේරුම්ගත් ජනතාවගේත් අත්හළ නොහැකි වගකීමකි.

## යටත්වැසියන් වෙනුවට පුරවැසියන්... 13 පිටුවෙන්



කරන්නට දිරිය සමිති ජාලය අවශ්‍යයි. මේ සඳහා ශක්තිමත්ම පුරවැසි සමිති ජාලය අප විසින් ගොඩ නැගිය යුතුයි. පසුගිය මාර්තු මාසයේ සිට මාස 09ක කාලය තුළ පුරවැසි සමිති 1000කට වැඩි ප්‍රමාණයක් අප විසින් ගොඩනගා තිබෙනවා. ඉතිරි සියලු සමිති ඉක්මනින්ම සකස් කර අවසන් කරන බවට අප සපථ කර සිටිනවා. මේ සමිති බිම වෙළාගත් ශක්තිමත්ම ජාලය බවට පත්කරනවා.

මිලියන ගණනක් පුරවැසියන් සිටින්නේ හඬක් නොමැතිවයි. කම්කරුවන්ට වෘත්තීය සමිති තිබෙනවා. ගොවීන්ට ගොවි සමිති තිබෙනවා. නමුත් ගම්වැසියන්ට තමන්ගේ ගම තුළ ප්‍රශ්න විසඳා ගැනීමට කැපවන මධ්‍යස්ථානයක් නැහැ. අප ගොඩනඟන දිරිය පුරවැසි සමිතිය ඒ සඳහා කැපවන මධ්‍යස්ථානය බවට පත් කළ යුතුයි. එය හුදු බලය ලබාගැනීම පමණක් ඉලක්ක කරගත් සංවිධානයක් නොවෙයි; බලය ලබාගත් පසු බලය හසුරුවන මධ්‍යස්ථානය බවටද එය පත්විය යුතුයි. දැන් දේශපාලන පක්ෂවලට ගමේ සමිති තිබෙන්නේ බලය ලබාගත් විට සභාපතිවරයාට ටෙන්ඩර් ලබාගැනීමටයි. මේක එහෙම තැනක් නොවෙයි. ජනතාවගේ ගැටලු විසඳා ගැනීම සඳහා වන, ගම ගොඩනඟන මධ්‍යස්ථානය බවට පත් කළ යුතුයි. ගමට අධිෂ්ඨානය, සංස්කෘතිය, එකමුතුකම, සාමූහිකත්වය රැගෙන යන සමිතිය බවට දිරිය පුරවැසි සමිතිය පත්විය යුතුයි.

## ඉදිරි පෙළ සටන්කරුවන්... 03 පිටුවෙන්

සම්පත් භාවිතයේදී හැදිය යුතු සංස්කෘතිය වෙනුවට ඉහළ සිට පහළට ගෙනල්ල තියෙන්නේ රාජ්‍ය සම්පත් කොල්ලකෑම, විනාශ කිරීම සහ ඒවා විකිණීම පිළිබඳ වෙච්ච සංස්කෘතිය. ඒ නිසා ආණ්ඩුවේ ප්‍රතිපත්ති හදන මිනිස්සු ආයතන පිටින් විකුණන්න හදද්දී අර කාර්යාලේ සිටින පියුන් බලනවා කැඩිච්ච පුටු කැල්ල නැත්නම් ෆුල්ස්කැප් මිටිය විකුණලා කොහොමද කීයක්හරි අරගන්නෙ තැනට ඇවිල්ල තියෙනවා. ආර්ථිකය ඇතුලෙ ඔහුව ඒතරම් දුර්වල කරලා තියෙනවා. ඔහුත් කල්පනා කරනවා ජීවත්වීම සඳහා අර කොළේ යන එකා කොලේ කනවා වගේ හොරකම් කිරීමට.

රාජ්‍ය සම්පත් විකිණීම ආර්ථිකමය ලෙස බෙලහීන, පරාදීන, දුර්වල වෙච්ච මිනිසුන්ගේ ප්‍රතිපත්තියක් මිස රාජ්‍ය සම්පත් විකුණලා රටක් හදපු තැනක් ලෝකයේ නැහැ. ඒ නිසා උපාය මාර්ගික සැලසුම් ඇතුලෙ තමන්ට කරන්න පුළුවන් මොනවාද? තමන්ට අපහසු මොනවාද? ඒවාට ශ්‍රමය ගන්නේ කොහොමද? ඒවාට තාක්ෂණය ගන්නේ කොහොමද? කල්පනා කරලා බලන්න පුළුවනි. උදාහරණයක් ලෙස කොළඹ වරායේ නැගෙනහිර ජැටිය මෙහෙයුම්වලට සම්බන්ධවෙලා ආදායම් උපයන්න. හැබැයි ඒ ආදායම් උපයන එකට වරාය සේවකයෝ ඉංජිනේරුවො ඇතුළු පිරිස් මේකට යෝජනා දීල තිබෙද්දී ආණ්ඩුව ඒ කිසිවක් සලකන්නේ නැතිව අත්තනෝමතික ලෙස හොර ගිවිසුම් ගහල ඉන්දියාවට විකුණන්න හදනවා. හම්බන්තොට චීනයට දීල ඉන්දියාවට දෙන්න හදනවා ත්‍රිකුණාමයයි, කොළඹ නැගෙනහිර ජැටියයි.

ආණ්ඩුව අනුගමනය කරමින් සිටින්නේ සම්පූර්ණ අසාර්ථක වැරදි ආර්ථික ප්‍රතිපත්තියක්. වැඩකරන ජනතාව මේකට සම්පූර්ණ විරුද්ධව ඉන්නේ. විකිණීමේ ප්‍රතිපත්තියට සම්පූර්ණම වැඩකරන ජනතාවගේ විරෝධය අප්‍රසාදය තමයි තියෙන්නේ.

***නියමුවා:- මහබැංකු බැඳුම්කර ගනුදෙනුව ආශ්‍රිත ආන්දෝලනාත්මක සිදුවීමට වැඩකරන ජනතාවගේ අර්ථසාධක අරමුදලත් මේ වන විට ඈඳී තිබෙනවා. අන්තර් සමාගම් සේවක සංගමය මේ පිළිබඳව විරෝධතා උද්ඝෝෂණයක්ද සංවිධානය කර තිබුණා. මේ පිළිබඳව කෙටියෙන් කිවුවොත්.***

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** ඔව්. අන්තර් සමාගම් සේවක සංගමය හැටියට මහ බැංකු බැඳුම්කර වංචාව ගැන දිගින් දිගටම කරුණු සොයා ගත්තා. මේ පිළිබඳ තොරතුරු රටට හෙළි කළා. මේ වෙනකොට හරි පැහැදිලියි සේවක අර්ථසාධක අරමුදලට රුපියල් බිලියන 15ට ආසන්න අලාභයක් සිද්ධවෙලා තියෙනවා.

සේවක අර්ථසාධක අරමුදල මේ රටේ වැඩකරන ජනතාවට අයිති දැවැන්තම අරමුදල. මේ වෙනවිට බිලියන 1,300ක් ට්‍රිලියන 1.3ට ආසන්න මුදලක් තියෙනවා. වාර්ෂික ආදාම බිලියන 120ට වැඩියි. මේ ආදායම නැවත කල්පිරෙන බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනවා. සේවක අර්ථසාධක අරමුදලින් 85%ක් 93%ක් පමණ තියෙන්නේ රජයට දීපු ණය. රුපියල් ණය සහ බැඳුම්කර සහ බිල්පත්වලට දාපු ණය. ඉතිරි 6%ක් 7%ක් කොටස් වෙළඳපොළේ ආයෝජනය කරනවා. මේ ඔක්කොම ගත්තහම මහ දැවැන්ත මුදල් සම්භාරයක් තියෙනවා. මෙහි පාලනය තියෙන්නේ මහ බැංකු අධිපතිවරයා සහ මුදල් මණ්ඩලයටයි. ඒ නිසා ආණ්ඩුවට සෘජුව ණය දෙන්න පුළුවනි, ආණ්ඩුවේ ණය ලබාගන්න කෙනෙක් හැටියට සේවක අර්ථසාධක අරමුදල ක්‍රියා කරනවා.

ඒ නිසා මේ බැඳුම්කර වංචාවේදී සිදුවුණේ මාමාගේ බලය යටතේ තිබුණු මහ බැංකුව, අර්ථසාධක අරමුදලට බැඳුම්කර ගනුදෙනුවලදී ප්‍රාථමික වෙළඳපොළට එන්න එපා කියලා, ද්විතීක වෙළඳපොළේදී තමන්ගේ බෑණගේ කොම්පැනියේ බැඳුම්කර ගන්න කියා බලපෑම් කළා. මේක තමයි සිද්ධ වුණේ. 2015 පෙබරවාරි 27 සිට බැලුවට පස්සෙ 2016 ජූනි අවසන් වෙනකොට මහ බැංකුවෙ හිටපු අධිපතිගේ බෑනාගේ සමාගමක් වන පර්පෙක්චුවල් ට්‍රෙෂරිස් ආයතනය සෘජුව රුපියල් බිලියන 141ට ආසන්න මුදලකට බැඳුම්කර ප්‍රාථමික වෙළඳපොළෙන් අරන් තියෙනවා. මේ ගත්ත මිලියන 141න් මිලියන 135ක් 134ක් පමණ ආපහු විකුණලා තියෙන්නේ EPF එකට.

අපට තියෙන ප්‍රශ්නය 2014 දී මේ පර්පෙක්චුවල් ට්‍රෙසරිස් සමාගම මාස 21ට රු. මිලියන 12,854ක් ලාභ ලැබුවා. කුඩු වික්කත් මෙච්චර ලාභයක් ලබන්න බැහැ. අවු. 100ක් ව්‍යාපාර කරන අපේ රටේ දැවැන්තම සමාගමකටත් මෙපමණ ලාභයක් හොයන්න අවු. 10ක් 12ක් ව්‍යාපාර කටයුතු කරන්න වෙනවා. ඒ නිසා ඉතාම පැහැදිලියි 95%ක්ම පර්පෙක්චුවල් ට්‍රෙෂරීස් ආයතනය මිලදී ගත්ත බැඳුම්කර ප්‍රාථමික වෙළඳපොළෙන් ද්විතීක වෙළඳපොළට විකුණල තියෙන්නේ අර්ථසාධක අරමුදලට. ඒනිසා මහ බැංකුවට සෘජුව ණය දෙන්න පුළුවන්කම තියෙද්දී සේවක අර්ථසාධක අරමුදල මෙසේ ගනුදෙනුවකට යන්නේ මහ බැංකුවේ හිටපු අධිපති අර්ජුන මහේන්ද්‍රන්ගේ බලපෑම හා උපදෙස් මත.

මේ නිසා අර්ථ සාධක අරමුදලට සිදුවෙලා තියෙන අලාභය මිලියන 15,000ට ආසන්නයි. පර්පෙක්චුවල් ට්‍රෙෂරීස් සමාගමේ ලාභය මිලියන 13.000ට ආසන්නයි. මේ වෙනකොට 2016 තව මාස 03ක් ඉතිරිව තිබෙනවා. ඒ අනුව හරි පැහැදිලියි අර්ථසාධක අරමුදල ලැබූ අලාභයත් පර්පෙක්චුවල් ට්‍රෙසරීස් සමාගම ලැබූ ලාභයත් සමානකමක් තියෙනවා.

අපි පසුගිය 19දා මහ බැංකු අධිපති හමුවෙන්න ගියා මේකට උත්තරයක් ගන්න. අපිට සතියකින් මේ මහ බැංකුවේ අර්ථ සාධක අරමුදලේ සිදුවෙච්ච වංචාව පිළිබඳ කාරණයට ඔහු අපට උත්තරයක් දෙනවා කිව්වා. අපි බලන් ඉන්නවා.

ඒ විතරක් නොවේ අපි පෙබරවාරි මස සිට රට දැනුවත් කරන දැවැන්ත සම්මන්ත්‍රණ මාලාවක් පටන් ගන්නවා. ඒ සම්මන්ත්‍රණ මාලාවත් එක්ක මේ බැදුම්කර වංචාවේ හොරු තවදුරටත් රටට හෙලිකරන්න කටයුතු කරනවා. ඒනිසා මේ හොරු අල්ල අර්ථසාධක අරමුදලේ, මුදල් කොල්ලකාපුව අයකර ගන්න. එතෙක් අපි අපේ සටන ඉදිරියට ගෙනියනවා.

ඉතාම පැහැදිලියි මෙතන ජාවාරමක් මංකොල්ලයක් සිද්ධ වුණා කියලා. මහ දවල් මහ බැංකුව කොල්ලකෑමක්. අර්ථ සාධක අරමුදල කොල්ලකාපු විදිය තියෙනවා. හොරකම් කරපු සල්ලි තියෙනවා. හොරු ඉන්නවා. දැන් නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනැ. අපේ සටන අර්ථ සාධක අරමුදලට අහිමි කරපු මිලියන 15,000 වහාම අයකර ගැනීම සඳහා. ඒ අයකරගෙන චෝදිතයන්ට දඬුවම් දෙන තෙක් අපේ සටන ඉදිරියට ගෙනියන්න වෘත්තීය සමිති ව්‍යාපාරයක් ලෙස මේ රටේ පෞද්ගලික අංශයේ සේවකයින් සමඟ කටයුතු කරනවා.

***නියමුවා:- වැඩකරන ජනතාව තමන් පෙළන සමාජ ආර්ථික කොන්දේසිවලට එරෙහිව නැගී සිටියත් තමන් ස්ථානගත විය යුතු පක්ෂ දේශපාලන මතවාදයට සමීප වන්නේ ඉතා සෙමින්. මේ තත්වය ජයගැනීම සඳහා ඔබ සංගමය සතු වැඩපිළිවෙළ කුමක්ද?***

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** අන්තර් සමාගම් සේවක සංගමය ලෙස අප වැඩකරන ජනතාවට තමන්ගේ ආර්ථික ඉල්ලීම් ජයග්‍රහණය කරගැනීමේ සීමාවත් එතනින් ඔබ්බට මේ දේශපාලන ක්‍රමයට එරෙහි සටනක් තියෙනවා කියන කාරණය පිළිබඳ දැනුවත් කරමින් සිටිනවා. ඒ නිසා පක්ෂ දේශපාලන මතවාදයට සමීපවීම පිළිබඳව අන්තර් සමාගම් සේවක සංගමයට ගැටලුවක් නැහැ. අන්තර් සමාගම් සේවක සංගමය ජනතා විමුක්ති පෙරමුණේ පෞද්ගලික අංශයේ වෘත්තීය සමිති පෙරමුණ බව අපේ සාමාජිකයන් රටේ ජනතාව, මෙන්ම පාලකයොත් සියලු දෙනාම දන්නවා. ඒ නිසා අන්තර් සමාගම් සේවක සංගමයේ සාමාජිකයා සංගමයේ අරගලය ජ.වි.පෙ දේශපාලන අරගලය හා සම්බන්ධ අරගලයක් බව හඳුනාගෙන තියෙනවා. ඒ අරගලය සඳහා ඔවුන්ට හැකි අයුරින් දායක වෙමින් තියෙනවා.

එනිසා දේශපාලන මතවාදයට සමීපවීම හෙමින් කියන කාරණය වෙනුවට අපි විශ්වාස කරනවා සමාජයක් ලෙස සමාජයේ තිබෙන පසුගාමිත්වයට සාපේක්ෂව අන්තර් සමාගම් සේවක සංගමයේ සාමාජිකයා ඉන්නේ ඉදිරියෙන්. ඒ ඉදිරියෙන් ඉන්න සාමාජිකයා අන්තර් සමාගම් සේවක සංගමයේ සාමාජිකයන් ලෙස මැයි දිනයට, උද්ඝෝෂණයට වගේම වැඩබිමේ තමන්ගේ සාමාජිකයන් දැනුවත් කරන කාරණයට, ආණ්ඩුව ගෙනයන ආර්ථික මංකොල්ලයට එරෙහිව, රාජ්‍ය දේපළ විකිණීමට එරෙහිව මේ රටේ වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදුවට එරෙහිව කරන සෑම සටනකම මේ ආණ්ඩුවේ ක්‍රියාමාර්ගවලට එරෙහිව ඉන්නවා.

අපිත් එක්ක අලුතෙන් දිනපතා සාමාජිකයන් සම්බන්ධ වෙනවා. ඒ අයත් සම්බන්ධ කර ගනිමින් සූරාකන ශ්‍රමිකයාගේ අරමුදල් කොල්ලකන, තමන්ගේ ජීවිතයේ සතුට උදුරා ගෙන තිබෙන, තමන්ගේ ශ්‍රමය අත්තනෝමතික ලෙස කොල්ලකන්න හදන, තමන්ගෙ දරුවට පාසලක් අහිමි කර තිබෙන, තමන්ගෙ ලෙඩට බෙහෙත් ටික ගැනීමේ හැකියාව අහිමි කර තිබෙන, තමන්ගේ ඉගෙන ගත්තු දරුවට රැකියාවක් දෙන්න අසමත් මේ මේ කුණුවෙච්ච ගඳගහන වෙළඳපළ ආර්ථික ක්‍රමයට එරෙහිව මේ රටේ ප්‍රගතිශීලී ව්‍යාපාරයක ගොවියො, ශිෂ්‍යයො, බුද්ධිමත්තු, කලාකරුවෝ, වෘත්තීයවේදියො ආදී සියලු දෙනා සමඟ එක්ව ඉදිරි පෙළ සටන්කරුවන් විදිහට සටන්වදින්න මේ රටේ වැඩකරන ජනතාව සූදානම්.

68 අවුරුද්දක් තිස්සේ මේ රට මේ මඩ ගොහොරුවට ඇදලා දාපු ක්‍රමයට එරෙහිව එළඹෙන ජාතික මැතිවරණයේදී මේ රටේ ගමන්මග සම්පූර්ණයෙන්ම වෙනස් කරන හැරවුමක් බවට පත් කරන්න මේ රටේ පෞද්ගලික අංශයේ සේවකයින් දැන්ම සිට මුලපුරමින් සිටිනවා. ආර්ථික ඉල්ලීම්වලින් ඔබ්බට ගිය දේශපාලන ඉල්ලීම් වෙනුවෙන්, වැඩකරන ජනතාව ක්‍රම වෙනසක් වෙනුවෙන් වූ සටනක ඉදිරිපෙළ සටන්කරුවන් බවට පත්කරන්න අන්තර් සමාගම් සේවක සංගමය ලෙස නායකත්වය දෙනවා.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com



හම්බන්තොට ඉඩම් විකිණීමට එරෙහිව...



සයිටම් උපාධි කඩයට එරෙහිව...



ජනතාවගේ දේපළ රැකගැනීම වෙනුවෙන්...



බාහිර උපාධි අයිතිය වෙනුවෙන් මැදිහත්වී...



තරුණ පරපුර බලමුළු ගන්වා...



සෞදියේ විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් හමුවී...

# ආර්ථික මර්මස්ථාන විකිණීම වහාම නතර කළ යුතුයි

## ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා



මිලියන 10,800ක් වියදම් කොට සංවර්ධනය කළ නැගෙනහිර ජැටිය විකුණා දැමීමට රනිල්ගේ ආර්ථික සංවර්ධන කමිටුව තීරණයක් ගෙන තිබෙන බවට චෝදනා කළ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා, ආර්ථිකයේ සුරබිදෙනක් ලෙස පවතින මර්මස්ථාන විකිණීම වහාම නතර කළ යුතු බව ආණ්ඩුවට බලකර කළේය.

ඔහු මේ බව කියා සිටියේ පසුගිය 23වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. එහිදී දේශපාලන ව්‍යාපාරයක් ලෙස ජනතා විමුක්ති පෙරමුණ එම විකිණීමට එරෙහි බව ප්‍රකාශ කළ අනුර දිසානායක සහෝරයා හවුල් ආණ්ඩුවේ එම ප්‍රයත්නය නතර කළ යුතුව තිබෙන බවත් ඒ සඳහා වෘත්තීය සමිති ව්‍යාපාරයත් පොදු ජනතාවත් සහභාගි කරගෙන සටන් ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීමට ජ.වි.පෙ. කටයුතු කරන බවත් අවධාරණය කර සිටියේය.

වරාය වෘත්තීය සමිති මෙන්ම අනෙකුත් වෘත්තීය සමිති සමග ඒකාබද්ධව පෙබරවාරි 01වැනිදා පවත්වනු ලබන දැවැන්ත උද්ඝෝෂණ ව්‍යාපාරයක් මගින් එය ඇරඹීමට සැලසුම් කර ඇති බව පැවසූ ඔහු ජනතාව ලෙස සියලු දෙනාම එක්වී මෙම විනාශකාරී ප්‍රයත්නය නතර කළ යුතුව තිබෙන බැවින් ඒ වෙනුවෙන් පොදු ජනතාවට ආරාධනා කරන බව පැවසීය.

වැඩිදුරත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය. "ආණ්ඩුවේ අකාර්යක්ෂමතාව, වැරදි පිළිවෙත් තමයි වරායට මේ බර දරන්න වෙලා තිබෙන්නේ. 2015 වසරේ පමණක් හම්බන්තොට වරායේ පාඩුව මිලියන 37,000යි. එම වරාය සඳහා කිසිදු සංවර්ධන උපායමාර්ගයක් නැහැ. ආණ්ඩුව කොළඹ වරායේ රැජින ජැටිය අත්හැරියා. දකුණු ජැටිය චීනයට දුන්නා. නැගෙනහිර ජැටියේ පමණයි මෙහෙයුම් කටයුතු කරන්නේ. සියලු වරායවල වියදම දරන්නේ කොළඹ වරායේ ආදායමින්. ලංකාවට හිමි ආර්ථිකයේ වැදගත්ම පංගුව රනිල් වික්‍රමසිංහ සමාගම්වලට විකුණන්න හදනවා. චන්ද්‍රිකාගේ කාලයේ රැජින ජැටිය දුන්නේ ආණ්ඩුවට 49%, සමාගමට 51%ක් ලෙසයි. අයිතිය 49%ක් තබාගෙන ආණ්ඩුවට පරිපාලනයට මැදිහත් වෙන්න බැරිවුණා.

02 වැනි පිටුවට

# පල් වළේ සිටිනවාද නැතහොත් ගොඩ එනවාද යන තීරණය ජනතාව අතේ

## ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



ගෙවී ගිය අවුරුදු 68ක කාලය පුරා රට පාලනය කළ පංතිය රටත් ජනතාවත් දැවැන්ත අර්බුදයකට හෙළා තිබෙන්නේයැයිද සමස්ත රටම දුගඳ හමන වළකට ඇද දමා තිබෙන්නේයැයිද පැවසූ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, පල්වළේ තවදුරටත් සිටිනවාද නැතහොත් ගොඩ එන්නේද යන්න ජනතාව විසින් තීරණය කළ යුතුව තිබෙන බවත් ප්‍රකාශ කළේය.

ඔහු මේ අදහස් පළ කළේ පසුගිය 22වැනි දින මහරගම පැවති ජ.වි.පෙ. දිරිය පුරවැසි සමිති නියෝජිත සමුළුව අමතමිනි. එහිදී ටිල්වින් සහෝදරයා මෙසේද කීය.

"සිවිල් සමාජය යැයි කියන පිරිසක් ජනතාව තවදුරටත් මේ පල්වළේ තබා ගන්න එහෙන් මෙහෙන් විවිධ කටයුතු කරමින් ඉන්නවා. ජනතාව වළෙන් ගොඩගන්නවා වෙනුවට වළ ටිකක් පළල් කර ගනිමින් සුද්ද පවිත්‍රකර ගන්න කතා කරන බවක් පේනවා. වළෙන් ගොඩ ඒමට ජනතාව දරන උත්සාහය නවත්වන්නයි මේ අය උත්සාහ කරන්නේ. අපි කියන්නේ මේ රටේ ජනතාව තවදුරටත් දුක් විඳිමින් මේ පල්වළේ ඉන්න ඕන නැහැ කියලයි. එහෙම නම් අපට තිබෙන්නේ එකම විසඳුමයි. මේ රට ගොඩනැගීමට නව බලවේග පෙළගැස්වීමයි. රට වෙනස් කරමින් ගොඩනැගීමට අවශ්‍ය ශක්තිමත් බහුජන ව්‍යාපාරයක් ගොඩ නැගීමයි. එසේ නැති නම්

15 වැනි පිටුවට

# ආණ්ඩුවට වසර දෙකක් පිරෙන විට යහපාලනයේ නිරුවත පෙන්නුවා

## ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා

ආණ්ඩුවට වසර දෙකක් පිරෙන මොහොතේ හම්බන්තොට ජනතාවට පහරදීමෙන් ආණ්ඩුව යහපාලනයේ බොරුවත් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවට මර්දනය කිරීමෙන් යහපාලනයේ සැබෑ නිරුවතත් පෙන්වා දී ඇතැයි ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා පැවසීය.

ඔහු මෙසේ පැවසුවේ, හම්බන්තොට ජනතාවගේ ඉඩම් රජයට පවරා ගැනීමට එරෙහිව පෙර දිනයේ පැවති විරෝධතාවයට ආණ්ඩුව විසින් මැරයින් යොදා පහරදීම පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සඳහා පසුගිය 08වැනි දින පැලවත්ත ප්‍රධාන කාර්යාලයේදී කැඳවන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය.

මෙහිදී වැඩිදුරත් කරුණු දැක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේද පැවසීය.

"දේශපාලන වශයෙන් බංකොළොත් වෙලා ඉන්න පිරිසක් මේ සටන පාවා දෙන්න කටයුතු කරමින් ඉන්නවා. තමන්ගේ ඇත්ත ප්‍රශ්නය වෙනුවෙන් සටන් කරන ජනතාව තමන්ගේ දේශපාලන වුවමනාවන් වෙනුවෙන් යොදා ගන්න එම කණ්ඩායම කටයුතු කරනවා. එදා හම්බන්තොට ජනතාවගේ ඉඩම් බලහත්කාරයෙන් පවරා ගත්තු ඔවුන් ඒවා නැහැ කියන්න උත්සාහ කරමින් ඉන්නවා. ඔවුන් මැදිහත් වෙලා ජනතාවගේ සටන දියාරු කරන්න හදනවා. සැබෑ අරගලය යටපත් කරනවා. ආණ්ඩුව ඔවුන්ගේ ක්‍රියාමාර්ගත් මේ සටන මර්දනය කරන්න යොදා ගන්නවා. එම නිසා බංකොළොත් කණ්ඩායම්වලට මේ සටන දියාරු කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ."



මෙම මාධ්‍ය හමුවේදී දකුණු පළාත් සභා මන්ත්‍රී සිසිර වාහලතන්ත්‍රී සහෝදරයාද අදහස් පළ කළේය.

# ජයග්‍රාහී ආර්ථික ප්‍රතිපත්තියක් වෙනුවෙන් ජනතා බලයක් ගොඩනගනවා

## ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා

සැලසුම් සකස් කර රාජපක්ෂ පාලනය බිඳවට්ටීමට කටයුතු කළ ජ.වි.පෙ., ගොඩනැගෙන පාලනය ගැන විශ්වාසය නොතබන්නයි ජනතාවගෙන් ඉල්ලා සිටියේයැයි කියා සිටි ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා මේ වන විට නව පාලනයක් වෙනුවෙන් ජනතාව පෙළගැස්වීමේ සටනට ජ.වි.පෙ. අවතීර්ණ වී සිටින බවත් විනාශකාරී ආර්ථික ප්‍රතිපත්තිය පරාජයට පත්කොට ජයග්‍රාහී ආර්ථික ප්‍රතිපත්තියක් වෙනුවෙන් අපේ රට මෙහෙයවීම සඳහා ජනතා බලයක් ගොඩනගන බවත් අවධාරණය කළේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 05වැනි දින හම්බන්තොට පැවති උද්ඝෝෂණ රැලිය අමතමිනි. වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද කීය.

"දැන් ශ්‍රීල.නි.ප., එ.ජා.ප. නියෝජනය කරන පාලනයේ යුගය අවසන් වෙලා තිබෙනවා. ඕනෑම පාලනයක අවසානය පෙන්නුම් කරන්නේ ආර්ථික කඩාවැටීම්, මහා මංකොල්ල, මිනිස් සබඳතා කඩාවැටීම්, නීතියක් නැති රටක්, විනයක් නැති රටක්, පාලනයක් නැති රටක් බවට පත්වීමෙනුයි. මේ පෙන්නුම් කරන්නේ ඓතිහාසික වශයෙන් එක යුගයක නිමාව. එම නිසා මින් එහා ආර්ථිකයේ යහපත් ප්‍රතිසංස්කරණ, ජන ජීවිතය උසස් කිරීම, අධ්‍යාපනයේ යහපත් පරිවර්තනයන්, සෞඛ්‍ය සේවයේ යහපත් පරිවර්තනයන්, සමාජයේ යහපත් පරිවර්තනයක්, නීතියේ යහපත් පරිවර්තනයක් මේ සියල්ල පැවරී තිබෙන්නේ නව යුගයකට."

මෙම රැලියේදී අදහස් දැක්වූ ලාල්කාන්ත සහෝදරයා මෙසේ පැවසීය.

"රනිල්ටයි මෛත්‍රීටයි අපි කියමු හම්බන්තොට ජනතාව පක්ෂ බේදයෙන් තොරව කැත්ත උදල්ල අරගෙන අරලියගහ මන්දිරය වටලන්න ගෙන්න ගන්න එපා කියලා. ඊට කලින් හම්බන්තොට ඉඩම් පවරගන්නේ නැහැ කියලා කියන්න. මේකට එරෙහිව රටේ සමස්ත දේශප්‍රේමී ජනතාව පොදු ජන අරගලයක් ජාතික මට්ටමින් ගොඩනගන්න ඕනෑ. හම්බන්තොට ජනතාව ආරම්භයක් දීලා තිබෙනවා. ඒ වෙනුවෙන් ඔබ තමුනාන්සේලාට අපේ පක්ෂයේ ගෞරවය හිමි වෙනවා. මේකට කලාකරුවන් සම්බන්ධ කරගමු. විද්වතුන් සම්බන්ධ කරගමු. වෘත්තීය සමිති සම්බන්ධ කරගනිමු.

15 වැනි පිටුවට

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.